දළදා වරුණ

ශ්‍රී දළදා මාලිගාව මාසිකව නිකුත් කරන බෞද්ධ සඟරාව

■ ශ්‍රී බුද්ධ වර්ෂ 2557 නවම් මස කිවි දින

■ 2014 පෙබරවාරි මස 14 වැනි සිකුරාදා



■ දළදා මාලිගාවෙන් සොබාදේ පිරිනමන දනම පඬුරකි

■ විනිමිමි සඳහා නොවේ



තෙරුවන් සරණ යන්නේ කො හො ම ද ?

බුද්ධ, ධම්ම, සංඝ යන තෙරුවන් සරණ යාමෙන් ඔබට අත්වෙන සෙත, ශාන්තිය වචනයෙන් විස්තර කළ නොහැකි තරම් අනන්තයි, අප්‍රමාණයි. බුදුරජාණන් වහන්සේ කෙරෙහි, උන්වහන්සේ දේශනා කළ ශ්‍රී සද්ධර්මය කෙරෙහි හා සංඝරත්නය කෙරෙහිද ඔබ තුළ විශ්වාසයක් හා පිළිගැනීමක් ඇතිකර ගැනීමෙන් තමයි ඔබට ප්‍රසන්න සිතින් තෙරුවන් සරණ යා හැක්කේ. මේ නිසා අත්වෙන ආනිශංස අංගුත්තර නිකායේ වේලාම සූත්‍රයේ දක්වා තිබෙනවා. පැහැදුණ, පිරිසිදු සිතින් තෙරුවන් සරණ සහිත පංචශීලය ආරක්ෂා කිරීම මහත්ඵල මහානිශංස ගෙන දෙන බවයි බුද්ධ දේශනාවේ සඳහන් වෙන්නේ. ගිහියාට අනුදැන වදාළ ආර්යෂ්ඨාංගික මාර්ගයේ ගමන් කරන හැටි බුදුන් වහන්සේ පෙන්වා දී තිබෙනවා.

සීලය ආරක්ෂා කිරීමේ උතුම් සිතිවිල්ල හිතේ උපදින විටම ඔබ තුළ ශාන්තියක් ඇතිවෙනවා, හිතට ලොකු සැහැල්ලුවක් දැනෙනවා. එම සදහම් සිතුවිල්ල නුවණින් මෙනෙහි කරන කොට ඔබ තුළ යෝනිසෝ මනසිකාරය ඇතිවෙනවා. මේ නිසා ඉන්ද්‍රිය සංවරය ඇතිවෙනවා. එහි ප්‍රතිඵලයක් වශයෙන් සීල හා සමාධියද වැඩෙනවා. අවසානයේදී තමන්ටම දර්ශනය වෙන විඥ්ඥාණ ස්කන්ධයේ ප්‍රභාව දකිනවා. ලෝභ, දෝෂ, මෝහ කියන අකුසල ධර්මතා යටපත් වී, සිතෙහි අඳුර දුරුවී ආලෝකය දකිනවා. ඒ නිසයි බුදුන් දේශනා කළේ "මහණෙනි, බුදු ගුණ මෙනෙහි කරන විට සිතේ ලෝභ, දෝෂ, මෝහ නොවැඩෙන බව මෙනෙහි කරන්න" කියලා. එවිට කෙළෙස් හා පාපතාරී සිතුවිලි ඉවත්ව හිත ශාන්ත භාවයට පත්වෙනවා. එයයි පරම සත්‍යය.

ධර්ම ගවේෂී



"මේ ලෝකයේ කවර්දවත් වෛරයෝ වෛරයෙන් නොසන්සිඳෙත්, අවෛරයෙන්ම වෛරයෝ සංසිඳෙත්. මෙය පෙර සිට පවතින ස්වභාවකි."

බුදුන් දකින හැටි





බුදුරජාණන් වහන්සේ තරම් ශ්‍රේෂ්ඨ උත්තමයෙක් මේ ලෝකයේ පහළ වෙලා නැහැ. එය අපි අවිවාදයෙන් පිළිගත යුතුයි.

රාග, ද්වේෂ, මෝහ ප්‍රහීණ කරගත් උන්වහන්සේට අපි අරහං කියන්නේ ඒකාන්තයෙන්ම අරහත් ගුණයෙන් ආඪ්‍යය සම්පන්න නිසයි. ඒ වගේම උන්වහන්සේ සම්මා සම්බුද්ධයි. කෙලෙස් නැසූ උන්වහන්සේ වදාළ ශ්‍රී සද්ධර්මය අවබෝධයෙන් ලබාගත් දෙයක්. අපට සිතාගන්න බැහැ මේ ගැඹුරු ධර්මය කෙලෙස උන්වහන්සේ අවබෝධ කරගත්තාද කියලා. ඒ තරමටම එය විශ්මිතයි, ගැඹුරුයි, පවිත්‍රයි. මහා කරුණාවෙන් උන්වහන්සේ ලෝකය දිහා බැලුවා. විජ්ජාචරණ කියන දෙයෙන් උන්වහන්සේ අංග සම්පූර්ණයි. රාග, ද්වේෂ, මෝහ ප්‍රහීණය වුණා කියන්නේ සුගත.

බුදුරජාණන් වහන්සේ ලෝකවාසී ජනතාව සදහම් මාර්ගයට ගන්නා අරමුණ ඇතිවයි ධර්මය දේශනා කළේ. ඒ සඳහා එක් එක් ක්‍රම උපායන් අනුගමනය කළා. සෘද්ධි, ආදේසනා, අනුශාසනා ආදී වශයෙන් විවිධ ප්‍රාතිහාර්යය කළා. එසේ දක්වූ වීර්යයටයි අනුත්තර පුරුසදම්ම සාරථී කියන්නේ. හැම අයෙකුටම දේශනා කළේ එකම ධර්මයයි. ඒ තමා චතුරාර්ය සත්‍යය. ඒ නිසා අපි උන්වහන්සේව "සත්ථා දේව මනුස්සානං" යනුවෙන් හඳුන්වනවා. තමන් අවබෝධ කරගත් ධර්මය කිසිම ගුරුමුෂ්ටියකින් තොරව සකල ලෝක වාසීන්ට මහා කරුණාබර සිතින් යුතුව තේරුම් කරලා දුන්නා. බුද්ධෝ යනුවෙන් කියන්නේ අන්න ඒ කරුණුයි.

බලන්න පින්වත්නි, මේ වගේ ඥාන සම්භාරයක්, සීලයක්, සමාධියක්, ප්‍රඥාවක්, විමුක්ති මාර්ගයක්, දර්ශනයක් ආදී සියලු අසිරිමත් ගුණ සමුදායක් සහිත අප තිලෝගුරු බුදුපියාණන් වහන්සේ තරම් උතුම් භාග්‍යවන්තයෙක් මේ මිහිපිට පහළ වූවාද? නැහැ.

"සබ්බෙ තේ සග්ග පරායතා" යනුවෙන් උන්වහන්සේ දේශනා කළේ තමා කෙරෙහි ශ්‍රද්ධා මාත්‍රයක් යම් කෙනෙකුට තිබේ නම් එබඳු සියලු දෙනාම ස්වර්ග සම්පත්තිය ලබනවා කියා. බව. අප සියලු දෙනාටම තියෙන සරණ තමයි උන්වහන්සේ පෙන්වා දුන් මාර්ගයෙහි යෑම. එවිට ඔබට නිසැකයෙන්ම බුදුන් වහන්සේ දකින්නට පිළිවන්.

නිව්ටන් ගුණසේකර

"යමකු බැරිවීමකින් පවක් කළත් නැවත නැවත එය නොකළ යුතුය. පවට ආශා නොකළ යුතුය. පව් කිරීම නිසැකවම දුකට හේතු වේ."



කොහේ ගියත් නිරයට නම් යන්න එපා

නිරයේ හැටි මෙහෙමයි





පෙනෙන ලෝකයට වඩා නොපෙනෙන ලෝකය කෙබඳුද යන්න යමෙකු ඔබෙන් ප්‍රශ්නයක් ඇසුවහොත්, එයට සරලව පිළිතුරු දිය නොහැකි බව සැබෑවකි. කුසල්, අකුසල්, පිං-පව් නොහඳුනන පුද්ගලයන් බොහෝ විට පසුවනුයේ මෙම විශ්වය තුළ අපායක්, දිව්‍ය ලෝකයක් ඇද්දැයි යන සැකයෙනි.

බෞද්ධ ධර්මයට අනුව විශ්වයෙහි පැවැත්ම පිළිබඳව සවිස්තරාත්මකව විස්තර කෙරේ.

එකම ඉරකින්, එකම හඳකින් ආලෝකවත් වන ලෝක ධාතු පද්ධතිය හඳුන්වනුයේ සක්වල ලෙසය. ලෝක ධාතු සක්වළෙහි අප අද ජීවත් වනුයේ මහුල් සක්වලෙහිය. විශ්වයේ අතිවිශාල සක්වලයන් ප්‍රමාණයක් තිබුණද, බුදුවරුන් පහළ වීමේ භාග්‍යය උදාවනුයේද මහුල් සක්වලෙහි බව කියැවේ.

මහුල් සක්වල ආරම්භ වනුයේ අවීචි මහා නරකයෙනි. අවසන් වනුයේ නේව සංඥා නා සංඥා නමැති බ්‍රහ්ම ලෝකවලිනි.

අප අද කතාබහ කරනුයේ අවීචි මහා නරකය ආරම්භ වන නිරය පිළිබඳවය.

අකුසලයෙහි නියැලුණහොත්, පවෙහි ඇලුණහොත් අපායේ වැටෙන බව අපි කොයි කවුරුත් කුඩා කල පටන් දන්නා කරුණකි. "අපාය" යන්නෙහි සරල තේරුම වනුයේ "සැපයෙන් තොරය" යන්නය.

අපායන් හතරක් පිළිබඳව බුදුදහමේදී ඉගැන්වේ.

1. තිරිසන් යෝනිය, 2. අසුර නිකාය, 3. ප්‍රේත නිකාය, 4. නිරය එම සතරය.

අවීචි මහා නරකයේ සිට, ලෝක ධාතුව තුළ නිරයන් අටක් හමුවේ.

1. සංජීව, 2. කාල සූත්‍රය, 3. සංඝාතය, 4. රෞරවය, 5. මහා රෞරවය, 6. තාපය, 7. ප්‍රතාපය, 8. අවීචිය.

බුදු දහමේ පෙන්වා දෙන ආකාරයට අවීචි මහා නරකයෙහි නිරයන් අටට අමතරව, ඒ අටටම ඔසුපත් නොහොත් ශාකමය නිරයන් 128ක් හමුවන අතර, අවීචි මහා නරකයේදී හමුවන සියලු නිරයන් සංඛ්‍යාව 136කි.

මෙලොවෙන් තුරන් වූ වහාම නිරයේ ඉපදීමට ඇතිනම් ඒ මොහොතේම සිදුකර ඇති අකුසල් අනුව සංජීවයේ සිට අවීචිය දක්වා ඇති නිරයන්හි, කුමන හෝ තැනක උත්පත්තිය ලබකි.

මනුෂ්‍ය ලෝකයේ අයෙකු මියගොස් නිරයේ ඉපදුණ සැණින්ම යමපල්ලන්, මියැදුණ පුද්ගලයා ඇදගෙන ගොස් බිම දිගාකර, වෑ, පොරව ආදී ආයුධයන්ගෙන් අකුසල කළ පුද්ගලයා කැලි කැලිවලට කපනු ලැබේ. තියුණු ආයුධයන්ගෙන් කැපීමට ලක්වන පුද්ගලයා මහා වේදනාවන්ගෙන් කෑමොර දී, වේදනාව දරාගත නොහැකිව, නැවත එකැනම මියැදෙන බවත්, තවත් මොහොතකින් ආයුධ මගින් කැපී පොළොව මතට පතිත වූ ශරීර අවයව එකතු වී, නැවත උපත ලබන බවත්, නිරයෙහි ස්වභාවය පිළිබඳ ඉගැන්වීමේදී කියවේ. සිදුකර ඇති අකුසලය හේතුවෙන් නැවත නැවත මෙලෙස

"පවි කරන්නා මෙලොවත් ශෝක කරයි. පරලොවත් ශෝක කරයි. දෙලොවම ශෝක කරයි. තේ තමාගේ කිලිටි කර්මය දැක ශෝක කරයි. වෙසෙසින් පෙළෙයි."

ආයුෂවලින් යුතුයේ කොටස් වේදනාවෙන් වෙන් වීමෙන්, කැවත එකතුවෙන් වසර කෙරෙහි යම්කෙනෙක් යන අයත් එක දිසාට සිදුවේ.

සාමාන්‍ය වචනාර්ථයේදී ඔබත් අපා ඇති "නරකම් වියලා මැරිලාවත් යන්නේ නැතු කියලා" කැවැත්මේ කර්මය නිසා බිලවත් පුද්ගලයකු ඉක්මනින් මියැදෙන්නේ නැත. එහෙත් විදීමක් ඒකක් වීම, නැවත නැවත ලෙඩීම කර්මයෙහි ස්වභාවයය.

මේ ලෝක සියලුම සත්ත්වයින් කෙරෙහි මෙන් කොටා ඊර්ෂ්‍යා, තැවුම් ඒ මෙන්නොවෙදීම උපත ලබන්නා නිරය හඳුන්නුයේ සංජීව නිරය ලෙසය. සතා මරාගෙන එවායෙන්ගෙන් සැදුම් උක් හතරක් කොටුවක ආහාරයට සංජීවමය නිරය සැදී තිබේ.

ලෝභ, දෝෂ, මෝහ අකුසල් සිත්වලින් සිවිහන පුද්ගලයන් සේම සොරකම් කරන, ප්‍රාණඝාතයෙහි නිදැලෙන්නන්, නරයින් නිසර කියන්නන්, කෝන්ති ස්වභාවයෙන් සිටින්නන් සඳහා, රණ්ඩු දමර කරගන්නන් සේම පුංචි පුංචි සිදුවීම් හේතු කොටගෙන කළු ගැනීමෙ පෙළඹීම ආදී අකුසලයන්හි මනුෂ්‍ය ලෝකයේදී නිරත වූවන් මරණින් පසු සංජීව නිරයෙහි ඉපදේ.

මනුෂ්‍ය වසර අවුරුදු අතුලක්ෂයක් සංජීව නිරයෙහි එක දිනයක් වන සේක. එවැනි දින එකතුව තැබෙන සංජීවයේ වසර අවුරුදු දශලක්ෂයක කාලයක් අකුසල් වෙනුවෙන් විපාක විඳිති.

කාල සුත්‍ර නිරය

බොරු කේලාම් කියා සම්ඵියෙන් සිටිනා පුද්ගලයන් භේදකිරීන්න කරවීම, මව පියා මෙල්ලී නිවරා ඇත් කරවීමේ අකුසලය කරගත් පුද්ගලයන් ගැබින් මතු උපන ලබනුයේ කාල සුත්‍ර නිරයෙහි බව බුදු දහමේදී ඉගැන්වේ. මෙම නිරයෙහි එක් දිනයක් අපගේ වසරවලින් බැලූ කල අවුරුදු තුන්කෝටි හැටපස් ලක්ෂයකි. එවැනි අවුරුදු දෙදහසක කාලයක් ඉහත අකුසලයන්හි නිරත වූවන් කාල සුත්‍ර නිරයෙහි උපදී දුක්විඳිනා බව බුදුහමේදී පෙන්වා දේ.

කාල සුත්‍ර නම් පාට යන්නය. සුත්‍ර යනු තුල යනුමෙනි. කළු පාට තුල යන අරමුණෙන් මෙම නිරයට නම් සැදී තිබේ. කළු පාට තුලක් අරගෙන නිරයේ පැවැත්ම පත්වියන්හේ නිරයෙහි ඉඳි පසු, කොටසින් කොටස තැලීමට ලක් කරනා බැවින් මෙම නම ලබාදෙන් තිබේ.

සංඝාත නිරය

ඇතුන්ගෙන්, ගව්වයන්ගෙන්, ගවයින්ගෙන් අසේකවිට වද වේදනා දී වැට ගන්නා පිරිස් සංඝාතය නිරයෙහි උපත්තිය ලබති. මෙහිදී විපාක වශයෙන් විශාල හල් තවන්න ගිරිය මතට පතිතවී, ඇටකටු තොඩි වී, විසහය වී යන බව කියැවේ.

එවැනි අකුසල කර්මයෙන්ම නිරත වූවන් වසර 4000ක් දුක් විඳිය යුතු අතර, මනුෂ්‍ය වූහර දහතරකෙනිම් හතළිස් ලක්ෂයක් එහි එක් දිනක් බින බවද බුදදහමේ ඉගැන්වේ.

රෞරවය නිරය

අතගේ වසර හතළිහක් කෝටි හැට ලක්ෂයක් රෞරවය නිරයේ එක් දිනකි. එවැනි වසර 4000ක් එම නිරයෙහි දුක්විඳිය යුතු බව කියැවේ.

බොහෝම කාමීන් සුළල් උපයන්නන් සේම, වාහන සිරුම් මිනුම් භාවිතයෙන් ලාභ උපයන්නන්, වංචනිකව ගරීරයට අහිතකර දා, ආහාරපාන සඳහා මොළවත්තන්ද, නියමිත මිලට වඩා වැඩි මිලට භාණ්ඩ අලෙවි කිරීමේ ආදී වරදවලට මරණින් මතු උපදිනුයේ රෞරවය නමැති නරකයේය.

මහා රෞරවය නිරය

මෙහෙර වීනාව අත්යෙහි දෑ සොරා ගැනීමත්, වතුවල ඇති කොස්, දෙල්, අල, බඩල, කෙසෙල් ආදිය සොරකම් කළ පුද්ගලයන් නිරත වන නිරයය. මහා ගිනි ජ්වාලවලින් සැදුම් ලත් මෙම නිරයෙහි අල, බඩල තැම්බීමට ගිනි දල්වා, තම්බා ගන්නා සේ, අකුසලයෙහි නිරත වූවන් ලෙඳිය හැලිවලට දමා මහා රෞරවය නමැති මහා ගිනිඳුල් මැද්දේ තැම්බී තැම්බී ජීවත් වෙති. මවුන් මියැදීමකින් තොරව මෙලෙස ගිනි ජ්වලා මත නැවි නැවි ජීවත් වෙති, මනුෂ්‍ය ලෝකයේ දෙමිය හත්කෝටි හතළිස් එක් ලක්ෂයක් අවුරුදු මෙහි එක් දිනකි. එවැනි වසර 8000ක් කළ අකුසලට මහා රෞරවය නිරයෙහි අල, බඩල තැම්බෙනවා මෙන් ලෙඳිය හැලිවල නැවි නැවි ජීවත් වෙයි.

තාපන නිරය

සිංහ, වඩු යනුවෙන් දෙයක් නැතු කියා කියා, නිකාරුණේ බහවල සිට, ප්‍රාණඝාත අකුසලයන්හි නිරත වූ, සතර අතිගේ නිරත වූවන් ලෝභ, දෝෂ, මෝහ ආදී තරුණුවල නිරත වූවන් මෙහි විපාක විඳිති.

රෙට් පාලනයන්, පාලිතයන්, ජනද, දෙවිවියන්, බිමයන්, මේනයන් සතර අතියට පැමිණියහොත් මෙලොවදීත්, පරලොවදීත් සිදුවනුයේ අකුසල්ය, එවැනි සතර අතියට පැමිණි පුද්ගලයන් තාපය නමැති නිරයෙහි ඉපදේ.

මනුෂ වර්ෂ කෝටි තසළිස උකයි නැට ලක්ෂයක්, එක් දිනයකි. එවැනි දින්වලින් සැළිස් ලක් වසර 1000ක් එහි දුක් විඳිති.

ප්‍රතාපය නිරය

මනුෂ ලෝකයේ සිට යොදුන් දහලක්ෂ දහස්දහසක් ඔබින් පිහිටා ඇති නිරය මනුෂ ලෝකයේ අන්තරි කල්ප ගණනක් එහි එක් දිනයක් ලෙස සකිවුහන් වේ. එය මහා විශාල කාල පරාසයකි. බුදුර, ධර්මය, සංඝ යන තෙරුවන් කෙරෙහි දෙස් නැති නිගහ කරන්නන්, බුදු දහම විනාස කිරීමට උත්පරවැටීරි යෙදීම ආදී අකුසලයෙහි නිරත වූවන් අපදෙනුයේ ප්‍රතාපය නමැති නිරයේදීය.

නිරය

නිරයට වැටුණු පුද්ගලයා මහා වේදනාවල් මැද, සතර දිසාවෙන් යම් වන ගිනි ජ්වාලාවන් ඔවුන් වරිය සිදුවසී. සේ පිළිවසී, ලේ කැවා සියල්ල පිළිවසී හොස් ඇටකටු සියල්ලම ගිනි ඇවිලුණු පසු එම ගිනිදැල්වලින් බේරීමට උපාය බවය. එලෙස දිවිමේදී උතුරු පැත්තෙනුත්, දකුණු දිගාවෙනුත්, බටහිර සහ නැගෙනහිර දිගාවෙනුත් ගිනි ජ්වලා පැමිණ පිළිවසී. පිළිවසී දුක් විඳින අතර නිරයට වැටීමට අකුසලයෙහි නිසුසු වූ පුද්ගලයා බුද්ධාන්තර දෙක තුනක කාලයක් අතේනවිට දුක් විඳිති. ආනන්තරිය පාප කර්මයෙහි නිරත වූවන් සහ නියත මිතුා දෘෂ්ටිකයන් මෙලෙස දැඩි විපාක දෙන බව කියැවේ.

බුදුන්ගේ ලේ සෙලවීම, අප රහතන් වහන්සේලා සාතනය කිරීම, මව පියා මරණයට පත්කිරීම සහ සංඝ භේදය කිරීම ආනන්තරීය පාපකර්මයන් වේ. මෙම අකුසලයන්හි යෙදුණු පිරිස් මරණින් මතු දෙවැනි තැන්න බවයක් උපදිනුයේ අවීචි මහා නරයෙහිය. එහි උපදින සත්වයින් බුද්ධාන්තරයක කාලයක් එහි දුක් විඳින බව පොතපතෙහි සඳහන්ය. බුද්ධාන්තරයක් යනු වසර කියයක්, දෙසියයක් නොවෙයි. දහස් ලක්ෂයක් යැයි ගණනය කළ හොතෙකි. මහා විශාල කාල පරාසයකි. බුද්ධාන්තරයක් කල් අවීචියේ දුක් විඳින සේ කියැවේ.



"දුනුන්ගේ බිම් බාම් කනත් අතුන් කළු නොකළ දෙන් නොවෙයිය යුතුය. නමාගේ කළු නොකළ රදු වෙසිය යුතුය."



කේන්ද්‍රයට බිය වෙන්න එපා

අපල දුරුවෙන්න මේ පිළිවෙත් කරන්න

ඔබේ කේන්ද්‍රයට හිමි අපලය කුමක් වුවත් පහත සඳහන් පිළිවෙත් ඔබ නිති සිදුකරයි නම් අනගි සුබඵල වීදිමට ඔබට අවකාශ සැලසෙනු නොඅනුමානය. තිසරණ සරණ තරම් අන් සරණක් ලොවේ නැත.



1. නිති තෙරුවන් සරණ හා පන්සිල් සුරකින්න.
2. මව්පියන්ට තමන්ගේ අතින්ම ආහාරපාන සකසා උවටැන් කිරීම.
3. රෝගී පුද්ගලයන්ට කෑම, බීම හා වෛද්‍යාධාර සපයා දීම.
4. ගැබිනි මව්වරුන්ට කෑම, බීම ලබාදීම.
5. මරණයට කැපවූ සතුන්ට අභය දානය ලබාදීම.
6. කිරි අම්මා දාන ලබාදීම.
7. පන්සලට, දුප්පතුන්ට ආහාර හා ද්‍රව්‍යමය අවශ්‍යතා දන් දීම.
8. රෝගීන්ට ඇප උපස්ථාන කිරීම.
9. සතුන්ට කෑම, බීම කරුණාවෙන් ලබාදීම.
10. වැඩිහිටි නිවාස, ළමා නිවාසවලට ඔබගේ උපන් දින සැමරුම වෙනුවෙන් හෝ ආහාර, ඇඳුම්, බෙත් හේත් ආදිය ලබාදීම.
11. නිවාස නැති අයට, ස්වයං රැකියා කරන අයට මූල්‍යමය හා ද්‍රව්‍යමය ආධාර



ඉහත පිළිවෙත් කරන අතරතුර පහත දෑ දිනපතා බුදුන් වැඳ ඉතා භක්තියෙන් සිදුකිරීම තුළින් ඔබේ අපලවලට යහපල ලබාගෙන අපලයන් අවම කරගත හැකිය.

1. පොහෝ දිනවල සිල් සමාදන් වීම.
2. ධර්ම දානය පින්කම් සිදුකිරීම.
3. හැකි පරිදි ඔබ ඇසුරු කරන අයට සිල් සමාදන් වීමට යොමු කරවීම හා ධර්මශ්‍රවණයට යොමු කිරීම.
4. ධර්මශ්‍රවණය කිරීම. එම ධර්මය මෙනෙහි කර ජීවිතයට එකතු කරගැනීම.
5. මෛත්‍රී භාවනාව දිනපතා සිදුකිරීම.
6. පිරිත් සජ්ඣායනය කිරීම හා පිරිත් ශ්‍රවණය කිරීම.

බුදුන් වැඳීමෙන් අනතුරුව තුන් සූත්‍රය, සූර්ය පිරිත, චන්ද පිරිත, බන්ද පිරිත, ගිරිමානන්ද පිරිත, බොජ්ජංග පිරිත, දස දිසා පිරිත සජ්ඣායනය කිරීම ග්‍රහ අපලවලට ඉතා ප්‍රත්‍යක්ෂ බව කිව හැකිය.

ඉහත වත්පිළිවෙත් කැපවීමෙන් ඉටු කිරීම තුළින් ඔබටද නිති පන්සිල් සුරැකීම ඔහු ග්‍රහයන්ගේ අනිවූ ඵලයන් අවම කරගත හැකිය.

ග්‍රහයන්ට ඔබේ ජීවිතය භාර නොදී ඔබම ඔවුන්ව මෙහෙයවීමට ධර්මයේ රැකවරණය ලබාගන්න.

දැහැමි එල්. ජනාදනී - රඹුක්කන



"මෝඩයා මට දුරුවෝ ඇත. මට ධනය ඇත කියා සිතමින් උද්දම වෙයි. තමාට තමනුත් නැති කල කුමන දුරුවෝද? කුමන ධනයද?"



පින කියන්නේ කුමක්ද?

ලෝකයේ පින්-පව් කියලා දෙකක් තියෙනවා. මෙහිදී මා ඔබට පහද දෙන්න යන්නේ 'පින්' කියන්නේ කුමක්ද කියලයි. සමහරු කියන්ට පුළුවන් අපට පිනුත් එපා, පවිත් එපා කියලා. මේ කියමන අවබෝධයෙන් යුතුව කරන ප්‍රකාශයක් නොවෙයි. අපිට පව් නම් එපා. ඒත් අපිට පින් ඕන. සිත පහදවාගෙන මලක් පිනක්. ඒ පින අපේ එලොව මෙලොව ජීවිතයටම අවශ්‍යයි.

පුණ්‍ය කර්මයේ ඇති විටිනාකම බුදුරජාණන් වහන්සේ ඉතා පැහැදිලිව දේශනා කරලා තියෙනවා. සමහරු හිතන්නේ පින ලැබෙන්නේ දන් දීමෙන් විතරයි කියලා. එයිනුත් පිනක් ලැබෙනවා තමයි. ඒත් පින කියන්නේ දන් දීම විතරක්ම නොවෙයි. ඔබ මෛත්‍රී භාවනාව වඩනවයි කියලා හිතන්න. මෛත්‍රීය කියන්නේ යහපත් චේතනාවක්නේ. හැමෝටම මෛත්‍රීය වඩන්න පුළුවන් නම් එය කොයිතරම් උතුම් ක්‍රියාවක්ද? එය පුදුමාකාර පිනක්.

අපි නිවන් අවබෝධ කළ දට නම් පින තිබුණත් එකයි නැතත් එකයි. ඇයි ඒ? තණ්හාව නැති කරලා නිවන් අවබෝධ කරගෙන තිබෙන නිසා. හේතුව නැති කරපු නිසා ඵලයක් නැතිවෙනවා. උතුම් වූ නිර්වාණ සම්පත්ද අවබෝධ කරන්නා තුරු පින කියන දේ අපේ ජීවිතවලට අවශ්‍යයි. එයින් ලැබෙන ශාන්තිය නා පිළිසරණ අපමණයි. ඒ නිසා පින කියන ධර්මතාවය අප තිතර නිතර සිහිපත් කළ යුතු එකක්. පවෙන් වැලකිලා යහපත් සිතුවිලි ඇතිකර ගැනීම තමයි පිනේ මූලික පදනම. අපි කරන පින පරලොව යහකොට අපිට පිහිට වෙනවා. ඒ නිසා අපි කුසල් කළ යුතුයි. කුසල් නැත්නම් පින කියන්නේ තමන්ට අතිශයින්ම මහෝපකාරී වන උතුම් දෙයක්. පංචශීලයෙහි පිහිටා ජීවත්වීමට විශාල පුණ්‍ය කර්මයක්.

පූජ්‍ය යටමලගල සුමනසාර හිමි
ලෝක බෞද්ධ මධ්‍යස්ථානය, කැලණිය.



"ඔක් කොට වදුරෙක්ගෙ වේදැ යමක් විනාශය කැඳුවා සිව් දුනුමෙක් ලක්ෂාව ගසමින් විදින්නට සිදුවේද, එබදු පාප කර්ම නොකිරීම යහපත්ය."

උච්ඡඟ ජාතකයෙන්

හෙළිවන පරිදි

පුරුෂයන් පමණක් නොව ස්ත්‍රීහුද නුවණැත්තෝ වෙති

සර දුකඹිති නිවා, දසඅරුන් පරදවා, මෙනිවන් මග දෙසූ, තිලෝවට තිලක වූ අපගේ සම්මා සම්බුදුරජාණන්වහන්සේ අපගේ බුදුරජාණන්වහන්සේ දෙවිරම දවහෙරෙහි වැඩවාසය කරන සමයෙහි එක්තරා ජනපදයක වාසය කළ ස්ත්‍රියක් අරභයා මෙම ජාතක කරාව දේශනා කොට වදාළ සේක.

එක්තරා කාලයක කොසොල් රටෙහි වාසය කළා වූ ගොවීන් තුන් දෙනෙක් වනයක සමීපයෙහි කුඹුරෙක සීසාමින් සිටියහ. එම අවස්ථාවෙහි ඒ වනයෙහි වාසය කරන හොරු රංචුවක් සොරකමින් මංකොල්ලකමින් සැඟවී ගියහ. මෙම සොරුන් ගැන සොයමින් ඔවුන් පසුපස්සේ ගිය රාජපුරුෂයෝ කැලයෙහි සැඟවුණු සොරුන් නොදැක, යට කී ගොවීන් තුන්දෙනා කුඹුරෙහි සීසාමින් සිටි තැනට පැමිණ "තොපි වනයෙහි ජීවත් වෙමින්, කොල්ලකමින් දැන් සීසාන්නේදැ" විමසූහ. අනතුරුව "ගම කොල්ල කෑ සොරුන් මොවුන්" යැයි සිතා, ඒ තිදෙනා අල්ලාගෙන කොසොල් රජතුමා ඉදිරියට ගෙනගොස් පාවාදුන්හ.

එම අවස්ථාවෙහි එක් ස්ත්‍රියක් "මට වස්තුයක් දෙවැ"යි කියමින් නැවත නැවතත් මාලිගාව අවටෙහි ඇවිදින්ට පටන් ගත්තාය. එය දුටු රජපුරුෂයෝ ඒ ස්ත්‍රියගේ කැලඹීම අසා "මැයට වස්තුයක් දෙන්නැ"යි නියම කළේය. රජ අණ අනුව රාජපුරුෂයෝ වස්තුයක් රැගෙන ඒ ස්ත්‍රිය සමීපයට ගියහ. ඒ ස්ත්‍රිය වස්තුය දැක "මම මෙබඳු වස්තුයක් නොඉල්ලුවෙමි, මට අවශ්‍ය වන්නේ පුරුෂ වස්තුයයි"යැයි කීවාය. එය ඇසූ රාජපුරුෂයෝ "ස්වාමිනි, මෙම ස්ත්‍රිය වස්තුයක් වුවමනා බව නොපවසන්නීය, පුරුෂ වස්තුයක් වුවමනා බව පවසන්නීය" යැයි රජතුමාට දැන්වූහ. එවිට රජතුමා ඒ ස්ත්‍රිය තමන් සමීපයට කැඳවා "නෝ පුරුෂ වස්තුයක් උවමනා යැයි යාඥා කළේදැ"යි විමසූහ, "එසේය ස්වාමිනි, ස්ත්‍රියකට නම් තමන්ගේ වල්ලභ පුරුෂයා වස්තුයක් හා සමාන වේ. පුරුෂයෙක් නැති විට දහසක් මිල වටිනා වස්තුයක් වුවත් ඇඳ සිටින ස්ත්‍රිය නග්න ස්ත්‍රියක් හා සමානය." රජපුරුෂයෝ සියලු බස් අසා සතුටු වූ සිත් ඇතිව, "මේ තිදෙනා ඔබට කවුරුන් වන්නේදැ"යි විමසීය. "ස්වාමීනි, මේ තිදෙනාගෙන් එක්කෙනෙක් මගේ ස්වාමිපුරුෂයාය. එක්කෙනෙක් මගේ මලුතුබෝය. එක්කෙනෙක් මගේ පුතණුවෙරැය." රජපුරුෂයෝ එසේ අසා "මම කිට සතුටු වන්නෙමි. මේ තුන්දෙනාගෙන් එක්නෙනෙක් නිදහස් කිරීමට මම කැමැත්තෙමි. එසේනම් කවුරු නිදහස් කරන්නට මඟ කියන්නේදැ"යි විමසුවේය. "ස්වාමීනි, මම ඒ දිසාවේ සිටින්නෙම් නම් ස්වාමිපුරුෂයෙකු ලබාගැනීම සඳ නැකිය. එවිට පුතණුං කෙනෙකුත් ද උපදින්නේය. එහෙත් මගේ දෙමව්පියන් මල බැවින් මට මලණුවන් නිදහස් කොට දෙනු මැනවැ"යි කීවාය. රජු සතුටුව නිදහස් කොට ස්ත්‍රියට පාවා දුන්නේය.

> "උච්ඡඟ ජාතක කතාවෙන් හෙළි කෙරෙන පරිදි පුරුෂයන් පමණක් නොව ස්ත්‍රීන් ද නුවණැත්තියන් බව ප්‍රකට වේ. ඔවුහු දුකට පත් තම දෙමව්පියන්, සොහොයුරන්, සැමියන්, දූ දරුවන් කෙරෙහි මහත් බැඳීමකින් කටයුතු කරන්නෝ වෙති."

මේ අයුරින් ස්ත්‍රියක් නිසා තුන්දෙනෙක්ම දුකින් නිදහස් විය. මේ කාරණය දම්සභාමණ්ඩපයේ සිටි භික්ෂූන්වහන්සේලා අතුරෙහි කතාබහට ලක්විය. එවිට බුදුරජාණන්වහන්සේ උමඟා මණ්ඩපයට වැඩම



කොට බුද්ධාසනයේ වැඩසිට, මා ඒමට පෙර කිනම් කතාවක් කරමින් සිටියේදැයි විමසුසේක. ඒ ස්ත්‍රිය ගැන විස්තර කී විට, මෙම ස්ත්‍රිය නිසා මේ තුන්දෙනා ගැළවුණේ දැන්මතු නොවෙයි. පෙර භවයෙහි ද එය එසේම සිදුවිය යැයි පෙර අත්භවයෙහි කථාව දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජකෙනෙකුන් වාසය කරන කාලයෙහි ඉහත කථාවෙහි විස්තර කළාක් මෙන්ම මේ තිදෙනා සී සාමින් සිටියහ. එදාත් තවුරුන් නිදහස් කිරීමට කැමතිදැයි ස්ත්‍රියගෙන් විමසූ විට, තුන්දෙනාම දෙන්නට පිළිවන්දැයි විමසුවාය. එසේ තුන්දෙනාම දෙන්නට නොපිළිවන් බව කී විට, එසේනම් මට මගේ මළනුවන් ලබාදෙන්නැයි කීවාය. රජතුමා එවිට ඔබ පුත්‍රයා හෝ වල්ලභපුරුෂයා නොගෙන මළනුවන් ගන්නේ ඇයිදැයි විචාළේය. එවිට ස්ත්‍රිය ස්වාමිපුරුෂයන් හා පුතුන් සුලභය. මව්පියන් මියගිය විට මළනුවන් ලබාගැනීමට නොහැකිය. එබැවින් පළමුව මළනුවන් ලබාගැනීමට කැමැතියැයි පැවසූ විට, මෙම ස්ත්‍රිය සැබැවක්ම පවසයි. දෙමාපියන් නැති ස්ත්‍රියකට මළනුවන් ලබාගැනීම දුෂ්කරය. එබැවින් මේ ස්ත්‍රිය කිවූ දේ ගැන පැහැදී තුන්දෙනාම සිරගෙයින් නිදහස් කොට පාවාදුන්හ. ඒ ස්ත්‍රිය සතුටින් තිදෙනාම මුදවාගෙන තමන් වසන ස්ථානයට ගියාය.

මේ අයුරින් මේ ස්ත්‍රිය දැන් පමණක් නොවෙයි පෙර ආත්මයෙහිත් මොවුන් තුන්දෙනා ගැළවූවා යැයි ගෙනහැර දක්වා වදාළසේක. අතීතයේ ඒ සතර දෙනා මේ සතර දෙනාමය. කොසොල් රජ්ජුරුවෝ නම් සම්‍යක් සම්බුද්ධ වූ මම්ම වේ යැයි පහදා දුන්සේක.

උච්ඡඞ්ග ජාතක කතාවෙන් හෙළි කෙරෙන පරිදි පුරුෂයන් පමණක් නොව ස්ත්‍රීන් ද නුවණැත්තියන් බව ප්‍රකට වේ. ඔවුහු දුකට පත් තම දෙමව්පියන්, සොහොයුරන්, සැමියන්, දූ දරුවන් කෙරෙහි මහත් බැඳීමකින් කටයුතු කරන්නෝ වෙති. බොහෝ ස්ත්‍රීහු තම දිවි දෙවෙනි කොට ඔවුහු සුරකිති. ඒ අනුසාරයෙන් මෙම ජාතක කතාවෙන් හෙළිවන පරිදි සෑම සියලු අවස්ථාවන්හිම දහමෙහි යෙදී නුවණින් යුතුව කටයුතු කිරීමට වගබලා ගත යුත්තෝ වෙමු.

කේ. මියසතුමුර

"තමාට විතිට තමාමය. වෙන කවරෙක් තමාට විතිට වේද? තමා මනාව දැමුණු කල දුර්ලභ වූ විතිටක් ලබන්නේය."



වඩා උතුම් දානය කුමක් ද?

බුදුරජාණන් වහන්සේගේ සිරි මව වූ මහා ප්‍රජාපති ගෝතමී භික්ෂුණිය බුදුරදුන්ට උසස් වස්ත්‍ර දානයක් දීමට බලවත් කැමැත්තෙන් එටිනා වස්ත්‍ර දෙකක් තමාගේ අභින්න වියා එය බුදුරජාණන් වහන්සේට පූජා කළාය. එය ප්‍රතිග්‍රහණය කළ බුදුරජාණන් වහන්සේ "මේ වස්ත්‍රය ශ්‍රාවක සංඝයාට (සංඝයා ගෝතමී දේවි) දෙව" යි වදාළ සේක. තුන්වර දක්වා එම වස්ත්‍රය ශ්‍රාවක ප්‍රතිග්‍රහණය කළ උතුමන්ගේ "එය සංඝයාට දෙව. සංඝයාටද දුන් කල්හි මටද පූජා ලද්දේ වන්නෙමි" යි වදාළ සේක. එවා මින් සිදුවන්නේ බුදුරජාණන් වහන්සේට යමක් පූජා කළ විටද? නැතහොත් සංඝයාට පූජා කළ විටද? මෙය කවදුරටත් විස්තර කළ යුතු කරුණකි.

දක්ෂිණා විභංග අවවාදය මෙසේ අවර දක්වයි. බුදුරදුන්ට උත්තම දක්ෂිණාවක් නෙහෙක් ලොව කිසිම තැනක නැත්තාහ. වස්ත්‍ර යුගළය තුන්වන වරටත් ප්‍රතිග්‍රහණය කොට සංඝයාට දෙව යි වදාළේ පශ්චිම ජනයාට (අනාගතයෙහි උපදින්නා වූ ජනයාට) සංඝයා කෙරෙහි ගෞරව ඉපදීම පිණිසය. බුදුරජාණන් වහන්සේට මෙබඳු සිතක් පහළ විය හැකිය, "මම කලක් ජීවත් නොවෙමි. මගේ ශාසනය සංඝයා කෙරෙහි පිහිටන්නේය. මෙසේ ඇති කල්හි සංඝ හෙමි දක්ෂිණාවයයි පශ්චිම ජනයා සංඝයා කෙරෙහි ගෞරව උපදවා සිවිපසයෙන් සංග්‍රහ කරන්නාහ. සංඝයා සිව් පසයෙන් අඩුවක් නැති කල්හි ක්ලාන්ත නොවී ධර්මය ඉගෙන ශාසනය පවුරාදු පන්දහසක් පැවතීමට එය උපකාර වන්නේය."

සකසතු දහෙහි බුදු සුබුම උහතෝ සංඝයා නම් එක් රහෙන භික්ෂු සංඝයාද, අනිත් පසෙහි භික්ෂුණී සංඝයාද, මැද සර්වඥයන් වහන්සේද වඩා හිඳුවා දෙන දානයයි. බුදුරජාණන් වහන්සේ පිරිනිවි කල්හි වුවද මේ පළමුවැනි බුද්ධ පූජාව උභතෝ සංඝයා වශයෙහි දෙන දානය දිය හැකි ක්‍රමය අදුවාව මෙසේ විස්තර කරයි. භික්ෂු භික්ෂුණී උභතෝ සංඝයා දෙපසට වඩා හිඳුවා මැද බුදු සහිත ප්‍රතිමාවක් හෝ කරඬුවක් උස් අසුනක තබා සියලු පුද පූජා පැවැත්වීමෙන් එය පිදු කළ හැකිය. එකී බුද්ධ පූජාව පසුව වනාවත්හි යෙදෙන භික්ෂුවට දිය හැකිය.

අනාගතයෙහි ඉමණය තමාගේ පරිණාම ඇති බවි අාකල්පවලින් පුන් (කෙනෙකු වර්ණ තුලක් බෙල්ලෙහි හෝ අතෙහි බැඳගෙන්) කසාව කණ්ඨ නම් දක්ෂිලයාට සංඝයා වෙතුවෙන් දෙන දානයෙන්ද අප්‍රමාණ අනුසස් ලැබෙන බව වදළ බුදුරජාණන් වහන්සේ මෙසේද ප්‍රකාශ කොට වදළ සේක. "ආනන්දය, පුද්ගලික දානයට වඩා හැම අභින්න හා පතු දානය මහත්ඵල ඇත්තේ යැයි ප්‍රකාශ කරමි."

යමෙක් "සංඝයාක දක්ෂිණාවක් දෙන්නෙමි" යි ආහාරපාන පිළියෙල කොට විහාරයට ගොස් "ස්වාමීනි, සංඝයා වෙතුවෙන් එක් භික්ෂුවක් දෙනු මැනව" යි ආරාධනා කළ කල්හි භික්ෂූන් එක් සාමණේර නමක් දුනහොත් "මට ලැබුණේ සාමණේර නමක්" යයි සිතුවොත් එම දානය සාංඝික දානයක් නොවෙයි. මහා ස්ථවිර භික්ෂුවක් ලැබුණේ යයි සිතුවොත් එයද සාංඝික දානයක් නොවෙයි. යමෙක් සාමණේර නමක් හෝ උපසම්පද භික්ෂුවක් හෝ බාලයෙක් හෝ පණ්ඩිතයෙක් හෝ විශේෂයක් නොසිතා සංඝයාට දෙමි යි චේතනාවෙන් දානය දේද ඒ දානය සාංඝික දානයක් වෙයි.

දක්ෂිණෙ විභා සූත්‍රයෙහි බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද දන විසුද්ධි සතරක් වෙයි. එහි මෙසේ විස්තර වෙයි.

"ආනන්දය, දන විසුද්ධි සතරක් වේයි. ඒ සතර නම් දායකයා කෙරෙන් පිරිසිදු වේද, ප්‍රතිග්‍රාහකයා කෙරෙන් පිරිසිදු නොවේද එබඳු දානයක් ඇත්තේ ය. ප්‍රතිග්‍රාහකයා කෙරෙන් පිරිසිදු වේද, දායකයා කෙරෙන් පිරිසිදු නොවේද එබඳු දානයක් ඇත්තේය. දායකයා කෙරෙන් පිරිසිදු නොවේද, ප්‍රතිග්‍රාහකයා කෙරෙන් පිරිසිදු නොවේද එබඳු දානයක් ඇත්තේය. දායකයා කෙරෙන් පිරිසිදු වේද, ප්‍රතිග්‍රාහකයා කෙරෙන් පිරිසිදු වේද එබඳු දානයක් ඇත්තේය.

"ආනන්දය, කෙසේ නම් දානය ප්‍රතිග්‍රාහකයාගෙන් පිරිසිදු වේද, දායකයාගෙන් පිරිසිදු නොවේද? ආනන්දය, මේ ශාසනයෙහි දායකයා දුස්සීල වේද, එකල්හි දානය දායකයා කෙරෙන් පිරිසිදු වේ. ආනන්දය, කෙසේ නම් දානය ප්‍රතිග්‍රාහකයාගෙන් පිරිසිදු වේද, දායකයාගෙන් පිරිසිදු නොවේද? ආනන්දය, මේ ශාසනයෙහි දායකයා දුස්සීල වේද, ප්‍රතිග්‍රාහකයා සිල්වත් වේද එකල්හි දානය ප්‍රතිග්‍රාහකයා කෙරෙන් පිරිසිදු වේ.

ආනන්දය, කෙසේ නම් දායකයා කෙරෙන් පිරිසිදු නොවේද, ප්‍රතිග්‍රාහකයා කෙරෙන් පිරිසිදු නොවේද, මේ ශාසනයෙහි දායකයෝ දුස්සීල වේද, ප්‍රතිග්‍රාහකයෝ දුස්සීල වේද එකල්හි දානය දායකයා කෙරෙන්ද, ප්‍රතිග්‍රාහකයා කෙරෙන්ද පිරිසිදු නොවේ.

ආනන්දය, කෙසේ නම් දානය දායකයා කෙරෙනුත්, ප්‍රතිග්‍රාහකයා කෙරෙනුත් පිරිසිදු වේද, ආනන්දය මේ ශාසනයෙහි දායකයෝ, ප්‍රතිග්‍රාහකයෝ සිල්වන්ද එකී දානය දායකයා කෙරෙනුත්, ප්‍රතිග්‍රාහකයා කෙරෙනුත් පිරිසිදු වේ.

භාග්‍යවතුන් වහන්සේ මේ දන විසුද්ධි සතර විස්තර කොට මෙසේද වදළ සේක.

සිල්වත් වූ යමෙක් දහැමින් ලද දෙය කර්මඵල අදහමින් දුස්සීලයන්ට දෙයිද ඒ දානය දායකයා නිසා පිරිසිදු වේ.

දුස්සීල වූ අයෙක් අධර්මයෙන් ලද දෙය කර්මඵල අදහා නොගෙන සිල්වතුන්ට දේද ඒ දානය ප්‍රතිග්‍රාහකයා නිසා පිරිසිදු වේ.

දුස්සීලයෙන් අධර්මයෙන් ලද දෙය කර්මඵල සඳහා නොගෙන දුස්සීලයන්ට දේද ඒ දානය දෙපසින්ම පිරිසිදු නොවේ.

යම් සිල්වතෙක් දහැමෙන් ලද දෙය කර්මඵල අදහාගෙන සිල්වතුන්ට දේද ඒ දානය මහත් වූ විපාක ඇත්තේය.

පූජ්‍ය නිවන්දම ශ්‍රී ධර්මසේරි හිමි

අවුකන බුදු පිළිමය හා රිස් වෙහෙර පිළිමය



ලාවැව කිට්ටුව පිහිටි අවුකන බුදුපිළිමය හා කැකිරාවෙත් ඔබ්බෙහි පිහිටි රස්වෙහෙර බුදුපිළිමය සමකාලීනව නිර්මාණය වූ බුදුපිළිම දෙකකි. පිහිටි ගලේ තෙළා ඇති මේ යෝධ හිටි බුදුපිළිම පිහිටි ගලේම තෙළා බුදුරු ඉදිරියට වීදනා පායි. බුද්ධ රූප විටුපසින් ස්වභාවික ලේ තලාවට පැහී පවතී. වඩාත් කලාත්මක පරිසමාප්ත බුදුපිළිමය අවුකනයි. රස්වෙහෙර අවුකන සමඟ සසඳන විට මටසිලිටි බව අඩුය. මිමින් මේ බුදු පිළිම දෙක අතර පරාන්තය සැතපුම් පහළොවකට නිට්ටුය. ඒ වට රවුම් මාර්ග මස්සේ යා යුතු බැවිනි. එනෙත් අහස් දුර සැතපුම් පහකට අඩුය. රස්වෙහෙර පිළිමය ගැන රසවත් ජනකතාවක් පවසී. ගලේවෙල මහා විද්‍යාලයේ උපාධිධාරියකුව අප හිටියදී අප මිතු ජයසිලක මහතා සමඟ අසිරු, පටු රස්වෙහෙර පාරේ ගිනියම් අව්වේ පාපැදියකින් රස්වෙහෙරට යාමට හැකි විය. ගිනියම් අව්ව ඇඟපත පුළුස්සයි. පාපැදිය පැදවූ ජයසිලක විඩාවෙන් හෙම්බත්ව ඇත. ඉදිරියේ හිඳගෙන සිය. මගේ දෙපා හිරි වැටී ඇත.

තේ කෝප්පයක් බීමට අසළ පිහිටි කුඩා කඩයකට අපි ගොඩ වැදුණෙමු. එහි සිටි මහල්ලෙකු මේ කතාවට මුල පිරුවේය.

"මේ හිටිටුව ගමෙ එක පවුලක හිටියා බුදුපිළිම ගලෙන් තෙළන ශිල්පී පරම්පරාවක්. බොහෝම උස්සතට රුවට, ඔපයට හැඩ වැඩ කරලා බුදු පිළිම තෙළන්නට ඒ පවුලට පරම්පරාවෙන් උපන් හපන්කම් තිබුණා. සියා මහළුයි. දන් ළඟහාතක මිසක් ඇත වැඩට ගියේ නෑ. ඔය කාලේ තමා අවුකන පිළිමෙයි, රස්වෙහෙර පිළිමෙයි තෙළන්න ඉදිරිපත් වෙන්න තියලා ශිල්පීන්ට දන්වලා රජ්ජුරුවෝ රටේ අණ බෙර ගැහැව්වේ. ගමේ අණබෙර ගහන කොට අර මහළු සියා ගිහින් අණ බෙරය නැවැත්තුවා. පියත් එක්ක පුත්තු දෙන්නත් එනැත්ට සියා. සියා අණ බෙරය නැවැත්තුවා. මගේ පුත්තු දෙන්නා ඔය බුදු පිළිම දෙක නෙළන්න හපන්නු කියලා දන්නවා. අණබෙරකාරයා එක්ක සියයි, පුත්තු දෙන්නයි රජ්ජාසලට ගියා. රජ්ජුරුවෝ සන්තෝෂ වෙලා එකම දවසේ පිළිම දෙකේ වැඩ නැකතට ආරම්භ කරන්නට කිව්වා. හොඳ සුබ වේලාවක් බලලා. පුත්තු දෙන්නා පිළිමවල වැඩ ආරම්භ කළා. ඒ අයගේ පවුලට රජවාසලෙන් කෑම බීම, යැපුම් අනාර ද්‍රව්‍ය සාරෙන් සාරේ ලැබුණා. අවුරුදු තුනක් දෙන්නා වෙන වෙනම පිළිම දෙක නෙරුවා. අයියා තමා අවුකන පිළිමේ නෙළුවේ. රස්වෙහෙර පිළිමය තෙළුවේ මල්ලී. හැම පසළොස්වක පෙරියකටම දෙන්නා ගෙදර ඇවිත් පිළිමවල කරපු වැඩ කොටස් විස්තර කරනවා. මහොම පිළිම දෙක නෙළුවේ නරඹනට වාගේ.

මහල්ලා බුලත් විට සපමින් පිනියමින් පුපුරු ගෙන අවිවේ මිදුලට බැස කඩේ ඉදිරිපිට තිබූ රුස්ස ගහ යට තබා ඇති බංකුවේ වාඩි වී අප දෙස බලයි.

"ඉතිං මොකද වුණේ?"

"අවුරුදු තුනක් ගත වෙලා ගියා. අයියා නෙළපු අවුකන පිළිමේ වැඩ අවරයි. හරියටම පසළොස්වක පෝයද වෙනකොට පිළිමේ වැඩ සුළුවෙනින් අවර කරන්න පුළුවන්කම ලැබෙනවා. රස්වෙහෙර පිළිමය නෙළුවේ බාල සහෝදරයා. ඒකේ ඔපමට්ටම් කරන්ට තව වැඩ ඉතුරු වුණා. තවත් කාලයක් ගියාමයි රස්වෙහෙරේ පිළිමේ වැඩ අවර වෙන්නේ.

එස්.කේ. ජයවර්ධන



"මේ නැතැත්තා ඊට පෙර විහාරයෙන් විඳිය හැකිද විඳපු නැතැත්තා ආගමෙහින් නැත. බුදුදහ දැනුන් නැත. ධර්මය කුලවංශයෙන් නැත. විමුදු ගිහි පැවැදිකම් බලාවෙ කොතැනින් දැනිලා නැත.



දන් දීමේ ආනිශංස අනන්තයි



දේශකයාණෝ : සසාමොවාලි
විහාරාධිපති මිල්ලවිල මොවිතාර
පාර්ශ්වයේ
පූජ්‍ය නිඛ්ඛුවාවේ ශ්‍රී සිද්ධාර්ථ
වේඩිංකර් සේවාවයාර් නායක
ස්වාමීන්වහන්සේ විසින්වේ

"සතිවධිකානිසංසා හි අනන්තා දානසම්භවා
පකාසිතුනි හි වීනෙයාානං වසෙන පරිදීපිතං

දානං බලු සහාවෙන සඟහමානුසහොගදං
පරිණම වසෙනෙව හොති මොක්ඛුපනිසසයං"

දානය දීමෙන් මෙලොව වශයෙන් ලබාගත හැකි ආනිශංස අපමණයි. ඖන, කය, වචනාදියෙන් හික්මවන ලද චෙතනෙයා ජනයන්ට අඩුවක් නොමැතිව ආයුෂය, වර්ණ වර්ණය, සැපය, බලය, ප්‍රඥාව යන ආනිශංස සතක් ලැබේ.

දන් දීම වනාහි ස්වභාවයෙන්ම ස්වර්ග මනුෂ්‍ය සම්පත් සලසා දෙන්නේය. මෙක්ෂය නම් වූ නිවන ද අත්වේ.

- (සද්ධම්මොපායනය)

පින්වතනි,

අද නවම් පෙ පුර පසළොස්වක පොහෝ දිනයයි. ශාසන ඉතිහාසයෙහි අතිදාර් වූ පුරුෂ ගෙනික පදවි ප්‍රදානය ලෙස සැලකෙන සැපියුන් - මුගලන් මහරහතන්වහන්සේ දෙනම වෙත, අසවැටි තනතුරු ප්‍රදානය කිරීම සිදුවූයේ අද්‍යවන් පුන් පොහෝ දිනයකයි. අප සම්බුසම්බුරජාණන්වහන්සේ වේළුවනාරාමයෙහි සිටුවහන් පිරිස මධ්‍යයේ, වැඩසිටිමින් ධර්ම දේශනා කරන අතරතුර, උපතිස්ස නා කෙළිත මිතුරන් දෙදෙනා දවින් එතු දැක, මහණෙනි, අප ඉදිරියෙන් යන්නා වූ පව්ව්‍රාජකයන් දෙදෙනා මාගේ අනුශ්‍රාවකයෝ බවට පත්වෙති'යි වදාරා, සෙරෙමක් පිණිස සවණක් රස් විහිදුවූ සේක. එහි යහපතෝ

"යමෙක් මුලදී පමා වුවත් පසුව නොපමා වේද ඔහු වලාකුළින් නිකුත් වූ සඳක් මෙන් මේ ලෝකය බබුළුවයි"



දෙදෙනා දිව්‍යභවයට පැමිණ බුදුන් දැක, ශ්‍රීපාද ශුලයෙහි හැඳවැරි අඩි මඤ්ඤාහේ සම්බයෙහි පැවිදි උපසම්පදාව ලබාගැනීමට කැමැත්තෙමු යි දැන්වූහ. එවිට සැරියුත් තුමන්ලන් ශ්‍රීවාදීන්ද්‍රයන් දෙදෙනා පුළුල දෙසිය පහතක් පමණ පිරිවර පවිබ්‍රාජකයන් සා සිටුවූ ඇතිව මහණ උපසම්පදාව ලැබූහ. එසේ මහණ වී පත් දවසක් ගිය කල්හි බුදුරජාණන්වහන්සේ රහත් වූ අතර, පසළොස් දිවසකින් සැරියුත් තෙරුන්වහන්සේ රහත්වූහ. මෙවන් උතුම් කවිම් කැදි පොහෝ දිනයකදීම වෙළුවනාරාමයේදී පූරණ සංඝසන්නිපාතය පවත්වා සැරියුත් – මුගලන් මහතෙරුන්වහන්සේලා දෙනම පිළිමවෙලින් දකුණත් හා වමත් අතවිවන් පෙදින් පත්කරනු ලැබූ සේක. මෙය වනාහි සම්බුද්ධ ශාසනයේ ප්‍රථම ශ්‍රාවකික යුවළ පිහිටුම්මයි. මෙසේ අගපට තනතුරු පිරිනැමීමෙන් අනතුරුව ශාසනයේ දෙරිය පැවැත්ම සඳහා ඔබාදහම්මොහොය හම් සළමූ දිනය නිසිමලාව දේශනා කොට වදාළ සේක. මෙම ප්‍රථම සංඝසන්නිපාතයෙන් (රාජ්‍රවම්මන්) පසු බුදුරජාණන්වහන්සේ, එතුමාල වෛතාය වෙත පැමිණ ඒ වෙන් සෙමෙක් සහ වූ පසු තථාගතයන්වහන්සේ ආයුසංස්කාරය හැර පිරිනිවන් පාමි යි නිරණය කොට වදාළේ ද නවමී පුන් පොහෝ දිනයකදීමය. මේ අයුරින් ලා සලකන විට බෞද්ධ සාදානුවකුන්ට ඉතා වැදගත් වන මෙම උතුම් පුන් පොහෝ දිනයේ දී බුද්ධ නිකායෙහි, විමානවත්ථුපාළියෙහි දැක්වෙන නිඝණ්ඨයිකා විමානවස්තු දේවතාව බුල්කොට දානානිසංස පිළිබඳ ධර්ම දේශනාවක් සිදුකිරීම මැනැවැයි සලකමි.

නිඝණ්ඨයිකා විමානවස්තුවේ විස්තර වන අයුරු දන් දීමෙන් ගෙන්වල මහානිසංස ලද හැකි බව දක්නා ලැබේ. දානය යනු දීමයි. දීම බුදුදහ තුළඟ නා සැලැකැවූ පරෙදෙරි කරගෙන සිදුවිය යුතුය. ආහාරාදී යම් වස්තුවක් අලෝභාදී චේතනාවෙන් දෙනු ලබයි ද එය තෘෂ්ණාව ප්‍රහීණ කිරීමට මුල්වන බැවින් උතුම් දානයක් කොට සැලකිය හැකිය. දන් දීමෙන් දෙන්නාට ද එය ලබන්නාට ද යහ පත ලැබෙන්නේය. දන් දෙන්නා කිසිවිට වස්තුවෙන් හීන නොවේ. සද්ධර්මෝපායනයෙහි දැන්වෙන අයුරු දන් දීමෙන් බහුට යළි යළින් වාඩුව ලැබේ. දන් දීමෙන් මෙම ජන්මයෙහිම ලැබිය හැකි අනුසස් අප්‍රමාණයි. දන් දෙන්නා පරසතුරන්ට ද මොහෝ විශ්වාස කටයුතු වේ. තමන් ඇසුරු කරන්නන්ට ද යසස් වල ඇති කරන්නේය. තමාගේ කුලයට අලංකාරයක් වැනිය. ඇසුරු කරන්නන්ට සතුට ඇති කරන්නේමය. අනාගතයේ පිළිසරණ වේ. සියලු සත්වයන්ගේම ප්‍රිතිය වඩවයි. හැමෝලෙහිම බුදු, පසේබුදු ආදී සත්ජනයන් සමඟ සුවසේ ලබන්ට හිසිය හැකිය. ශ්‍රේෂ්ඨ යැයි සම්මත වේ. දිගටම ඇත්තවුන් වීසිනුත්, සතුරන් වීසිනුත් නොවැධිය හැකිවේයි. තමන්ව හැමති දේ දෙන්නේ යැයි ලෝ වැසියන් සතුටට පත්වෙයි. හිස අතින් යම් කෙනකට හිය ද ඉහත කළකාර පුරුද්ද අනුව සතර ප්‍රකාරය සුලභව ලැබේ.

අප සම්මාසම්බුදුරජාණන්වහන්සේ කැවැත්තුවර දෙවිරම් වෙහෙරෙහි වැඩවසන සමයෙහි අලුයම් කාලයෙහි මහාකරුණා සමාපත්තියෙන් නැඟී ලුහුලොව බලන සේලෙහි උත්තරමධුරා නම් නුවර, ආයුකාලය ගෙවී, අපායෙහි ඉපදීමට අයුත්ම හැඳින්න වූ එක්තරා ස්ත්‍රියක් දැක, ඇය අපායෙන් මුදවා සුගතියෙහි උපදවනු කැමැතිව කරුණා වෛත්තියන් යුතුව ගුදෙකලාව උත්තරමධුරාවට වැඩම කළ බුදුරජාණන්වහන්සේ පෙරවරුවෙහි සතුවර විඳුම්සා වැඩිසේක. එවිට ඒ ස්ත්‍රිය ආගාව පිස එකත්පසෙක සිටා පැන්පොවට ගෙස් දිය හා පැන්කළයක් ගෙන නිවසට යන විට අතරමග දී බුදුන් දැක, තිගෙස් ඒ! ස්ත්‍රීනි, තථාගතයන්ගේ පම් සිසි හෝජනයක් ලබන දද දැයි විමසුවාය. මතු ලබමිහයි බුදුන් වදාළ කල්හි ආහාර තොලෙන් බව දැන පැන් කළය බිම තබා බුදුරජාණන්වහන්සේට නමස්කාර කොට සිටියාමිනි, ඇබවහන්සේට ශිෂ්ඨාචාරය දෙමි, මාගේ දානය ඉවසා වදාළ මැනැවැයි ආරාධනා කළාය. එසල බුදුරජාණන්වහන්සේ එය ඉවසා වදාළ සේක.

ඒ ස්ත්‍රිය තම නිවසට බුදුරජාණන්වහන්සේ වැඩම කරනා අතරතුර, එහා මෙහා ගොස පිරිසිදු කොට ආසනයක් පනවා බුදුන් වඩිනා පෙරමග බල බලා සිටියාය. බුදුරජාණන්වහන්සේ වැඩම කොට ඇය පිළියෙල කළ ආසනයේ වැඩහුන් සේක. ඉක්බිති ඒ උපාසිකාව පිළියෙල කොට පුදා කළ භෝජනය වැළඳූ සේක. දන් වළඳා දානානුමෝදනා බණ වදාරා ආපසු විහාරයට වැඩම කළ සේක. ඒ ස්ත්‍රිය දන් දීමට ලැබීමෙන් අපරිමිත වූ ප්‍රීතියට පැමිණ බුදුරජාණන්වහන්සේ දුර නොවෙනී යන තෙක් බුද්ධාලම්බන ප්‍රීතියෙන් බල බලා වැඳ වැඳ සිටියාය. ඉන් අනතුරුව ඒ උපාසිකාව කිප දිනකින් මරණයට පත්වූවාය. එසේ කාලක්‍රියා කොට සවිතිසා දෙවලොවෙහි උතුම් වූ රත් විමානයක උපන්නාය. ඇයට පරිවාර ස්ත්‍රීහු ද දහසක් පමණ වූහ.

එසැණින් බුදුරජාණන්වහන්සේ දෙව රාජිකාවෙහි වැඩම කළ අවස්ථාවෙහි මෙම දිව්‍යාංගනාව දැක එම්බා දේවතා වූ, ඔබ මෙසේ තාරකාවක් සේ දසදිග ඒකාලෝක කොට බබලන්නිය. මේ දිවය සම්පත් ලැබීමට කළ කුසල කර්මය කිමෙක්දැයි විචාල සේක. එවිට ඒ දිව්‍යාංගනාව මෙසේ ප්‍රකාශ කළාය.

"අහං මනුස්සලොකූ මනුස්සභූතා
පුරිමාය ජාතියා මනුස්සලෝකෙ
අද්දසං විරජං බුද්ධං විප්පසන්න මනාවිලං
නස්ස ආදාසනං නික්ඛං සසන්නා සෙහි පාණිභි

තෙන මේ තාදිසෝ වණ්ණෝ
තෙන මේ ඉධ මිජ්ඣති
උප්පජ්ජන්තිපි මේ භොගා
යෙකෙචි මනසෝ පියා"

යනුවෙන් "මම පෙර අත්ම භවයේ දී මිනිස් ලොව මිනිසුන් අතර මිනිස් දුවක් වීමි. එකල මම රාගාදී කෙලෙස් සහ වූ, නොඇඹුලුතු සිත් ඇති බුදුන් දිටිමි. මම ඒ බුදුරජාණන්වහන්සේට පහන් සිතින් සියතින්ම දන් දුනිමි. ඒ පිනෙන් මගේ සිරුරේ පැහැය මෙබඳු විය. ඒ පිනෙන් මෙහි මගේ සම්පත්තිය පහළ වේ. සිත වඩන්නා වූ යමිකිසි සම්පත්තියක් වේ ද ඒ සම්පත්තිය මට මෙහි පහළ වේ" යැයි කිවිය. ඉක්බිති බුදුන් වහන්සේ මිනිස් ලොවට වැඩම කොට බුදුරජාණන්වහන්සේට මෙම කතාපුවත දැන්වූ සේක. එහිදී බුදුරජාණන්වහන්සේ නිඝණ්ඨයිකා විමානවස්තුව බුල්කොට ධර්ම දේශනාවක් සිදුකළ සේක.

විමානවත්ථුපාළියේ එන මෙවැනි කතාපුවත් බොහොමයකින් දන්දීමේ කුසල කර්මයන්හි ගෙදීමෙන් ලැබෙන අනන්ත වූ ආනිසංසයන් පිළිබඳව මැනවින් විස්තර වේ. එම කතාපුවත් දැන උගතුන අපි ද දන්දීමේ දුසතුසලයන්හි යෙදී නිවන් මග සාදාගැනීමට උත්සුක වීමට අදිටන් කරගනිමු.

තෙරුවන් සරණයි.



මෛත්‍රිය වඩන හැටි

මෛත්‍රිය යනු මිතුරු බවයි. ධර්මයෙහි මෙය 'විජ්ජතීති මෙත්තා', 'සිනිය්හතීති අත්ථෝ', යම් ධර්මයක් නිමිති කරගෙන මිතුරු බවක් ඇතිවේද, ස්නේහයක් ඇතිවේද එය මෛත්‍රිය යැයි හඳුන්වනු ලැබේ. මෙහිදී ද්වේශයට විරුද්ධව ක්‍රියා කරන ස්වභාවයක් ඇති වේ.

මෛත්‍රිය වඩන පුද්ගලයෙක් එක්වරම සියලු සත්වයන් අරමුණු කරගෙන මෛත්‍රිය නොවැඩිය යුතුය. එයට හේතුව එකවර සියලු සත්වයන් අරමුණු කිරීමේදී ඒ ඒ සත්ව කොට්ඨාස අරමුණු කරගෙන, සිත වැඩිය නොහැකි වීමයි. එම නිසා මෛත්‍රී භාවනා කිරීමේදී යෝගාවචරයා දේශනා කර ඇති අනුපිළිවෙළටම එය කළ යුතුය.

මෛත්‍රිය පැතිරවීමේදී තමන්ට අප්‍රිය පුද්ගලයින්, බොහෝ ප්‍රිය පුද්ගලයින්, වෛරී පුද්ගලයින්, ලිංග විස භාගයන් (පිරිමියාට කාන්තාවත්, කාන්තාවට පිරිමියාත්), මියගිය තැනැත්තාත් යන පුද්ගලයින් අරමුණු නොකළ යුතුය. ඒ වෙනුවට තමන් ගරු කරන තැනැත්තෙක්ම අරමුණු කළ යුතුය.

එහිදී ප්‍රථමයෙන්ම තමන්ටත්, අනතුරුව එසේ තමන් ගරු කරන පුද්ගලයන්ටත් මෛත්‍රී කළ යුතුය. මෛත්‍රී කිරීමෙන් ලැබෙන ආනිශංස සාක්ෂාත් කිරීම් වශයෙන් ප්‍රථමයෙන් තමන්ට මෛත්‍රී කළ යුතුය. එහිදී, තමන්ට මෛත්‍රී වඩන ආකාරය මෙසේය.

මම වෛර නැත්තෙක් වෙම්වා
තරහා නැත්තෙක් වෙම්වා
නපුරු අදහස් නැත්තෙක් වෙම්වා
දුක් විපත් නැත්තෙක් වෙම්වා
සුවපත් වූ ආත්ම පරිහරණය කරන්නෙක් වෙම්වා,

යනුවෙන් තමාට මෛත්‍රී කළ යුතුය.

තමන්ගේ සිතෙහි ද්වේශ සිතිවිලි, යම් පමණකට හෝ යටපත් වනතෙක් තමන්ටම මෛත්‍රී කළ යුතුය.

ඉතා ප්‍රිය පුද්ගලයකුට මෛත්‍රී වඩන්නට යාමෙන් ඔහුට ඇති ප්‍රිය බව නිසා සිත පීඩාවට පත්වෙයි. ඔහුට දුකක් සිදුවුවහොත් සිත තදින් දුකට පත්වේ. අප්‍රිය හා වෛරී පුද්ගලයන් ගැන සිතන්නට යාමෙන්ද භාවනාව තුළ දිගු කලක් පුරුදු පුහුණු නොකළ සිතකට වහ වහා ක්‍රෝධය උපදී.

විරුද්ධ ලිංගිකයන්ට මෛත්‍රී කරන්නට යෑමෙන් ආධුනික අවස්ථාවන්හිදී ස්ත්‍රියට පුරුෂයා කෙරෙහිත්, පුරුෂයාට ස්ත්‍රිය කෙරෙහිත් රාගය උපදී. මරණයට පත්වූ තැනැත්තන් අරමුණු කරන්නට යෑමෙන් 'අර්පණා' සමාධිය ලැබිය නොහැකිය. (ධ්‍යානයට කලින් ලැබෙන සමාධිමය මට්ටම අර්පණා නම් වේ.)

එමනිසා තමන් ගරු කරන ගුරුවරයෙක් හෝ ගුරුවරියක් වැනි තැනැත්තෙක් මෙහිදී අරමුණු කළ යුතුය. ප්‍රථමයෙන්ම ඉහත දක්වන ලද ආකාරයට තමන්ට මෛත්‍රිය පැතිරවිය යුතුය. අනතුරුව ප්‍රධාන අන්ත තුනක් ඔස්සේ ඒ ඒ සත්වයන්ට මෛත්‍රී සිත පැතිර විය හැකිය.

1. **ඕදිසෝ එරණතාවය:** සත්ව පුද්ගල සීමා සහිතව මෛත්‍රී වැඩීමයි. හීන, මධ්‍යස්ථ, උත්කෘෂ්ඨ, මිත්‍ර වෛරී ආදී වශයෙන් මෛත්‍රිය පැතිර වීමයි.

2. **අනෝදිසෝ එරණතාවය:** සීමා රහිතව මෙත් වැඩීමයි. මෙහිදී සත්ව පුද්ගල භේදයක් නැතිව පොදුවේ සියලු සත්වයෝ අරමුණු කරයි.

3. **දිසා එරණතාවය:** මෙහිදී ප්‍රධාන දිසා 10ක් ඔස්සේ සියලු සත්වයන්ට මෛත්‍රිය වඩයි.



"වෛර සහිතව ජීවත් වන මිනිසුන් අතුරෙහි වෛර රහිතව ජීවත්වන්නයෙන්ම සුවසේ ජීවත් වන්න. වෛරී මිනිසුන් මැද අවෛරීව ජීවත් වන්න."

මිදිමෝ එරණතාවයට අනුව මෛත්‍රිය වැඩීම

මම වෛර නැත්තෙක් වෙමිවා
දරහ නැත්තෙක් වෙමිවා
නපුරු අදහස් නැත්තෙක් වෙමිවා
දුක් විපත් නැත්තෙක් වෙමිවා
සුවපත් වූ ආත්ම පරිහරණය කරන්නෙක් වෙමිවා

මෙසේ තමන්ට මෛත්‍රී කරන පුද්ගලයා සත් ආකාරයකින් යුතු මිදිමෝ එරණතාවට අනුව මෛත්‍රී කළ යුතුය. එනම්,

1. සියලු ස්ත්‍රීහු වෛර නැත්තෝ වෙත්වා, දරහ නැත්තෝ වෙත්වා, නපුරු අදහස් නැත්තෝ වෙත්වා, දුක් විපත් නැත්තෝ වෙත්වා, සුවපත් වූ ආත්ම පරිහරණය කරන්නෝ වෙත්වා,

2. සියලු පුරුෂයෝ වෛර නැත්තෝ වෙත්වා, දරහ නැත්තෝ වෙත්වා, නපුරු අදහස් නැත්තෝ වෙත්වා, දුක් විපත් නැත්තෝ වෙත්වා, සුවපත් වූ ආත්ම පරිහරණය කරන්නෝ වෙත්වා,

3. සියලු ආර්යයෝ වෛර නැත්තෝ වෙත්වා, දරහ නැත්තෝ වෙත්වා, නපුරු අදහස් නැත්තෝ වෙත්වා, දුක් විපත් නැත්තෝ වෙත්වා, සුවපත් වූ ආත්ම පරිහරණය කරන්නෝ වෙත්වා.

4. සියලු අනාර්යයෝ වෛර නැත්තෝ වෙත්වා, දරහ නැත්තෝ වෙත්වා, නපුරු අදහස් නැත්තෝ වෙත්වා, දුක් විපත් නැත්තෝ වෙත්වා, සුවපත් වූ ආත්ම පරිහරණය කරන්නෝ වෙත්වා.

5. සියලු දෙවියෝ වෛර නැත්තෝ වෙත්වා, දරහ නැත්තෝ වෙත්වා, නපුරු අදහස් නැත්තෝ වෙත්වා, දුක් විපත් නැත්තෝ වෙත්වා, සුවපත් වූ ආත්ම පරිහරණය කරන්නෝ වෙත්වා.

6. සියලු මනුෂ්‍යයෝ වෛර නැත්තෝ වෙත්වා, දරහ නැත්තෝ වෙත්වා, නපුරු අදහස් නැත්තෝ වෙත්වා, දුක් විපත් නැත්තෝ වෙත්වා, සුවපත් වූ ආත්ම පරිහරණය කරන්නෝ වෙත්වා.

7. සියලු විනිපාඩිකයෝ වෛර නැත්තෝ වෙත්වා, දරහ නැත්තෝ වෙත්වා, නපුරු අදහස් නැත්තෝ වෙත්වා, දුක් විපත් නැත්තෝ වෙත්වා, සුවපත් වූ ආත්ම පරිහරණය කරන්නෝ වෙත්වා.

මෙහිදී සියලු ස්ත්‍රීහු හා සියලු පුරුෂයෝ ලිංග භේද වශයෙන් ගෙන ඇත. සියලු ආර්යයෝ සහ අනාර්යයෝ ආර්ය-පථෝග 'ඡන වශයෙන් ගෙන ඇත. සියලු දෙවියෝ, මනුෂ්‍යයෝ සහ විනිපාඩිකයෝ උත්පත්ති වශයෙන් ගෙන ඇත. මෙසේ සත්කල සියලු ස්ත්‍රීහු ආදී වශයෙන් එරණතා (පැතිරවීම) නතකි. වෛර නැත්තෝ වෙත්වා යනාදී වශයෙන් අර්පණා නතරකි. එහිද මිදිමෝ එරණතාව අනුව මුළු කමටහනම ආකාර 28කින් යුක්ත වේ. මේ සියවර 28ට එක එක අර්පණා සමාධිය බැගින් අර්පණා සමාධි 28ක් වර්ධනය කළ හැකිය.

අනෝදිසෝ එරණතාවයට අනුව මෛත්‍රිය වැඩීම



මෙයද ආකාර පහකින් වර්ධනය කළ (වැඩිය) හැකිය. අනෝදිසෝ එරණතාවයේදීද ප්‍රථමයෙන් තමන්ට මෛත්‍රී වැඩිය යුතුය. ඒ සඳහා ඉහත දක්වූ කමට මෙන් වඩන සියවර යොදා ගන්න. පසුව අනෝදිසෝ එරණතාවට අනුව පොදුවේ සියලු සත්වයන්ට මෙත් වැඩිය යුතුය.

1. සියලු සත්වයෝ (පංචස්කන්ධයට ඇළුණු සත්වයෝ) වෛර නැත්තෝ වෙත්වා, දරහ නැත්තෝ වෙත්වා, නපුරු අදහස් නැත්තෝ වෙත්වා, දුක් විපත් නැත්තෝ වෙත්වා, සුවපත් වූ ආත්ම පරිහරණය කරන්නෝ වෙත්වා.

මේ ආකාරයට සියලු ප්‍රාණීහු (ආශ්වාස ප්‍රශ්වාස දෙකින් යුතු සත්වයෝ.)

සියලු භූතයෝ (කර්මයෙන් හා කෙලෙසුන්ගෙන් උපන් සත්වයෝ.)

සියලු පුද්ගලයෝ (නිරයට ගමන් කරන සත්වයෝ.)

සියලු ආත්මභාව පරිහරණය කරන්නෝ (ශරීරයක් දරන්නෝ) කෙරෙහි මෛත්‍රිය වැඩීම කළ යුතුය.

අනෝදිසෝ එරණතාවට අනුව එරණතා නතකි. අර්පණා නතරකි. සියල්ල සියවර අර්පණා වශයෙන් 28කි.

දිසා එරණතාවට අනුව මෛත්‍රිය වැඩීම

දිසා එරණතාව නම් දිසා 10 අනුව මෛත්‍රිය වැඩීමය. දිසා දහය නම් උතුරු දිශාව, දකුණු දිශාව, නැගෙනහිර දිශාව, බටහිර දිශාව යන ප්‍රධාන දිශා 4ක්, අනුදිශා වශයෙන් සැලකෙන ඊසාන, නිරිත, ගිනිකොණ, වයඹ දිශාව යන දිශා 4ක්, උඩ සහ යට යන දිශා 2ක් සියල්ල හේවිට දිශා 10ක් වශයෙනි.

තමන්ට මෛත්‍රිය වැඩීම කර අනතුරුව, උතුරු දිශාවෙහි වසන සියලු සත්වයෝම වෛර නැත්තෝ වෙත්වා, දරහ නැත්තෝ වෙත්වා, නපුරු අදහස් නැත්තෝ වෙත්වා, දුක් විපත් නැත්තෝ වෙත්වා, සුවපත් වූ ආත්ම පරිහරණය කරන්නෝ වෙත්වා...

දකුණු දිශාවෙහි වසන සියලු සත්වයෝම,
නැගෙනහිර දිශාවෙහි වසන සියලු සත්වයෝම,
බටහිර දිශාවෙහි වසන සියලු සත්වයෝම,
ඊසාන දිශාවෙහි වසන සියලු සත්වයෝම,
නිරිත දිශාවෙහි වසන සියලු සත්වයෝම,
ගිනිකොණ දිශාවෙහි වසන සියලු සත්වයෝම,
වයඹ දිශාවෙහි වසන සියලු සත්වයෝම,
උඩු දිශාවෙහි වසන සියලු සත්වයෝම,
යට දිශාවෙහි වසන සියලු සත්වයෝම

කෙරෙහි එකින් එක ඉහත ආකාරයට මෛත්‍රිය වඩන්න.

උඩු දිශාව සඳහා මෛත්‍රිය වඩන්නේ දෙවියන් හා බ්‍රහ්මයන් කෙරෙහිය. යට දිශාව සඳහා මෛත්‍රිය වඩන්නේ නිරයෙහි වසන සතුන් සඳහාය.

ඒ අනුව එරණතා 10හි. අර්පණා 4කි. සියලු අර්පණා 40හි. ඉහත ආකාරයට අනුව සමස්ත කමටහන සියවර 520ක් දක්වා ගමන් කරයි.

පූජ්‍ය ඇරැව්වල සුධම්ම හිමි



එදා 'ඉබ්න් බතුතා' සිරිපා කරුණා කළ හැටි

'ඉබ්න් බතුතා' නම් ප්‍රකට මුස්ලිම් ජාතික සංචාරකයා එදා සිරිපා කරුණා කළ හැටි දක්වෙන විස්තරය ඉතා අපූරුය. මේ ලිපියෙන් මා ඔබ හමුවට ගෙන එන්නේ රසයෙන්, විස්මයෙන් හා කුතුහලයෙන් පිරුණ එම කතාවයි.

මුස්ලිම් ජාතික සංචාරකයකු වන ඉබ්න් බතුතා ක්‍රි.ව. 1325-1354 අතර කාලය තුළ ආසියාවේ හා අප්‍රිකානු රටවල සංචාරය කළ ප්‍රකට දේශගවේෂකයෙකි. ඔහු ලංකාවට පැමිණ ඇත්තේ කුරුණෑගල රාජධානි සමයේදී බව ඉතිහාස මූලාශ්‍රවල සඳහන් වේ. මේ ගමන පිළිබඳව වැදගත් විස්තරාත්මක කෘතියක් එච්. ඒ. ආර්. ගිබ් (H. A. R. Gibb) නමැති විද්වතා විසින් ලියා තිබේ. මේ ඉතිහාස ග්‍රන්ථයෙහි එදා කුරුණෑගල රාජ සමයේ මෙරට පැවති සමාජ, දේශපාලන හා ආර්ථික පසුබිම ගැනද මනා විස්තරයක් සඳහන් වේ.

එවකට කුරුණෑගල රාජධානිය පාලනය කළ ආර්යචක්‍රවර්තිතුමා "ඉබ්න් බතුතාව" හොඳින් පිළිගෙන ඔහුට අවශ්‍ය පහසුකම් සලසා දී තිබේ. ඔහු මාබාර්හි සුල්තාන්වරයාගේ මිතුරකු වීම ඊට බලපෑ ප්‍රධාන හේතුව විය. රාජ්‍ය පාලකයා ඔහුට ඔහු වර්ග කීපයක්ද පරිත්‍යාග කොට ඇත. බතුතා ඇතුළු පිරිස දින තුනක්ම රජුගේ උදව් ඇතිව මෙහි විනෝදයෙන් කාලය ගත කොට තිබේ.

මේ සම්බන්ධයෙන් ඔහු දක්වා ඇති ප්‍රකාශයක මෙසේ සඳහන් වේ.

"මේ සුන්දර දිවයිනට පා තැබූ දවසේ පටන් මගේ සිතේ පැවැති බලවත් ආශාව වූයේ පූජනීය ආදම්ගේ පා සටහන වැඳ පුදා ගැනීමට යාමය."

ඔහු මේ අදහස මෙරට පාලක ආර්ය චක්‍රවර්තිට කී විට ඔහු මෙසේ කියා තිබේ.

"ඔබට ආදම්ගේ කන්දට යන්න මම සියලු උදව් උපකාර කරන්නම්. ඔබ පැමිණි නැව ආපසු හරවා යවන්න."

මේ බව බතුතා තමා පැමිණි යාත්‍රාවේ ප්‍රධානියාට කී විට ඔහු කියා ඇත්තේ "ඔබ ආදම්ගේ පා සටහන වැඳ එන්න. ඒ තාක් කල් මම මේ තොටුපළේ නැව රඳවාගෙන සිටින්නම්" යනුවෙනි. ඉන්පසු සිරිපා කන්දට යාමට පෙළගැසුණ හැටි 'බතුතා' විස්තර කොට ඇත්තේ මෙලෙසිනි.

"ආර්ය චක්‍රවර්තී විසින් කුලීකරුවන් සමග මාව උසුලාගෙන යා හැකි පල්ලැක්කියක් සපයනු ලැබුවා. කෑම බීම ඇතුළු තවත් අවශ්‍ය දේ සපයා දුන්නා. ඒක හරිම අපහසු පීඩාකාරී ගමනක්. ඒත් ඒ ගමනින් මං ලොකු සතුටක් වින්ද, අප ගමන් ගත් මග දෙපසම දිගටම ජල පහසුකම් තිබුණා. වන සතුන් අපට හමුවුණත් ඔවුන්ගෙන් කිසිම කරදරයක් වුණේ නැහැ. අපිට 'මැහැලි අම්බලම' කියන ප්‍රදේශය හමුවුණා. ඒ අවට ගල්ගුහා තිබුණා. කුඩැල්ලෝ හරියට හිටියා. ආදම්ගේ පර්වතයට 'සෙරන්ඩිබ් හිල්' කියන වචනයද භාවිත වෙලා තිබෙන බව අපුව දැනගත්තා."

මේ අපූරු විස්මයජනක ගමන බතුතා හරිම අපූරුවට විස්තර කර තිබුණි. ඔහු ලද ඒ අපූර්ව අත්දැකීම සිත් ගන්නා අන්දමට කිමේ හැකියාවක්ද ඔහු වෙත විය. 'ආදම්ගේ කන්ද' වටේටම තිබුණේ ගහ කොළ වැල්, විශාල රෝස මල් අපි දුටුවා. මේ උස කඳු මුදුනට ළඟාවීම සඳහා පාරවල් දෙකක් තිබුණා. එකක් 'බාබා' මාර්ගයයි. අනික 'මාමා' මාර්ග යයි. පහසුම පාර වෙන්නේ 'මාමා' මාර්ග යයි. 'බාබා පාර' අතිශයින්ම දුෂ්කර බව කිව යුතුයි. ඉස්සර කාලේ හිටපු මිනිස්සු 'බාබා' පාරේ ගල් පඩි හද තිබුණා. යකඩ කණු හිටවලා දම්වැල් සවි කරලත් තිබුණා. තවත් කන්දේ ඉහළට නැග්ග විට 'කදිරි ලෙන' මුණ ගැහුණා. මේ ලෙන පිහිටලා තිබුණේ සමතලා බිමකයි. උල්පතකින් දිය වෑහෙන පොකුණුවල මාළු හිටියා. කිසිවෙකුත් ඒ මාළු අල්ලන්ට ගිහින් නැති බව පෙනී ගියා. වන්දනාකරුවන්ට තමන් ගෙන ගිය බඩු බාහිරාදිය තැන්පත් කරන්නට මේ සමතලා බිමෙහි ගල් ගුහාවක් තිබුණා. එහි තමන්ගේ බඩුමුට්ටු තබලා සමයි කඳු මුදුනට නගින්න පටන් ගත්තේ. ඒකත් හරිම වෙහෙසකර ගමනක් වුණා."

ඉන්පසු මේ දුෂ්කර වන්දනා ගමන ඔහු විස්තර කරන්නේ මේ ලෙසටය.

"ආදම්තුමාගේ පා සටහන (මේ මතයට බොදු ජනතාව එකඟ නොවෙති) තබා ඇත්තේ උස් ගිරි මුදුනකයි. එය ගල්තලාවේ යටට ගිලී ගිය අයුරකින් තැන්පත් වී තිබීම විශේෂයි. දිගින් වියන් 11ක් විතර වෙනවා. ඈත පුරාණයේදී මෙම ස්ථානයට චීන ජාතිකයින් පැමිණ තිබෙන බවට සාධක තිබෙනවා. වන්දනාකරුවෝ උදේ හවස පාද පද්මය වන්දනා කෙරුවා. අපත් ඒ චිරාගත චාරිත්‍රය අනුගමනය කළා. ආපසු කන්ද බැස්සේ 'මාමා පාරෙන්.' එහි පර්වත ප්‍රාන්තයේදී අපට විශාල වෘක්ෂයක් හමුවෙනවා. එහි ඇති කොළ බිමට වැටෙන්නේ නැහැ. ඒ හින්ද පලා අහුල ගන්න විදියක් නැහැ. සමහර වන්දනාකරුවෝ එම ගහෙන් කොළයක් අහුලා ගන්නට බොහෝ වේලාවක් බලා සිටින හැටි අපි දක්කා. එම ගහේ කොළයක් කැවොත් ඔහුලු පුද්ගලයකු වුවත් තරුණ වෙන බවට මිනිසුන් අතර ලොකු විශ්වාසයක් තිබුණා. පර්වතය කිට්ටුවම ලොකු වැවකුත් දකින්නට තිබුණා. ඒ වැවේ වතුර නිල් කැටයක් වගේ ලස්සනයි."

'ඉබ්න් බතුතා' ගේ මේ විස්තරයට අනුව එදා සිරිපා කන්ද තරණය කිරීමේ වන්දනා ගමන අති දුෂ්කර එකක් වුවත්, එය සතුට හා විනෝදය දනවන එකක් වූ බව පැහැදිලිය. අදටත් විශාල වශයෙන් සිංහල බෞද්ධයින් පමණක් නොව වෙනත් ආගම්වල උදවියද සිරිපා කන්ද තරණය කරමින් අපූරු ආශ්වාදයක් විඳිති. උදවෙන මැදින් පුර පසළොස්වක පොහොයට සිරිපා මලුව සුදු වතින් පිරී යාම අපූරු දසුනකි. වන්දනාකරුවෝ වැඩිපුරම සිරිපා පද්මය වන්දනාමාන කරන්නේ උදවෙන මැදින් පෝයට විමද විශේෂත්වයකි. 'සිරිපා කරුණා කිරීම' සෑම බෞද්ධයකු විසින්ම කළ යුතු ඉතා සුන්දර පුණ්‍යවන්ත ක්‍රියාවකි.



නිව්ටන් ගුණසේකර

"ඇත්ත කිව යුතුය. අනුන්ට නොකිවිය යුතුය. අතිකකු යමක් ඉල්ලූ කල මිසක් වුවත් දිය යුතුය. මේ තුන් කරුණෙන් කෙනෙකුට දෙවියන් වෙත යා හැකිය."

ලොව පැරණිම දින දසුන සමනොළ කන්දේ සෙවනැල්ලද?

බෞද්ධයන්ගේ නිරන්තර වන්දනාමානයට පාත්‍ර වූ, සැම වසරකම මහ මසක් ආගමික විනාවන් සඳහා සැදහැවතුන් පැමිණෙන සමන්තකූට පර්වතය හෙවත් සමනොළ කන්ද ලොව පැරණිම ස්වාභාවික දින දර්ශනයක් ලෙස හිදැස්කරා සසිතව ලොවට හෙළි කිරීමට ශ්‍රී ලාංකේය පරිශේෂකයන් පිරිසක් මේ වන විට සමත්ව සිටියි.

සූරිය උදාවන සමයම බටහිර දෙසින් දිස්වන සමනොළ කන්දේ ත්‍රිකෝණාකාර ප්‍රතිබිම්බය ජාතික ගණනය කිරීම් උපයෝගී කරගෙන ඔවුන් මෙම නිගමනයට පැමිණ ඇත.

ශ්‍රී ලංකා දේව තාරකා විද්‍යා ඒකකයේ පරිශේෂණ අංශයේ අරවින්ද රවිසාරු සුමතරත්න මහතා පරිශේෂණය කාරව ක්‍රියා කළේය. රොහාන් ඉන්දික වික්‍රමසූරිය, මොරටුව විශ්වවිද්‍යාලයේ ආචාර්ය සී. ජ්‍යන්ත ආයතනයේ අභ්‍යවකාශ භෞතික අංශයේ පරිශේෂණ කාරකා විදුසඳල ජානක අඛ්ස්සුරිය, සැලණිය විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි ආයතනයේ තාමල් අබේවර්ධන යන මහාචාර්යවරුද මේ පරිශේෂණයන්ට එක්වූහ.

සමනොළ කන්දේදී සූරිය උදාව "ඉර හේවය" ලෙස බොහෝ දෙනෙක් හඳුනාර ඇත. හිරු උදාවෙන විට ශ්‍රීපාද මතුවේ සිවිය කෙළෙතුට එහි බටහිර ක්ෂිතිජය දෙස බැලුවහොත් ශ්‍රීපාද කන්දේ ප්‍රතිබිම්බය ත්‍රිකෝණාකාරව දැකගත හැකිය. ගහපත් වූ තාපගුණයක් පවතින විටක මෙය හොඳින් නිරීක්ෂණය කළ හැකිය. උදෑසන කාලයේ පරිසරයේ ජලවාෂ්ප ඝනත්වය ඉහළ අගයක් ගන්නා නිසා බටහිර ක්ෂිතිජයේ සමනොළ කන්ද ප්‍රතිබිම්බය හොඳින්ම දැකගත හැකි බව පරිශේෂකයන්ගේ නිගමනයයි. මෙවැනි සිද්ධියක් දැකගත හැකි බවට ලෝකයේ මෙතෙක් කොතනත් එතම ස්ථානය සමනොළ කඳ මුදුන විය හැකි යැයි පරිශේෂකයෝ විශ්වාසය පළ කරති.

සමනොළ කන්දේ සෙවණැල්ල හා එහි තෘතෝලිය පලුනීම සම්බන්ධයෙන් 2011 සහ 2012 වර්ෂවල අවාර තමිය කොදගෙන මෙම පරිශේෂණයන් පවත්වා ඇති බවද පරිශේෂකයෝ කියති. ඒ අනුව 2011 වර්ෂයේ සිට සමනොළ කන්දේ ප්‍රතිබිම්බයේ ත්‍රිකෝණාකාර පිහිටීම පිළිබඳව වන්දිතා තාක්ෂණය ඇසුරෙන් ලබාගත් දත්තද ගබඩා කර පසුව ඒවා විශ්ලේෂණය කර මෙම නිගමනයට එලු ලැබිය.

සමනොළ කන්දේ උස මීටර් 2233කි. ඉහත දත්ත අනුව ප්‍රතිබිම්බය නිරීක්ෂණය වීම සඳහා වන්දුවේ උස මීටර් 275ක අගයක් ලබාගත හැකි වූ බවත් එය සමනොළ කන්දේ සම්පූර්ණ උසින් අටෙන් එකක අගයක් ගන්නා බවද පරිශේෂකයෝ පෙන්වා දෙති. එය සමනොළ කන්ද හැරීමේදී සඳුවන ආඩියාමිලයන්ගේ (ආඩියාමළ හැන්කට) මුහුදු මීටරයේ සිට උස මීටර් 1958කි) සිට ශ්‍රීපාද මතුවට ඇති දුරට සමාන බවද ඔවුහු පෙන්වා දෙති. කුරුවිට එරන්න මිරිකය හරහා සිදුවන බවද පරිශේෂණය මඟින් අනාවරණය වී ඇත.

අවාරයේදී සමනොළ කන්දේ ප්‍රතිබිම්බයේ ආරම්භක ප්‍රදේශයක් ලෙස ගණිතය දිස්ත්‍රික්කයේ ජාඇලට සිලෝ මීටර් දෙදහසක් ඉහළ අහසේ බව හඳුනා ගැනීමට හැකිවූ බවද පරිශේෂකයෝ කියති.

ශ්‍රීපාද වාරයේ සහ අවාරයේ සූරියා උදාවන ස්ථානය වෙනස් වන නිසා එහි ප්‍රතිබිම්බයේද විචලනයන් සිදුවන බව දත්ත අනුව පෙනී යන බවද පරිශේෂකයෝ කියති. එය සාමාන්‍යයක් ලෙස ගත්විට එම විචලනය කොලඹ මධ්‍යගතය ලෙස ගත් විට සිලෝමීටර් විස්සක් උතුරට සහ දකුණට ප්‍රතිබිම්බයේ ආරම්භය පෙන්නුම් කරන බවද ඔවුහු පෙන්වා දෙති.

මෙම තණතය නිරීක්ෂවලදී පරිශේෂකයෝ මීට අවුරුදු අනූවකට පමණ ඉහත දී සමනොළ කන්දේ ප්‍රතිබිම්බය සටහන්වීම ගැන තොරතුරු විශ්ලේෂණයට ගෙන තිබේ. 1934 වර්ෂයේදී ඉංග්‍රීසි ජාතිකයක් පිරිසක් විසින් ශ්‍රීපාද මතුවේ සිට රඟහල කරන ලද ශ්‍රී ලංකාවේ ගීතය (Song of the Ceylon) සමඟති චිත්‍රපටියේ සමනොළ කන්දේ සෙවණැල්ලද නිරීක්ෂණයට ආරම්භය කර ඇත.

ශ්‍රීපාද ප්‍රතිබිම්බය ස්වාභාවික සංඥාවක් (Natural Signal) ලෙස පරිශේෂකයෝ හඳුන්වති. මෙම දත්ත අනුව ප්‍රතිබිම්බයේ පාතනය සමඟ ශ්‍රීපාද බටහිර බැවුමේ සතුන්ගේ චර්යාමය වෙනසක් සිදුවිය හැකි බවට පරිශේෂකයෝ නිගමනය කරති. ඉදිරි පරිශේෂණයන් එම ක්ෂේත්‍ර සෝදෙකි හොඳි කරවීමට නිගමන බවද ඔවුහු කියති.

එසේම මෙම ප්‍රතිබිම්බය සහ වානුකෝලිය වස්තූන් අතර සම්බන්ධතාවක් ඇති බවට පරිශේෂකවරුදි පෙනී ගිය බවද කියති. එංගලන්තයේ "ස්ටෝන්හෙන්ජ් හොඩනැගිම" හරහා එහි සෙවණැලි පාතනය හාවිතයෙන්ද මෙම කාලය ගණනය කළ හැකි බව පරිශේෂකයෝ අවධාරණය කරති. ඒ අනුව පෘථිවියේ වලිතයේ සොටනක් වන භූමණය, පරිලම්බය පහළවෙන් ගණනය කළ හැකි බවද පවසන පරිශේෂකයෝ ඒ මත පිහිටා ලොව පැරණිම ස්වභාවික දින දර්ශනය ලෙස සමනොළ කන්ද සහ එහි ප්‍රතිබිම්බය හඳුන්වාදීමට තීරණය කළ බවද කීවේය.

මෙම පරිශේෂණයන් අදියර අටකින් යුක්තය. එහි පළමු අදියර නිගාවීමෙන් පසු මෙම නිගමනයට පැමිණ ඇත.

සමනා සම්බුදුරජාණන් වහන්සේ එම හිරිසා පද්මය සමිටුහන් කිරීමටත් මෙයද හේතුවක් වන්නට ඇතැයි කිසිය හැකිය. එමෙන්ම අතීතයේ රෝමයේ මහ අලෙක්සැන්ඩර් රජු, දහතරවැනි කියවසේ දේශගවේෂකයකු වූ ඉබ්න් බතූතා වැන්නවුන්ද එහි පැමිණෙන්නට ඇත්තේ මේ ආශ්චර්යය නිසාද? අනුත් කතිකාවතකට මේ පරිශේෂණයන් මාර්ගය සතයයි.

එසේම හිරිසා අඩවියේ වෙනෙක වන සතුන් පිළිබඳ සත්ත්ව විද්‍යාඥයින්ගේ සොයාගැනීම් අනුව හිරිසා අඩවියේ සත්ත්ව විශේෂවල සැඩරුව (ශ්‍රීපාද අඩවියේ වන අවි කුරු හැඩයකින් යුතු බව) මෙන්ම චරියාවන්ගද වෙනස්කම් ඇති බව අවධාරණය කර ඇත්තේ මේ විද්‍යාත්මක හේතුන්දැයි අනුනින් හිතීමට සාලය එළඹ ඇත.

අවිත් ලාල් ගාන්ත උදය

"යකඩියෝ නැගුණ මලකට වීම යකඩියම නා දමයි. නුවණින් තෝරා වියත නැනැත්තාගේ අකුසල් බහු දුනහියම යවයි."

දළදා වර්ෂය

නිධිය විශේෂ ඔපෙෂේ සරසංගය
ශ්‍රී දළදා මාලිගය
මහනුවර
දුරකථන : 0812204684
ෆැක්ස් : 0812236202
E mail : media@sridaladamaligawa.lk
Web : www.sridalada maligawa.lk

දැහැමි සමාජයක් ගොඩ නගමු

ලොව පවතින ලෙඩෙක් රට පුරා ගැවිසුණු ශ්‍රී ලංකා දිවයට ඉදි ම නම් හාවිතා කළ හැකි යන ප්‍රශ්නය. අදත් නැතිම නොවළඳුන්විය හැක්කමි. රට හෝතුව මිහිලුණු දෙවරාය, කොළඳැනෑමි, ගිලී ප්‍රලය, මාදු දෙවමහ ඇතුළු සෙදෙදිට උත්පත්ති ලීලා අද අප රට තුළ සාමාන්‍ය දේවල් බවට පත්වෙමින් තිබේය. හොඳ නරක හඳුන විමර්ශනය මෙන්ම ප්‍රැඩිය හා සංවේදනය මිළිබඳ සම්මතයද අද වන්විත් සමාජය තුළින් බැහැර යන තත්ත්වයක් හෙවුනුම තවාම. මෙනිසා අද අපට දක්නට ඇත්තේ මනුෂ්‍ය සේවකයෙන් පෙනී සිටින ගල්ලා සෙවනෑ අවයවිෂ්ඨ සතාය්‍යකි. මෙයට එරෙහිව ප්‍රබල විරෝධයක් නැගෙන තිබුණු අයට හෙමෙහෙන්. ඔබ - යැවිදි බුද්ධිමතුන් අනුනාමය කරන්නේ නිහඬ සිටීමෙනි. ඔබලු දෙමහන්ත හා නිරන්ත ගැටුලු ගහන බිය නිසා වරදකින් සමාවෙන් බලුවන අලුත පැරණින්නේ ජාතිවාදය ශ්‍රී දේශපාලුකයෝ බිම හොඳියා ඇරිය. ඉතා පාමාදුවී දින උපන් දේශපාලුකයන් මේම සමාජය තුළ යළි බිඳ නම් ඒ අපලොක්කයි. "ගජබාහවතු වර්ෂිතා" ගනුවෙන් සම්මත ශ්‍රී ජරිතිය සහාය හෙතුවට අද බිම් ඩ බිංගෙන්න පුළුමෝ පුදු, සැහැසි පුදු සත්‍යයකි.

මේ සහාය මිලු දකින්නට නම් දැසට, කැබෑසට, මෙමේදිය, ආදරය හා අනුකම්පාව බිරුළු දැනම් සත්වයන් හෙරා නහා ගැනීම වෙන කළු යුතු කාර්යයක්ම වන්නේය. මේ සියලු අවශ්‍යතාවට පාර්ථව විසඳුම්ක් සොයා ගැනීමට නම් අප දැඩ ශ්‍රද්ධ මනට හිටිය යුතු වන්නේය. එය සිතට සහනය සලසනා මුදු මිණක් මෙම සහතේ දකුමේ සමාජයක් දෙසා වත ඇත මව්වෙයක්ද වත මිට අදහස් ගැනිමය.

මෙන්නම මෙම්ට ප්‍රතිපදා නිරවුල්ව දැනගෙන පංගලිල පිළිවෙතකට ගමන් කළ යුතු කලාය දන් එළඹ සිංහයි. මෙම්ට ආරම්භ වන්න පිළිගැනීමේ ක්‍රියාවලිය ගතට අපට දැන්ම අවශ්‍යවන විය හැකි නම් මෙම කිළිටි හා අදිමිටු සමාජය වරම වරිතු දැනම් සමාජයක් බවට පත්කර ගැනීම අපගෙමු පොරොත්තු ඇත.

■

ලොව අලුත්ම දුනාරතාව හෙට මෙහෙට්ටන්ගේ පුහුණුවෙන් යුතු ශ්‍රී දළදා හාලිහාව මෙම්ම පුහුණුවෙන්ම අදු ම මහනුවර දී 1996 ජනවාරි මස 25 වෙනිදා උදාසන 4.300 ට මෙම වර්ෂය ශ්‍රී ලංකාවේ පුහුණුවෙන් අලුත්ම දෙවන සොදුරුත්ම අදුන් ම මහනුවර රාජාතන මියවියා. 28 දෙනෙක් අඩංගු පුහුණු.

මේ සම්බන්ධ රටම සුදානමේ සැ සිටියි.

පිදුරු හාතියේ පුහාණය ඒ අලුතින්ම සෙන්ටාට හෙළි හොත්වීමේ වන්නේ වන්නේ වන්න

බුද්ධානුස්සති භාවනාව වඩන හැටි!

බුද්ධානුස්සති භාවනාව යනු බුදුරජාණන් වහන්සේගේ ගුණ සිහිකිරීමයි. ඉතිපි සො පාඨයෙන් කියැවෙන්නේ අරහං ආදී බුදු ගුණ නවයයි.

ඉතිපි සො භගවා අරහං සම්මා සම්බුද්ධො
විජ්ජාචරණ සම්පන්නො සුගතො ලොකවිදූ
අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං
බුද්ධෝ භගවාති.

ඒ භාග්‍යවතුන් වහන්සේ මේ කාරණයෙන් 1. අර්හත්යහ 2. සම්මාසම්බුද්ධයහ 3. විජ්ජාචරණ සම්පන්නයහ 4. සුගතයහ 5. ලෝකවිදූයහ 6. අනුත්තර පුරිසදම්මසාරථියහ 7. දෙවි මිනිසුන්ගේ ශාස්තෘයහ 8. බුද්ධයහ 9. භගවත්යහ.

මෙම බුදු ගුණ අතරෙන් කැමැති බුදු ගුණයක් අරමුණු කරගෙන භාවනා කළ හැකිය. පහත දක්වෙන්නේ අරහං බුදු ගුණය අරමුණු කරගෙන භාවනා කළ හැකි ආකාරයකි.

"ඉතිපිසො භගවා අරහං"

ඉතිපි: මේ මේ කාරණයෙන් සො භගවා: ඒ භාග්‍යවතුන් වහන්සේ අර්හත්යහ: එනම්:

1. සියලු කෙලෙසුන් කෙරෙන් දුරු වූ බැවින්ද,
2. සියලු කෙලෙස් සතුරන් නැසූ බැවින්ද,
3. සංසාර චක්‍රයෙහි අරටු සිඳලූ බැවින්ද,
4. සියලු ලෝවැසියන්ගේ ආමිස පූජා, ප්‍රතිපත්ති පූජා ලැබීමට ඉතාම සුදුසු වූ බැවින්ද,
5. රහසින් වත් පව් නොකළ බැවින්ද අර්හත් නම් වන සේක.

විදාගම මහා මෛත්‍රිය ස්වාමීන් වහන්සේගේ බුදුගුණ අලංකාරයෙහි අරහං ගුණය මෙසේ විස්තර කැරෙයි.

"රහසින් වත් පව් නොකොට
කෙලෙසරයනුත් දුරු කොට
නිසි වූයෙන් පුදට
අරහං යන නම කියති මුනිඳුට"

මෙසේ බුද්ධානුස්සති භාවනාවේ යෙදෙන්න.



බුද්ධානුස්සති භාවනාව

බුද්ධානුස්සති භාවනාවෙහි යෙදීම සඳහා ඊට ගැළපෙන සුදුසු ස්ථානයක හිඳගන්න. බුදු මැදුරක නම් වඩාත් සුදුසුය. නැතහොත් බුද්ධ ප්‍රතිමා වහන්සේ නමක් ඉදිරිපිට හෝ යටත් පිරිසෙයින් බුද්ධ රූපයක් ඉදිරිපිට හිඳගතහොත් වඩා පහසු වීමට පිළිවන. හිඳගැනීම පිරිමියකු නම් බද්ධ පර්යංකයෙන් (එරමිණියා ගොතාගෙන) දණ කාන්තාවක නම් අර්ධ පර්යංකයෙන් (දෙපා පිටිපසට නමාගෙන) ද නම් වඩාත් හොඳය. පළමුව බුදුරජාණන් වහන්සේට වන්දනා කර බුද්ධ ප්‍රතිමා වහන්සේ හෝ බුද්ධ රූපය දෙස බලාගෙන බුදු ගුණ සිහි කරන්න. නැතහොත් දක පුරුදු වඩාත් පැහැදීමක් ඇති බුද්ධ ප්‍රතිමා වහන්සේ නමක් හෝ බුද්ධ රූපයක් සිහියට නගාගෙන පහත සඳහන් ආකාරයට මෙනෙහි කරමින් භාවනා කරන්න.

මාගේ ගුරු තිලෝගුරු සම්මා සම්බුදුරජාණන් වහන්සේ සියලු කෙලෙසුන් නැසූ බැවින් අරහං නම් වන සේක.

ඒ කෙලෙසුන් නැසූ මාගේ අමා මැණියන් වහන්සේට මාගේ නමස්කාරය වේවා.

අරහං සම්මා සම්බුද්ධෝ
විජ්ජාචරණ සම්පන්නො
සුගතො ලොකවිදූ අනුත්තර
පුරිසදම්මසාරථි සත්තා
දෙවමනුස්සානං බුද්ධො
භගවා
භගවා බුද්ධො
සත්තා දෙවමනුස්සානං
පුරිසදම්මසාරථි ලොකවිදූ
සුගතො
විජ්ජාචරණ සම්පන්නො සම්මාසම්බුද්ධො අරහං
අරහං
අරහං
අරහං

මේ ආකාරයට අරහං ගුණය මෙනෙහි කරමින් වීර්යයෙන් යුතුව භාවනා කරන්න.

භාවනාවෙහි ඉදිරියට යෑමට කැමැති පින්වතුන් හොඳ භාවනා ගුරුවරයකුගේ මග පෙන්වීම ලබාගැනීම සුදුසුය.

ධර්ම ගංවිම

නීතිගරුකව කටයුතු කිරීම හැම අතින්ම හිතකරය - ගග්ග ජාතකය

කාන්තාවනි

මේ කරුණු 5 දැන ඉගෙන ඔබත් සුගතියට යන්න

සූත්‍ර පිටකයේ ග්‍රන්ථ පහ අතුරින් සංයුක්ත නිකායේ සළායතන වර්ගයේ මාතුගාම සංයුක්තේ අනුරුද්ධ වර්ගයට අයත් දෙවැනි සූත්‍රය අත්කොටන සූත්‍රයයි. මෙම සූත්‍රයේ නිධානයක් සඳහන් නොවේ. මෙවැනි නිධානයක් රහිත සූත්‍ර රාශියක් ත්‍රිපිටකයේ දක්නට ලැබේ. කෙසේ වෙතත් මෙහිදී බුදුරජාණන් වහන්සේ සුගතියට හෙවත් දිව්‍ය ලෝකයට පැමිණීමට කාන්තාවක් සතුව තිබිය යුතු ගුණාංග පිළිබඳ විස්තර කරයි.

(පඤ්චහි භික්ඛවේ ධම්මේහි සමන්නාගතො මාතුගාමො කායස්ස භේද පරම්මරණා සුගතිං සග්ගං ලෝකං උප්පජ්ජති. කතමෙහි පඤ්ච පඤ්චෙහි සද්ධො ච හොති. හිරිමා ච හොති ඔත්තාපි ච හොති. අත්කොටතො ච හොති. පඤ්ඤවා ච හොති. ඉමෙහි ඛො භික්ඛවේ පඤ්චෙහි ධම්මේහි සමන්නාගතො මාතුගාමෝ කායස්ස භේද පරම්මරණා සුගතිං සග්ගං ලොකං උප්පජ්ජති.)

මහණෙනි, ධර්මයන් පහකින් යුක්ත වූ කාන්තාව මරණින් මතු සුගතියට උප්පත්තිය ලබයි. කවර කරුණු පහක් ද ශ්‍රද්ධාවෙන් යුක්ත වෙයි. ලැජ්ජාව ඇත්තේ වෙයි. බිය ඇත්තේ වෙයි. අක්‍රෝධයෙන් යුක්ත වෙයි. නුවණ ඇත්තේ වෙයි. මෙම කරුණු ඇත්නම් අනිවාර්යයෙන්ම සුගතියේ උප්පත්තිය ලබන්නේ යැයි දේශනා කොට තිබේ. දන් බුදුරදුන් දේශිත සූත්‍රයෙන් අපේ ජීවිත සකස් කරගත යුතු ආකාරය විමසා බලමු.

පළමු කරුණ ශ්‍රද්ධාවෙන් යුක්ත වෙයි යන්නයි. ශ්‍රද්ධාව යන්නෙන් ප්‍රකාශ වන්නේ නොසැලෙන විශ්වාසයයි. මෙය සෑම බෞද්ධයෙක් සතුවම තිබිය යුතු උතුම් ගුණාංගයකි. ශ්‍රද්ධාව නම් බුදුරජාණන් වහන්සේ නව අරහාදි බුදුගුණයෙන් යුක්ත යැයි නිශ්චයකට පැමිණීමයි. එය ස්ථිර සිතුවිල්ලක් නම් සුවදායකය. යමෙකුට මෙලෙසින් ඇතිවන ශ්‍රද්ධාව ආකාරවති සද්ධා හා අමුලිකා සද්ධා යැයි කොටස් දෙකකි. කරුණු නිවැරදිව අවබෝධ කර ගැනීමෙන් ඇතිවන ශ්‍රද්ධාව ආකාරවති සද්ධාවයි. හරිහැටි අවබෝධයක් නැතිව ඇතිකර ගන්නා විශ්වාසය අමුලිකා සද්ධාවයි. එමෙන්ම යමෙක් බුදුරජාණන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධා මාත්‍රයක් ඇති කරගත්තේ නම් ඔහු දිව්‍ය ලෝකයේ උප්පත්තිය ලබන බව අලගද්දූපම සූත්‍රයේදී සඳහන් කරයි. (යෙසං මයි සද්ධාමත්තං පේමමත්තං සබ්බෙ තේ සග්ගපරායනො) එමෙන්ම කාන්තාවක් නම් තම ස්වාමියාට, දරුවන්ට ශ්‍රද්ධාවෙන්, ප්‍රේමයෙන් යුතුව විසිය යුතුය. එවැනි කාන්තාවක් සිටින පවුල් ජීවිතයද සාර්ථකය. අඩදබර හා කලකෝලාහල නොමැති සමගි සම්පන්න පවුලක් ගොඩනැගිය හැකිය. එය මෙලොවදීම දිව්‍ය සැප අනුභව කිරීමකි. තවද පරලෝක වශයෙන් සුගතියට යාමටද මග පාදයි.

දෙවැනි හා තෙවැනි කරුණු නම් ලැජ්ජාව හා බිය සහිත වීමයි. පව් කිරීමට, වැරදි සහගත ක්‍රියා සිදුකිරීමට ඇතිවන ලැජ්ජාව හා බිය මෙහිදී විස්තර කරයි. විවාහක කාන්තාවක් නම් තම ස්වාමියා හැර වෙනත් පිරිමින් ඇසුරු කිරීමට භය, ලැජ්ජාව ඇතිකර ගත යුතුය. පස් පව් නොකිරීමට භය හා ලැජ්ජා විය යුතුය. මෙම භය හා ලැජ්ජාව ලෝකපාලක ධර්ම ලෙසද ධර්මයේ දක්වනුයේ සමස්ත සමාජය පාලනය කරන උත්තම ගුණාංගයක් වන නිසාවෙන්ය. එමෙන්ම පවුලක් පාලනය කරන ප්‍රධාන අංග දෙකක් ලෙසද හැඳින්විය හැකිය. සමාජයේ කුඩාම ඒකකය පවුලය. එය ආරක්ෂා කරන්නට හිරි ඔත්තප්ප දෙක වඩාත් උපකාරී වෙයි. එමනිසා ලැජ්ජාව, භය සහිත කාන්තාව සිටින නිවසද දිව්‍ය ලෝකයකි. මරණින් මතු ජීවිතයද සුගතියකම වෙයි.

අක්‍රෝධය හෙවත් වහා නොකිපෙන සුළු, තරහා නොයන, ඉවසීම පුරුදු කළ කැනැත්තියක් වීම කාන්තාවක සතුව තිබිය යුතු තවත් උතුම් ගුණාංගයකි. ඉවසීම තරම් ශ්‍රේෂ්ට ගුණාංගයක් ලොව දකගත නොහැක. දුක සැප, නින්ද ප්‍රශංසා සියල්ල ඉදිරියේ ඉවසීම දරා ගැනීමට හැකිනම් එය සැපදායකය. අගහිඟකම් ඉවසීමද, දරුවන්ගේ ගැටලු ඉවසීමද කළ යුතුය. සූත්‍රයේ නාමයද අත්කොටන යන්නයි. එයින් කියවෙන්නේද ක්‍රෝධ නොකිරීමේ වටිනාකමයි. ක්‍රෝධ නොකර ඉවසීමේ ගුණාංග සහිත කාන්තාවක් වසන නිවස දිව්‍ය ලෝකයකි. අඩදබර, ගෝරනාඩු, කලකෝලාහල නොමැති නිසාය. ඔවුන් මරණින් මතුවද සුගති ලෝකයේ උපදියි.

එමෙන්ම කාන්තාව මනා නුවණින් යුක්ත විය යුතුය. ප්‍රඥාව සහිතව වාසය කළ යුතුය. කාන්තාව මව් පදවියෙන්ද පිදුම් ලද විට අතිශයින් නැණවත් විය යුතුය. විශේෂයෙන්ම ජීවිතයට පැමිණෙන ප්‍රශ්න හඳුනා ගැනීමට මෙන්ම ඒවාට නිවැරදි ධර්මානුකූල විසඳුම් ලබාගැනීමටත්, ස්වාමියාට දරුවන් නැණවත්ව හොඳ නරක කියා දෙන්නටත්, විශේෂයෙන්ම ලොව සුචරිත් දරුවන් බිහිකරන්නටත් කාන්තාව හෙවත් මව නැණවත් විය යුතුය. බුද්ධිමත් කාන්තාවක් වෙසෙන නිවස ප්‍රියංකර සුන්දර දිව්‍ය ලෝකයක් බඳුය. ඒ බුද්ධිමත් තීරණ ගැනීමද, කල්පනා කිරීම, විසඳුම් සෙවීම ආදිය නිසාවෙනි.

රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති
පූජ්‍ය ටැම්පිටියේ ඉන්දවිමල හිමි



ඔබ හැදූ වැඩූ දෙමව්පියන්ට ආදරය කරන දරුවෙක්ද?



අප කවුරුත අර්හත් සම්මා සම්බුදුරජාණන් වහන්සේට උතුම් සම්බුදු පදවිය ලබා ගැනීමට මුලිනම ආශිර්වාද කළෙත් ආදරණීය අම්මා. ඒ ජාතුපෝනක කාන්තාවියේ අම්මාට කෝ තමයෙන ඒ කාරුණ බෝධිසත්වයෝ පිනගෙන හොඩට ආවට පස්සේ අම්මගේ මුලින් පිටවුණ වදන තමයි "අනේ මගේ පුතාට බුදුබව ලැබේවා" කියලා. ඒ කියා තමයි අපගේ බෝධි සත්වයෝ ධෛර්යයක් වුණේ. බුද්ධත්වය වැනි උතුම් තත්ත්වයක් ලබන්න, උතුම් බුද්ධ රාජ්‍යය ලබාගෙන අපගේ ශාන්ති නායකයාණන් වහන්සේ දේශනා කළේ මේහෙමයි. "ඒවිත්තාහං භික්ඛවේ න සුප්පතිකාරං වදමි යත්ත මේ දිවේ ඛාතුචිච පිතුචිච" කියලා. ඒ කියන්නේ මහණෙනි, මේ ලෝකයේ කරන ලද උපකාරවලට ප්‍රති උපකාර කරලා අවසාන කරන්න බැරි දෙදෙනෙක් ඉන්නවා. ඒ තමයි අම්මයි, තාත්තයි. භාග්‍යවතුන් වහන්සේ දේශනා කරන්නේ අම්මවයි, තාත්තවයි තමන්ගේ උරහිස් දෙකේ හඬාගෙන අවුරුදු සීයක් ඇය උපස්ථාන කළත් ඒ දෙදෙනා දරුවන්ට කරන ලද සේවයට ප්‍රති උපකාර කරන්න බැරි බවයි. ඒ වගේම භාග්‍යවතුන් වහන්සේ දේශනා කළේ අම්මයි, තාත්තයි කියන්නේ මහා බ්‍රහ්මයින් ලෙස. මහා බ්‍රහ්මයා තුළ ගුණධර්ම හතරක් තිබෙනවා. ඒ තමයි මෛත්‍රී, කරුණා, මුදිතා හා උපේක්ෂා. අම්මයි, තාත්තයි තරම් දරුවන්ට මෛත්‍රියෙන් කටයුතු කරන පිරිසක් නවත් මේ ලෝකේ නෑ. ඒ වගේම දරුවන්ව හදවඩා ගන්න මේ අම්මයි, තාත්තයි මොන තරම් දුකක් විඳිනවද? ඒ පුදුම ඉවසීමකින්, මෛත්‍රියෙන්, කරුණාවෙන්. දරුවාගේ දුක දකින විට දෙමව්පියන්ගේ සිත කම්පා වෙනවා. දරුවා අසනීප වී අඬන විට අම්මාටත් ඇඬෙනවා. තාත්තත් ශෝකයෙන් පසුවෙනවා. සමහරවිට තාත්තා අඩනවා. ඉහළදී දක්නට ඒ අම්මටයි, තාත්තටයි කරපු උපකාරවලට ප්‍රති උපකාර කරලා අවසන් කරන්න බෑ. ඒත් භාග්‍යවතුන් වහන්සේ දේශනා කරනවා යම් දරුවෙක් තමාගේ මිනිසුදෙමව්පිය දෙමාපියන්ව සම්මා දිට්ඨියෙහි පිහිටුවනවා නම් තමන් ණයෙන් නිදහස් වෙන බව.

ඉතින් පින්වතුනි, බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදළ සතිදි කටයුතු කරන දෙමාපියන් තුළ අනිවාර්යයෙන්ම සතර බ්‍රහ්ම විහරණ තිබෙනවා. අපි අසන, දකින, ඇසුරු කරන බොහෝ දෙමාපියන් තුළ මේ ගුණධර්ම හතර නිරන්තරයෙන් පිහිටලා තිබෙනවා. ඉතින් දී පෙන්වලා දන්නා මෛත්‍රියෙන්, කරුණාවෙන් අපේ අම්මලා, තාත්තලා දරුවන්ව වෙනුවෙන් කටයුතු කරන්නේ කොහොමද කියලා. ඒ වගේම අපේ දෙමාපියන් තුළ තිබෙන තවත් උතුම්ම ගුණාංගයක් තමයි මුදිතාව. මුදිතාව කියලා කියන්නේ තම දරුවන්ගේ සැපෙදී සතුටුවීම. ප්‍රාර්ථනා පිරපු මගේ දරු, පුතා හොඳට අගෙන යෙන උසස් පදවි, උසස් රැකියා, උසස් නම්බුනාම, කීර්ති, ප්‍රශංසා ආදිය ලබාකොට ඔහුයෙන්, ඕලයෙන් අධ්‍යාත්ම කටයුතු කරනකොට අම්මයි, තාත්තයි පුදුම විදියට සතුටු වෙනවා. අම්මගේ, තාත්තගේ ඇස්වල ඒ වේලාවට සතුටු කඳුළු පිරිලා. ඒ වගේම අපි හොඳින්ම අඳුනගන්න ඕන අම්මලගේ, තාත්තලගේ තිබෙන උපේක්ෂා ගුණය. සමහර දරුවෝ අම්මට, තාත්තට සලකන්නේ නැතිව ඉන්නකොට ඒ අම්මලා, තාත්තලා ඒවා ගැන කලකිරෙන්නේ නැතිව පුදුම ඉවසීමකින් කටයුතු කරනවා.

අපි දන්නවා සමහර දරුවෝ විවාහ වුණාට පසුව තමාව හදවඩා ගත්ත ආදරණීය අම්මව අමතක කරනවා. ආදරණීය තාත්තව අමතක කරනවා. අම්මයි, තාත්තයි දෙන්නටම අලුතෙන් පවුලට එකතු වුණු බෑණලා, ලේලිලා අකටයුතුකම් කරනවා. සමහර වෙලාවට අම්මට ගෙදරින් එළියට යන්න වෙනවා. තාත්තට ගෙදරින් එළියට යන්න වෙනවා. ඒ අයට අනාථ නිවාසවලට යන්න වෙනවා. සමහර දරුවෝ උක්සෙපි අය. සෝරිපති අය. ඒත් අහිංසක අම්මයි, තාත්තයි අනාථ නිවාසේ. එතෙම තැත්තම් මහපාරේ හිතමෙන් යදිනවා. හැබැයි මේ අම්මට තාත්තට මොනතරම් තාඩන පීඩන ආවත් බොහෝ අම්මලා, තාත්තලා තම දරුවන්ට කවදවත් හෙණ ඉල්ලන්නේ නෑ. ශාප කරන්නේ නෑ. ඒ අය ගැන මෛත්‍රී සහගතව කටයුතු කරනවා. තමන්ට සලකන දරුවාටත්, තමන්ට නොසලකන දරුවාටත් එකම විදිහටයි සලකන්නේ. මේ තමයි අම්මලගේ, තාත්තලගේ තිබෙන උපේක්ෂා ගුණය.

ඒ වගේම භාග්‍යවතුන් වහන්සේ දේශනා කොට වදළේ අපගේ දෙමාපියන් පූර්වාචාර්යවරු හැටියටයි. ඒ කියන්නේ අපේ මුල් ගුරුවරු හැටියට. (සුමිඛවර්ය ධූවිවරේ) මුලින්ම දරුවන්ට හොඳ, නරක කියලා දීලා



මැයි? මාවනෙත් සුමනට යොමු කරවන්නේ අම්මයි, තාත්තයි. චූටිම කාලේ ඉඳලා ඒ අයට නැමදෙයම කියලා දෙන්නේ කවුද? ඒ උතුම් අම්මයි, තාත්තයි. බලන්න අපි මූලින්ම දනගෙන හිටියද කැම කන හැටි, අත හෝදන හැටි, මූණ හෝදන හැටි, නාන හැටි, වැසිකිළි ගිහිල්ලා සෝදන හැටි, කැම ටික ඉගිරව යන්නේ නැතිව අනුභව කරන හැටි, ඇඳුම් සෝදගන්න හැටි, භාග්‍යවතුන් වහන්සේ වන්දනා කරන හැටි, අක් දෙක නළලේ තබා වඳින හැටි, ගාථා කියන හැටි, තෙරුවන් වඳින හැටි, අපේ පුංචි දරුවෝ මූලින්ම "බුද්ධං සරණං ගච්ඡාමි" කියලා කියන්නේ අම්මලා, තාත්තලා කියනවා අහගෙන ඉඳලා. ඉතින් මූලින්ම ආගමික සමාජානුයෝජනය ලැබෙන්නෙත් අම්මගෙනුයි, තාත්තගෙනුයි. වැඩිහිටියන්ට ගරු කරන හැටි, වැඩිහිටියන්ට සහ ඒ ඒ අයට කතා කරන හැටි. ඒ ඒ ඇති සද්වචන් කතා කරන හැටි. මේ සේරම ඉගෙන ගන්නේ අම්මගෙනුයි, තාත්තගෙනුයි, හොඳටත් අභිමතට ගිහිල්ලා මනක් කරලා බලන්න. අපි මේ එසපාරටම උඩින් පනල වුණේ නෑ. ඒ උදර අම්මවයි, තාත්තවයි අපි කොච්චර හොඳින් රැකබලාගන්න ඕනද?

ශාස්තෘවරයෙක් වශයෙන් බුදුරජාණන් වහන්සේ තරම් අම්මගේ, තාත්තගේ ගුණය හඳුනාගෙන ධර්මය දේශනා කරපු වෙනත් ශාස්තෘවරයෙක් මුළු ලෝකයේම මෙතෙක් පහළ වුණේ නෑ. උන්වහන්සේ ගිහි සිංහතුන් එදිනෙදා පරිශීලනය කරන මංගල සූත්‍රයේදී දේශනා කොට වදාළේ "මාතා පිතු උපට්ඨානං" කියලා. ඒ කියන්නේ අම්මටයි, තාත්තටයි උපස්ථාන කරන්න කියලා. ඒ මංගල කරුණක් කියලා. එළඟට "පුත්ත දාරස්ස සංගහෝ" කියලා දේශනා කළේ දෙවනුවට. මේක අපි විශේෂයෙන් සැලකිය යුතු කරුණක්.

මේ අපි විශේෂයෙන් සැලකිය යුතු කරුණක්. ඇයි අම්මට, තාත්තට සැලකීම මූලින් දේශනා කරලා, අඹු දරුවන් පෝෂණය කිරීම දෙවනුවට දේශනා කළේ කියලා. ඒකට හේතුව තමයි අම්මයි, තාත්තයි තමයි අඹු දරුවන්ට වඩා උතුම් වෙන්නේ. ඒත් අද සමහර දරුවෝ තමාගේ පවුල කඩාකප්පල් වෙයි කියලා අම්මවයි, තාත්තවයි මහමගට දානවා. සමහර වෙලාවට ඒ අයට ඇඳු කඳලින් තමයි ජීවත් වෙන්න සිදුවෙලා තිබෙන්නේ. අම්මලා තාත්තලා සිටීම පවුල් ජීවිතයට ප්‍රශ්නයක් කියලා හිතලා දරුවෝ ඒ අයට ඒ හෙදර ඉසාවෙන විදියට කටයුතු කරනවා. සමහර වේලාවට මේවායේ මූලිකත්වය ගන්නේ එක්කෝ සුනාගේ භාර්යාව, එහෙම නැතිනම් දුවගේ ස්වාමීයා. අප මහ බෝසතාණන්ගේ ආදරණීය සුළු මැණියන් වන මහා ප්‍රජාපති ගෝතමී රහත් තෙරණිය පිරිනිවන් පෑමට යන මොහොතේදී ගාථා පන්සියයක් එතුමියගේ ගුණ වර්ණනා කරලා දේවාවතාරාමයේ දොරටුව දක්වා පසුග මන් කළා. බුදුරජාණන් වහන්සේ වෙනත් කෙනකුගේ පසුපසින් ගමන් කළ එකම අවස්ථාව වන්නේ මේ මැණියන්ගේ පසුපසින් ගමන් කිරීමයි. ඒ වගේම උන්වහන්සේ තමා මෙලොවට බිහි කළ මැණියන්ට කව්තිසා භවනටම වැඩම කරලා ධර්මය දේශනා කළා. මේ ආකාරයෙන් ආදර්ශයෙන් ලෝකයට මව්පිය උපස්ථානය සෙන්වා වදාළා.

ඒත් බුදුහම පවතින මේ රටේ අම්මටයි, තාත්තටයි වර්තමානයේ සමහර දරුවන් සලකන්නේ කොහොමත් පහත් විදිහට. ඒ අයට හරියාකාරව ගරු සැලකිලි ලැබෙන්නේ නෑ. සමහරු අම්මා තාත්තා මියයියාට පසුව තමයි සියලු යුතුකම් කරන්න හදන්නේ. ඒ නිසා අපි යහපත් තෙරුවන් සරණ ගිය දරු පිරිසක් නැටියට අම්මට, තාත්තට නියම සැලකිල්ල දක්වන්න ඕනෑ. ඒ වගේම ගුණමකු දරු පිරිසක් මේ රටේ හිඟිවීමට සමහර දෙමව්පියනුත් වගකියන්න ඕන. ධනය, බලය, කුලය, නිලය, වංශය, දේපොල, ජනප්‍රියභාවය, අලංකාරය වැනි ලොකික දේවල් පසුපස හඹා යන දරු පිරිසක් ඕනි කිරීමෙන් දෙමාපියන්ට ලොකෝ උස් දෙමහස් විඳින්න සිදුවී තිබෙනවා.

ඒ නිසා දෙමාපියන් බුදුරජාණන් වහන්සේ සිඟාලෝවාද සූත්‍රයේදී දේශනා කළ පරිදි පාපයෙන් මිදවලා සුචරිතය තුළ හිඟිවුවන්න ඕන. ඒ වගේම දරුවන් තම දෙමාපියන්ගේ අනන්ත ගුණයන් හඳුනාගෙන ඒ අය වෙනුවෙන් ජීවත්ම සිටින විට කළ යුතු යුතුකම් සියල්ල හරියාකාරව ඉටු කරලා මිය පරලොව ගියාට පසුව පිං දීම් කටයුතු සිදුකරලා ඒ අයට සෑම ආකාරයෙන්ම යුතුකම් කරන්න. ජීවත් වෙලා සිටිනකම්, ඒ අයට අගෞරව කරලා සිත් රිදවලා මරණෙදි සිංකම් කරන්න, උත්සව කරන්න සුදනම් වෙන්න ගොඳ නෑ. ඒ නිසා ඔබත් හොඳ ගුණගරුක දරුවෙක් ඔබට පත්වී උතුම් මාෂිය උපස්ථානය කරගෙන, පිං රැස්කරගෙන දෙලොව යහපත සලසා ගන්න.

පූජ්‍ය පොල්පිතිගියේ කලානන්ද හිමි



මිනිසුන්ට බාධා වන පරිදි ශබ්ද පූජා පැවැත්වීම තහනම්

අපි නොදන්න නීතිය

පරිසරය මෙන්ම එහි පවිත්‍රතාවය කෙරෙහිද බුදුදහම විශේෂ අවධානයක් යොමුකර ඇත. පන්සලක පවතින නිසංසල බව මනසට සැනසිල්ලකි. එසේ වුවද ඇතැම් අවස්ථාවල විහාරාරාමවලින් ඇසෙන හඬ අසල්වැසියන්ට බාධාවකි, කරදරයකි. ශබ්දවාහිනී යන්ත්‍ර යොදාගෙන පිරිත් ප්‍රචාරය කිරීම නිසා ඇතැම් විට භික්ෂූන්ට එරෙහිව පොලීසියට පැමිණිලි ලැබෙන අවස්ථාද තිබේ. මේ බෞද්ධ රටේ ශබ්දවාහිනිය මගින් ආගමික ප්‍රචාරක කටයුතු සිදුකරන්නට කාගෙන්වත් අවසරයක් කුමකටද? අන්‍යාගමිකයන්ට ඒ සඳහා කිසිම බාධාවක් නැත යන අදහසින් නීතිය ඉක්මවා කටයුතු කිරීම හේතුවෙන් ඇතැම් භික්ෂූහු දඬුවම් ලබති. ශ්‍රී ලංකාව බෞද්ධ රටක් බව ඇත්තකි. එසේ වුවත්, රටේ නීතියට පිටුපා කටයුතු කරන්නට කිසිවකුටත් අවසර නොමැත. අවට පරිසරයේ නිහඬතාව සුරැකීම හා අසල්වැසියන්ට බාධාවක් නොවන ලෙස කටයුතු කිරීම පිළිබඳ නීතිමය තත්ත්වය භික්ෂූන්ද දැන සිටිය යුතුය.

අසල්වැසියන්ට හිරිහැර වන ලෙස කටයුතු කිරීම ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 261 වගන්තියේ එන මහජන කරදරය යටතේ සඳහන් වරදකි. එය පැහැදිලි කර ඇත්තේ මේ අයුරිනි.

"261. මහජනයාට හෝ සාමාන්‍යයෙන් අසල පදිංචිව සිටින හෝ දේපොල භුක්ති විඳින ජනයාට පොදු පාඩුවක්, අන්තරායක් හෝ අප්‍රසන්නතාවක් ඇති කරන නැතහොත් යම් පොදු අයිතිවාසිකමක් භුක්ති විඳීමේ අවස්ථාවකින් ප්‍රයෝජනයක් ගැනීමට සිදුවිය හැකි ජනයාට අවශ්‍යම පාඩුවක්, බාධාවක්, අන්තරායක් ඇතිවන යම් ක්‍රියාවකට හෝ එබඳු නීති විරෝධී නොකර හැරීමකට වරදකරු වන තැනැත්තෙක් මහජන කරදරය කිරීමේ වරදට වැරැදිකාරයෙක් වේ. යම් පහසුකමක් හෝ ලාභයක් සැලසීමේ කරුණ උඩ මහජන කරදරයට සමාව නොලැබේ."

අවට ජනයාට හිරිහැරයක් වන පරිදි හේවිසි, සංගීත සංදර්ශන, ගුවන් විදුලි යන්ත්‍ර, ශබ්ද විකාශන යන්ත්‍ර භාවිත කරන අයට විරුද්ධව මෙම වගන්තිය යටතේ නඩු පැවැරිය හැක. අසල්වැසියන්ට හිරිහැරයක් වන පරිදි නිවෙස්වල යාච්ඤා කරන පුද්ගලයන්ට එරෙහිවද මෙම නීතිය ක්‍රියාත්මක කළ හැකිය.

2008 සැප්තැම්බර් මස රාජගිරිය වැලිකඩවත්තේ භික්ෂුවක් අත්අඩංගුවට ගත්තේ ශබ්ද දූෂණය පිළිබඳ නීතියට පිටුපා කටයුතු කිරීම හේතුවෙනි. උන්වහන්සේ කළ වරද නම්, පොලීසියෙන් බලපත්‍රයක් ලබා නොගෙන ශබ්ද විකාශය යන්ත්‍රයකින් පිරිත් ප්‍රචාරය කිරීමය. උන්වහන්සේට එරෙහිව පැමිණිල්ලක් ගොනු කළේ පරිසර පදනම නමැති රාජ්‍ය නොවන ආයතනයකි. රාත්‍රී 10 සිට අලුයම 6.00 දක්වා කාලයෙහි පොලීසියේ අවසරයක් නොලැබ ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතය තහනම් කෙරෙන නීති රෙගුලාසියක් පවතියි. වැලිගම ප්‍රදේශයේ ඉස්ලාම් ආගමික ස්ථාන දෙකක් අතර ඇතිවුණ අර්බුදයක් හේතුවෙන් මහාධිකරණය 2007 දෙසැම්බර් 10 නිකුත් කළ තීන්දුවක් ඇත. උන්වහන්සේ ශබ්ද විකාශන භාවිත කළේ එම නීති රෙගුලාසි නොදනය. එය සමාවට කරුණක් ලෙස නොසැලකෙයි. සෑම පුරවැසියකුම නීතිය දැන සිටිය යුතුය යන පූර්ව නිගමනයක් පවතියි. එසේ නැතිනම් වැරැදි කරන බොහෝ දෙනකු මම ඒ නීතිය දැන සිටියේ නැතැයි කියන්නට පුළුවන. නමුත් පෙර වැරැදි නැතිනම්, අනුන්ට බාධාවක් කිරීමේ අදහසකින් එය නොකළ බව තහවුරු කළ හැකි නම් අධිකරණයෙන් සමාව ලැබෙන්නට ඉඩ ඇත. එය අධිකරණයේ තීරණයකි.



රාත්‍රී කාලයේ අසල්වැසියන්ට බාධා වන ලෙස හේවිසි වාදනය කරවීමත් වරදකි. එමනිසා 1895 අංක 16 පොලිස් ආඥා පනතේ 90 වගන්තිය යටතේ භික්ෂූන්ට එරෙහිව නඩු පැවරීම සිදුකොට ඇත. මාර්ෂල් එදිරිව ගුණරත්න උන්නාන්සේ සහ හොලන්ඩ් එදිරිව කපුගම තෙරුන්නාන්සේ යනුවෙන් නඩු දෙකක් නීති වාර්තාවල දක්වේ. එහිදී භික්ෂූන්ට දඩ නියම කොට ඇත. පන්සල්වල සිදුකෙරන හේවිසි වාදනය, පිරිත් ප්‍රචාරය වැනි ආගමික කටයුතුවලට සාමාන්‍යයෙන් ජනතාව විරුද්ධ වන්නේ නැත. නමුත් ඕනෑම කෙනෙකුට සාධාරණ හේතු පෙන්වා එයට එරෙහි වන්නට නීති ප්‍රතිපාදන තිබෙන බව භික්ෂූන් වටහාගත යුතුය. අසල නිවෙස්වල සිටින රෝගීන්, පාඩම් කරන ළමුන් හා කුඩා දරුවන් සිටින විට ඔවුන්ට තැති ගැනීමක්, බාධාවක් සිදුවන ලෙස ශබ්ද කිරීම නොගැළපෙයි. නීතියටත් වඩා මානව දයාවෙන් පිරුණ ස්වයං පාලනයක් එවැනි පරිසරයක පැවැතිය යුතුය.

කිසියම් ආගමික කටයුත්තක් සඳහා මහා මාර්ගයේ ශබ්ද විකාශන මගින් ප්‍රචාරයක් කරන්නට අවශ්‍ය නම්, ඒ සඳහා අදාළ ඉල්ලුම් පත්‍රය පුරවා පොලීසියෙන් අවසර ගත යුතුය. අවට වෙසෙන පිරිස එය බාධාවක් ලෙස නොසලකයි නම්, පන්සල් සීමාවෙහි ශබ්ද විකාශනය කළාට කමක් නැත. නමුත් ආගමික හා ජනවාර්ගික වශයෙන් සංකීර්ණ වූ නගර ආශ්‍රිතව ශබ්දවාහිනිය, බෙර දවුල් භාවිතය ගැටලු සහගතය. විශේෂයෙන් රාත්‍රී 10න් පසු උදෑසන 6.00 දක්වා ශබ්ද විකාශනය කළහැක්කේ අවසරයකිනි. ශ්‍රී ලංකා පරිසර අධිකාරියේ 1980 ජාතික පරිසර පනතද මෙහිදී අවධානය යොමුකළ යුතු තවත් නීති කෙටුම්පතකි. පරිසරයට හානි කරන ක්‍රියාවන් සිදුකිරීම වරදකි. ශබ්දය මනින ඩෙසිබල් ඒකක 80ට වැඩි ශබ්ද තරංග මිනිසකුගේ ශ්‍රවණේන්ද්‍රියට හානි පමුණුවයි.

කිසියම් පුද්ගලයකුට හානියක්, සෞඛ්‍යයට තර්ජනයක් වන පරිදි පරිසරය පවත්වාගෙන යාම හා 1939 අංක 61 දරණ පීඩන ක්‍රියා ආඥා පනත හා 1946 අංක 57 ආඥා පනතට අනුව වරදකි. පරිසරය අපවිත්‍ර කරන, දුගඳ හමන අන්දමට මංමාවත් ආදියෙහි කුණුකසල ආදිය දමීම, අනුන්ගේ ඉඩම්වලට හා මාර්ගවලට කසල කාණු හැරවීම තහනම්ය. කසල නිසි පරිදි ඉවත් කළ යුතුය. පන්සල්වල කටයුතුද එයට අදාළ වෙයි. පසුගිය කාලයේ පැවැති ඩෙංගු මර්දන කටයුතුවලදී අවට පරිසරය මහජන සෞඛ්‍යයට හානිකර පරිදි පවත්වාගෙන යෑමේ හේතුවෙන් පන්සල්වලට එරෙහිවද පැමිණිලි ඉදිරිපත් විය. දණ්ඩ නීති සංග්‍රහයේ 262 වගන්තියට අනුව ජීවිතයට අන්තරාය ගෙනදෙන, රෝග පතුරුවන ආකාරයට නොසැලකිලිමත් ලෙස පරිසරය තබාගැනීම නීතියෙන් දඬුවම් ලැබෙන වරදකි.

පූජ්‍ය මැදගම ධම්මානන්ද හිමි
අස්ගිරි මහා විහාරයිය තාරක සංඝ සභික
ගරු අනුශාසක - සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩලය





දන් දෙන අතරේ
ත්‍යාගානුස්සති භාවනාවත් වඩමු

ලෞකික ජීවිතයේදී අනේකවිධ ගැටලුවලට මුහුණ දීමට සිදුවන බව සබ දන්නෙහිය. එම සියලු ගැටලුවලට විසඳුම් බුදු දහම තුළ පෙන්වා දී ඇත. ගිහි හෝ පැවිදි හෝ අපට අවශ්‍ය කරන්නේ මානසික සැනසීමයි. එම සැනසිල්ල ලබා ගන්නා ආකාරය මජ්ඣිම නිකායට අයත් 'සබ්බාසව' සූත්‍රයේ ඉතා පැහැදිලිව දක්වා ඇත. එහි සඳහන් පරිදි,

1. පටිසේවන පහාතබ්බා - අවශ්‍ය දේවල් අවශ්‍ය පරිදි නිසාසහිතව පරිභෝජනය කිරීම මඟින් ගැටලු විසඳා ගත හැකිය. ආහාරපාන, ඇඳුම් පැළඳුම්, ජලය, විදුලිය වැනි සියලු දෙයක්ම ප්‍රමාණය නොඉක්මවා පරිභෝජනය කළ යුතුය. එසේ නොකළහොත් ආර්ථික, සෞඛ්‍ය මෙන්ම සමාජයෙන්ද පරිහානියට පත්වෙයි.

2. අධිවාසන පහාතබ්බා - අවහිර මඟින් ගැටලු නිරාකරණය කරගත හැකිය. නොඉවසිල්ල නිසා බොහෝ ගැටලු ඇතිවී අවුල් රාලයක් වන අවස්ථාවන් ඇත. එබැවින් ඉවසීමෙන් සැහැසීම ලබාගත හැකි බව සිහිය යුතුය.

3. පරිවර්ජන පහාතබ්බා - සිතට ආවේග යක් ඇතිවූ විට එම ස්ථානයෙන් ඉවත්ව යාම මඟින් බොහෝ ගැටලු විසඳා ගත හැකිය. කලකෝලාහල වැනි අවස්ථාවන්ට පැටලීම මඟින් බොහෝ දෙනා විපතට පත්වන අයුරු දකිය හැක.

4. විනෝදනා පහාතබ්බා - සිත තුළ ඇතිවන කෝපය, වෛරය, පළිගැනීමේ චේතනාව, කණගාටුව, ආශාව වැනි දෙය නිසා ගැටලු ඇතිවේ. ඒවා නිසා දරුණු අපරාධ පවා කිරීමට පෙළඹෙයි. එබැවින් එවැනි චේතනා ඉවත් කර ගත යුතුය.

5. දස්සනා පහාතබ්බා - එනම් අවබෝධයෙන් කටයුතු කිරීමයි. හොඳ සහ නරක පිළිබඳ, කළයුතු දෙය, නොකළ යුතු දෙය පිළිබඳ මනා අවබෝධයක් තිබිය යුතුය. අහෙතුක් ඥානිකයන්, අනෙතුක් ඥානිකයන් පිළිබඳ මනා අවබෝධයක් මෙන්ම සුනඛතාවක් ගොඩනගා ගත යුතුය. එසේ නොවුණහොත් ආගමික, වාර්ගික ගැටුම් ඇතිවෙයි.

6. සංවර පහාතබ්බා - මෙයින් පෙන්නුම් කරන්නේ පංච ඉන්ද්‍රියයන් සංවර කරගැනීමයි. සමාජයේ බොහෝ ගැටලු ඇති වන්නේ පංච ඉන්ද්‍රියයන් අසීමිතව පිනවීමට උත්සාහ ගැනීම නිසාය. එසේනම් සිත, කය, වචනය සියල්ල පිදෙර යමෙක් සංවර කරගන්නේ නම් වර්තමානයෙහි අප දකින බොහෝ සමාජ ගැටලු විසඳා ගත හැකිය.

7. භාවනා පහාතබ්බා - මානස නොනොත් සිත සංවර කරගැනීම මඟින් සියලු ගැටලු නිරාකරණය කරගත හැකිය. බුදු දහමේ ඉගැන්වීමට අනුව සියලු දෙයටම ප්‍රධාන වන්නේ මානස භෙවත් සිතය. යමෙක් සිත සංවර කරගන්නේ නම් කෙතෙම සමාජයට වැඩදයක අයකු මිස, සමාජයට කරදරකාරී අයකු නොවේ. මනුගෙන් හෝ ඇයගෙන් සමාජයට සෙතක්, ගුණවියක් මිස කරදරයක්, විපතක් ඇති නොවේ.

මානස භෙවත් සිත එකඟ කරගැනීම මඟින් අපේ සිත සන හඳවන පිරිසිදු කරගැනීමට හැකියාව ලැබෙයි. එවිට යක්ඛිමක් මානසිකින් යථාර්ථය විටහා ගැනීමට හැකිවෙයි. නිරතුරුවම මිනිස් සිත් ආශාවන්, සතස් ගති, ද්වේෂය, වෛරය, ආශාව වැනි සිතුවිලි රාශියකින් පිරී ඇත. සිතට නැග එන අප්‍රමාණ සිතිවිලි සතරින් අපට ප්‍රයෝජනයක් නැති, පිඩාකාරී සිතිවිලිවලින් මිදීමට අවශ්‍යතාවයක් ඇති වෙයි. එවිට ඇතැම් දෙනා කරන්නේ කුමක්ද? ඇතැමුන් කලා නිර්මාණවලට යොමු වෙති. ඇතැමුන් ශුද්ධ තාවකාලික විනෝදශ්‍රවාදයන්ට යොමු වෙති. තවත් පිරිසක් මත් වතුර, මත් ද්‍රව්‍යවලට යොමු වීමෙන් මානසික අහසනය යටපත් කරගැනීමට උත්සාහ කරති. එයටද එහා යන ඇතැමුන් අසාමාන්‍ය දුරු කරගනු පිණිස සියදිවි නසා ගැනීමට පෙළඹෙති. එවැනි නිරර්ථක ක්‍රියාමාර්ගයන්ට යොමුවිය යුතු නැත. සිතට සහනයක් ලබාගැනීමට බෞද්ධ භාවනා ක්‍රම අපිරය වැදගත් වෙයි. එයින් සිතෙහි නිරෝධීතාව සේම කයෙහි නිරෝධීතාවද ඇතිකර ගත හැකිය. සමර භාවනා කිරීමේදී කමටහන් තෝරා ගැනීමේදී ඇතැම් දෙනා ගැටලුවට පත්වෙති. ඒ සඳහා ඔබට මග පෙන්වීම සඳහා මෙම ලිපිය පළ කරන්නේ.

මෙහිදී ඔබ කැමති කමටහනක් තෝරා ගැනීමට පෙර ඔබ විසින්ම ඔබගේ චරිතය විමසා බැලිය යුතුය. ඔබ ලෝභ සහගත චරිතයක් ද? ද්වේෂ සහගත චරිතයක් ද? මෝහ සහගත චරිතයක් ද? යන්න විමසා බැලිය යුතුය. ඒ අනුව ඔබට ගැලපෙන කමටහන තෝරා ගැනීම පහසු වෙයි. ඔබ ලෝභ සහගත චරිතයක් නම් අසුභ භාවනාව ද, ද්වේෂ සහගත චරිතයක් නම් මෛත්‍රී භාවනාව ද, මෝහ සහගත චරිතයක් නම් ආනාපානසති භාවනාව ද වඩා ගැනීම ඉතා වැදගත් වෙයි.

ඒ හැරුණු විට ඔබ ගිහි ගිහිකම් කරන්නෙක් නම් ඔබට ගිහි ගිහිකම් කරන්නෙකුට ගැලපෙන කමටහන් තෝරා ගැනීම ද වැදගත් වෙයි. ඒ අනුව ඔබට ගිහි ගිහිකම් කරන්නෙකුට ගැලපෙන කමටහන් ලෙස බුදුරජාණන් වහන්සේ දේශනා කළ ආරක්ඛ කම්මට්ඨාන, මරණානුස්සති, උපසම, සීල, දේවතානුස්සති, ත්‍යාගානුස්සති භාවනා ගැන විමසා බලමු.

ආරක්ඛ කම්මට්ඨාන භාවනාව ලෙස බුදුරජාණන් වහන්සේ දේශනා කළේ බුද්ධානුස්සති භාවනාවයි. බුදුරජාණන් වහන්සේ ගේ ගුණ අනුස්මරණය කිරීම මඟින් ආරක්ෂාව ලබා ගැනීම මෙහි අරමුණ වේ. මරණානුස්සති භාවනාව ලෙස බුදුරජාණන් වහන්සේ දේශනා කළේ මරණය පිළිබඳ සිහිය පිහිටුවා ගැනීම මඟින් ප්‍රමාදය දුරු කරගැනීමයි. උපසම භාවනාව ලෙස බුදුරජාණන් වහන්සේ දේශනා කළේ සන්සිඳුවීම මඟින් සිත සමාධිමත් කරගැනීමයි. සීල භාවනාව ලෙස බුදුරජාණන් වහන්සේ දේශනා කළේ සීලය පිළිබඳ සිහිය පිහිටුවා ගැනීම මඟින් සිත සමාධිමත් කරගැනීමයි. දේවතානුස්සති භාවනාව ලෙස බුදුරජාණන් වහන්සේ දේශනා කළේ දෙවිවරුන් ගේ ගුණ අනුස්මරණය කිරීම මඟින් සිත සමාධිමත් කරගැනීමයි. ත්‍යාගානුස්සති භාවනාව ලෙස බුදුරජාණන් වහන්සේ දේශනා කළේ දන් දීම මඟින් සිත සමාධිමත් කරගැනීමයි.

ඔබ 'ත්‍යාගානුස්සති' භාවනාව වැඩීමට අදහස් කරන්නේ නම්, ආහාරයට ගන්නා දෙයින් ස්වල්පයක් හෝ සුදුසු ප්‍රතිග්‍රාහකයකුට පිළිගන්වමයි සිතින අධිටාන ඇතිකරගත යුතුය. එසේ අධිටාන කරගෙන දුණුවත්, සිල්වත් ප්‍රතිග්‍රාහකයකුට යම්කිසි ප්‍රමාණයෙන් යමක් පරිත්‍යාග කර, ඒ දෙන දානය පිළිබඳ මෙනෙහි කරමින්,

"මච්ඡේර මල පරියුට්ඨාය අජ්ඣා වසිතං
මච්චේරේන චේතසා විහරාමි මුත්ත
චාගෝ සයපාණී පොස්සග්ගරතෝ යාචයෝගෝ
දානසංවිභාගරතෝ..." (අංගුත්තර නිකාය)

සඳහන් පරිදි "ඒතාන්තයෙන්ම මට ලැබුණේ ලාභයකි. මසුරු කමෙන් මිදුණෙමි. සම්පූර්ණ අයිතිය අත හැර දන් දෙන්නෙක් වෙමි. (මුක්තාවාගෝ) සැමද අතේ අතින් සතසා දන් දෙන්නෙක් වෙමි. (පයාපානී) නිරන්තරයෙන්ම දන් දෙන්නට කැමැත්තෙක් වෙමි. (වොස්සග්ගරතා) කිසිවකු විසින් ඉල්ලන ලද දෙය පරිත්‍යාග කිරීමට කැමැත්තෙක් වෙමි. (යාචයෝග) මැනවින් පිළියෙළ කර සහ පරිභෝග කළ යුතු දෙයින් කොටසක් දන් දෙනු කැමැත්තෙමි. (දන සංවිභාගරතෝ) යන ආදී වශයෙන් තමන් කළ පරිත්‍යාගය මෙනෙහි කළ යුතුය. ඔබ ත්‍යාගානුස්සති භාවනාව ප්‍රගුණ කිරීමට කැමැත්තෙහි නම් නිරතුරුවම මැනවින්



දන් පිළියෙළ කොට සිල්වත්, ගුණවත් ප්‍රතිග්‍රාහකයන්ට දන් දෙන, එමෙන්ම අනුභවය පිණිස සුදුනම් කර ගත් ආහාරයෙන් පිඩක් හෝ දීමට කැමති පින්වතෙක් විය යුතුය.

ඔබ මෙයට පෙර දන් දී පුරුදු නැති අයෙක් නම් මෙම භාවනාව ඇරඹීමට ප්‍රථම සිල්වත්, ගුණවත් ප්‍රතිග්‍රාහකයකුට ආහාර ස්වල්පයක් හෝ පිළිගන්වා, ඉදිරි කාලයෙහිද හැකි අයුරින් නොකඩවා දන් දෙමි'යි කියන ස්ථිර වූද, දැඩි වූ අධිෂ්ඨානයක් ඇතිකරගන්න, එසේ අධිෂ්ඨාන කරගෙන තමන් දෙන ලද දානයෙහි වටිනාකම මෙනෙහි කරමින් භාවනාව ආරම්භ කරන්න. මෙහිදී දානය වශයෙන් ආහාර පමණක් සැලකිය යුතු නැත. බෙහෙත්, ඇඳුම් පැළඳුම්, නිවාස, පොත්පත්, කුමන දෙයක් වුවද අවස්ථාවෝචිතව යොදාගත හැකිය.

දන් දෙන පින්වතුන්ට එයින් අත්වන ප්‍රතිලාභ රැසක් අංගුත්තර නිකායෙහි දක්වා ඇත. 'ලාභෝවකමේ' තමන්ට එයින් ලාභයක් අත් වෙයි. 'ආයුංකෝපන දත්වා ආයුස්සභාගීහෝති දිබ්බස්සවා මනුස්සස්සවා' ආයුෂ දෙන නිසා තමන් ලබන දිව්‍ය මනුස්ස ආත්මවල ආයුෂ ප්‍රමාණය වැඩිවෙයි. 'දදංපියෝහෝති හජන්තිනං බහුං', දන් දෙන පුද්ගලයා ලෝකයට ප්‍රිය වෙයි. 'සතං ධම්ම මනුක්ඛමං' ඔහු සත්පුරුෂ ධර්මයට අනුව කටයුතු කරන්නෙක් වෙයි. බුදුහිමියන් විසින් දන් දීම ගැන ආනිශංස වදරණ ලද්දේ යම්සේද එම ආනිශංස තමන්ටද අත් වන්නේය. දීමෙහි වටිනාකම ගැන මෙසේ ධර්මානුකූලව අවබෝධයක් ලබා ගත් ඔබ ත්‍යාගානුස්සති කමටහන වැඩීමට සුදුසු අවස්ථාවට පත්ව සිටින්නෙහිය.

භාවනා කිරීමට සුදුසු විවේක ස්ථානයකට යා යුතු වෙයි. භාවනා කිරීමට නොසුදුසු ස්ථාන 18ක් තිබෙන බව 'විසුද්ධිමාර්ගයෙහි' දක්වා ඇත. මැනවින් සිත කය සංවර කරගත් යෝගියාට කුමන ස්ථානයකදී වුවද සිත එකඟ කරගත හැකිය. සිදුහත් බෝසත් තවුසාණන් තෝරා ගත්තේ උරුවෙල් දනව්වයි. කඳු බෑවුමක පිහිටි ගල් ගුහා ප්‍රදේශය අදද නිහඬ, නිස්කලංක, භාවනාවට උචිත පරිසරයකි.

සුදුසු ස්ථානයකට ගොස් පහසු ඉරියව්වෙන් වාඩිවී භාවනා කිරීම ඇරඹිය යුතුය. බුද්ධානුස්සති වැනි කර්මස්ථානවල මෙන් මූලික පූර්ව කෘත්‍රීන් සිදු කර, තමන් කරන ලද දානමය පුණ්‍ය කර්මය පිළිබඳ සිතමින් සතුට ඇති කරගත යුතුය. ඉදිරි කාලයෙහි තව තවත් ත්‍යාගයන් කරන බව සිතමින් වචාත් සතුටක් ඇති කර ගන්න. "...සාධු... සාධු... දීම නිසා මට ඒකාන්තයෙන්ම ඇති වූයේ ලාභයක්මය. දිව්‍ය මනුස්ස සැප සම්පත් ලැබීමට සුදුස්සෙක් වුණෙමි... දන් දීම උතුම් ලාභයකි... මෙසේ සිටිමි, ඉදිමි වශයෙන් සජ්ජායනා කරමින් භාවනා කළ යුතුය. අනතුරුව "සාධු... සාධු... දන් දීම නිසා බුද්ධ ශාසනයෙන් නියම ඵල ප්‍රයෝජන ලබා ගත්තෙමි... මිනිස් ආත්මයෙන් නියම ප්‍රයෝජන ලබා ගත්තෙමි... දන් දීම උතුම්ය... මෙලෙස හොඳින් ප්‍රගුණ වන තුරු භාවනා කළ යුතුය. ඉන් අනතුරුව "දන් දීමෙන් ලාභ ප්‍රයෝජන, කිසිවක් බලාපොරොත්තු නොවෙමි... පූර්ණ අයිතිය අත්හැර දමන්නෙමි... මගේ දානය ඉතා උතුම්ය..." මෙම කොටස් ඉහත සඳහන් කොටස් සමග සම්බන්ධ කරගනිමින් එක් වරකට පැයක් හමාරක් භාවනා කළ යුතුය.

ඉන්පසුව "මගේ අතින් පිළියෙළ කර පිරිසිදු සිතින් මුල, මැද, අග යන තුන් කාලයේ හිත පහද ගෙන දෙන ලද මගේ දානය උතුම්ය... පරිත්‍යාග චේතනාවෙන් නොකඩ කොට, නොවරදවාම, නිරතුරුවම දෙන ලද මගේ දානය ඉතා උතුම්ය... මා වෙත පැමිණෙන සිල්වතුනට, දුගී, මගී යාචකයන්ට පිරිසිදු සිතින් දෙන ලද දානය ඉතා උතුම්ය... මගේ දානය ගෞරවයෙන් පිළියෙළ කරන ලද්දක්ය. මගේ ආහාරයෙන් කොටසක් නොවරදවාම දන් දෙමි... දන් දීම මහා සැපතකි... මගේ දානය ඉතා උතුම්ය..."

බටුගොඩ ශ්‍රී ජයසුන්දරාරාම මහා විහාරාධිපති,
ධර්මවේදී නාලන්දේ විමලවංශ හිමි



තණ්හාව

නැති කළ හැක්කේ කොහොමද?

තණ්හාව කියන චෛතසිකය හරිම ප්‍රබලයි. හිතේ දැඩි ලෙස බඳන් කාගෙන තියෙන මේ තණ්හාව සෘතග්ජන මනුෂ්‍යයාට ලෙහෙසියෙන් නැති කරන්න පුළුවක් දෙයක් නෙමෙයි. අනන්තවත් දුක් විඳලා, තණ්හාව නැති කරගන්න හිතනවා නම් එයත් මූලාවීමක්. අපි සසර පුරා විඳි දුක් කන්දරාව මහා සාගරයක් වගේ, ඒ තරමට විශාලයි. සංසාරේ පොඩ්ඩක් අමතක කරලා මේ ජීවිත කාලය තුළ ඔබ විඳපු දුක් කන්දරාව ගැන හිතලා බලන්න. ජීවිතය තිත්ත වෙන තරමට ඔබ දුක් වේදනා විඳලා ඇති. සමහර විට ජීවිතේ නැති කරගන්න පවා හිතිලා ඇති. ජීවිතේ ගැන මොනතරම් කලකිරීමට පත්වෙලා ඇත්ද? ඉතින් මේ දුක විඳලා තණ්හාව නැති කරගන්න පුළුවන් වෙලා තියෙනවාද? නැහැ නේද? ඒ කියන්නේ දුක විඳලම තණ්හාව නැති කරගන්න බැහැ. තණ්හාව නැති කරගත හැක්කේ අවබෝධයෙන් හා ප්‍රඥාවෙන් පමණයි.

තණ්හාව කියන්නේ ඵලයක්, විඳීම කියලා දෙයක් තිබුණේ නැත්නම් තණ්හාව කියලා දෙයක් හැදෙන්න විදියක් නැහැ. ඒ කියන්නේ එය අස්ථිර දෙයක්. සිතේ උපදින හැඟීමක් විතරයි. මායාවක් වගේ දෙයක් කියලා කියන්නත් පිළිවන්. මෙය සිතට අයිති දෙයක් නොවේ. තණ්හාව ඇති වෙන්නේ අවිද්‍යාවට. හැබැයි මේ සේරම පැටලිලි සිද්ධ වෙන්නේ හිතේම තමයි. මේක ටිකක් සංකීර්ණ තමයි. ඒත් නුවණින් අවබෝධ කරගන්න පුළුවන්. ධර්මයේ පිළිසරණින් අපට මේ සංකීර්ණභාවය තේරුම් ගත හැකියි. ප්‍රඥාව හැර වෙනත් ක්‍රමයක් නැහැ. තණ්හාව නැතිකරගන්න පුහුදුන් මිනිසාට ලේසි නැහැ. නුගක් අමාරුයි. ඒත් කරන්න පිළිවන්.

ධර්ම ගවේෂී



නිදන් සොරුන්ගෙන් රැකගත යුතු මහ රහතුන් වැඩසිටි

පුණ්‍ය භූමි

නාගලකන්ද පුදබිම

පොළොන්නරුව පුරා විදු උරුමයන් අතර මින්නේරියේ නාගලකන්දවද හිමිවනුයේ මුල් තැනකි. පුළුල් පරාසයක් පුරා විසිරී, විහිදී පවතිනුයේ බෞද්ධ විහාර ආරාම සංකීර්ණයක අවශේෂයන්ය. කිනම් රාජ සමයෙක, කවුරුන් විසින් කරවූයේද යන්න නිශ්චිත වශයෙන් හඳුනාගෙන නැතත් නාගලකන්ද පුරා විදු බිම මෙරට පුරාවිද්‍යාඥයන්ගේ අවධානයට යොමුව ඇත්තේ බොහෝ කාලයක පටන්ය.

මෙහි ශේෂව පවතින ආගමික ගොඩනැගිලි, බුද්ධ ප්‍රතිමා ආදිය දෙස විමසුම් ඇසින් බලන ඇතැම් පුරා විදු දැනුමැත්තන්ගේ මතය වී ඇත්තේ මෙය අනුරාධපුර යුගයේ මධ්‍ය කාලයට අයත් විය හැකි බවය. ඒ බවට අනුමාන කරන්නට තිබෙන හේතුසාධක ලෙස ඔවුන් දක්වන්නේ නාගලකන්දේ දැනට ශේෂව පවතින බුද්ධ ප්‍රතිමා සහ බෞද්ධාගමික ගොඩනැගිලිවල අවශේෂයන්හි දක්නට තිබෙන කලාත්මක ශෛලිය සහ නිර්මාණයන් අනුවය. එහි ඉදිකිරීම්වලදී භාවිත කර තිබෙන වාස්තු විද්‍යා ලක්ෂණ බොහෝදුරට පෙර කී අනුරපුර යුගයේ මධ්‍ය කාලයට සමානකම් දක්වන බවද කියති.

නාගලකන්ද පුරාවිද්‍යා බිමේ ඓතිහාසික පසුබිම කුමක් වුවද එය පිහිටි පරිසරයේ එකල පැවැති බෞද්ධ ආගමික දියුණුව මෙන්ම සමාජ ආර්ථික දියුණුවද කදිමට විදහා දක්වයි. යුනෙස්කෝ ශ්‍රී ලංකා සංස්කෘතික ත්‍රිකෝණ යෝජනා ක්‍රමය ආරම්භ වීමෙන් පසුව ඇරඹී පොළොන්නරුවේ ආලාභන පිරිවෙණ ව්‍යාපෘතිය යටතේ 2003 වසරේදී නාගලකන්ද පිළිබඳව මතුපිට පුරාවිද්‍යා ගවේෂණයක් කරනු ලැබීය. එම විධිමත් පුරාවිද්‍යාත්මක ගවේෂණය තුළින් මේ බිම පිළිබඳව බොහෝ තොරතුරු අනාවරණය කර ගැනීමට හැකිවීම විශේෂත්වයකි. එමෙන්ම එහි ඒ වන විට වැනසී සහ වනසා දමා තිබූ පුරාවිදු ස්මාරක රැසක් පිළිබඳ තොරතුරු අනාවරණය කරගැනීමටද හැකි විය.

පොළොන්නරුව හබරණ මහා මාර්ගයේ හබරණ පසුකර පොළොන්නරුව දෙසට පැමිණෙන විට අපට හමුවන බෞද්ධ ආගමික පුරාවස්තු සහිත ප්‍රබලතම භූමිය ලෙස මින්නේරියේ නාගලකන්ද හැඳින්වීම නිවැරදිය.

මිණිහිරි වාපී දියවරින් පෝෂණය වී එහි





දිදුළන නිල්වන් කෙත් යාය දකින විට අදටත් වඩා වැඩි සුවිසල් ජන සමාජයක උරුමය මේ බිමට තිබෙන්නට ඇති බවට සැකයක් නැත.

ධන ධාන්‍යයෙන් පමණක් නොව ආධ්‍යාත්මික ගුණ වශයෙන්ද පොහොසත් ජන සමාජයක් එද පැවැති බවට අප ඉදිරියේ ඇති ජීවමාන සාක්ෂිකරුවා වන්නේද පෙරළා විමසන විට නාගලකන්ද උතුම් පුද බිම්මය. එහෙත් නූතනයේ නාගලකන්ද පුරා විදු උරුමය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ හෝ ජාතික උරුමයන් පිළිබඳ වගකිව යුත්තන්ගේ එතරම් අවධානයක් යොමුව ඇති තැනක් ලෙස පෙනෙන්නට නැත.

රටේ සෙසු පුරාවිද්‍යාත්මක චටිනාකමින් බිමින් සහ බෞද්ධ ස්මාරකවලින් සමන්විත ස්ථානවලට උරුමව තිබෙන තර්ජන මෙම සුවිශේෂී පුදබිමට අත්ව තිබෙන බව කනගාටුවෙන් වුවද පෙන්වා දිය යුතුව තිබේ. විශේෂයෙන්ම නිධන් හොරුන්ගේ ඇල්ම, බැල්ම නාගලකන්නට නොඅඩුව තිබෙන බව පෙනේ.

දැනට ශේෂව පවතින ඉපැරණි දැගැබ සහ අනෙකුත් පරිවාර ස්ථූපයන් අවස්ථා ගණනාවක්ම නිධන් හොරුන්ගේ නිල නොවන කැණීම්වලට බඳුන් වී ඇති බව මනාව පැහැදිලි වන්නකි.

ගරා වැටුණු ඉපැරැණි චෛත්‍යයෙහි ගර්භයද එහි සිව් දිශාවන්ද මේ වන විට විවිධ අවස්ථාවන්හි කැණීම් කොට වනසා තිබේ. ඉතිරිව තිබෙන ගඩොලු බැමි බිමට සමතලා කරන්නට මත්තෙන් මෙහි සංරක්ෂණයක් සිදුවන්නේ නම් එය ඉතාමත්ම කාලෝචිත කාර්යයක් බව අපටද වැටහිණි. නාගලකන්ද ඉපැරැණි පුරා විදු බිමේ ශේෂව පවතින දැගැබ පිළිසකර කරදීමේ කාලීන වුවමනාව එහි විහාරාධිපති නාහිමියන් විසින් මතුකර දෙන්නේද එය මතු පරපුර සඳහා සුරැකිය යුතු බොදු උරුමයක් නිසාද වන්නට ඇත.

කලකට පෙර විශාල ප්‍රදේශයක් පුරා විසිර තිබුණු බව හැඟෙන මේ පුදබිම අද වන විට ඉතා සීමිත බිම් කඩකට කොටුවෙමින් තිබීමද ඉතාමත්ම ශෝචනීය තත්ත්වයකි. පරිසරයේ සුන්දරත්වය රිසි සේ විඳිය හැකි සොබා දහමේ විස්මිත නිමැවුමක් ලෙස හඳුන්වන්නට හැකි තැනෙකි. නාගලකන්ද පුද බිමේ පිහිටි ඉපැරැණි බැලුම්ගල, පෙර රජ දවස පවා ආරක්ෂක කටයුතු සඳහා අවට වටපිටාව නිරීක්ෂණය කරන ලද්දේ මෙහි සිට බැව් ජනප්‍රවාදයන්හි කියැවේ. එහෙත් මෙම සුවිශේෂී කලාපය මේ වන විට සන්නිවේදන සමාගම් කිහිපයක්ම සංඥ කුළුණු ඉදිකොට පවත්වාගෙන යන පුරාණ බ්‍රක්තියට සවි වී ඇත. එපමණකුදු නොව ප්‍රදේශයේ සිදුවන නොයෙකුත් ආකාරයේ ඉඩම් ආක්‍රමණ ක්‍රියාදාමයන්ට මෙම පින්බිමද ගොදුරු වී ඇත්තේ වරින් වර දේශපාලන බලයන්ද මුසුවෙමිනි.

නාගලකන්ද උතුම් පුද බිමෙන් සඳහම් සුවඳ විහිදුවන්නට වෙර දරනුයේ මෙවන් අපමණ බාධක කම්කටොළු රැසක්ද සමගිනි.

මින්නේරිය වැව පාමුලින් මතුව අහසට නැගුණු ගිරි බිබරය, නාගලකන්ද ඉපැරැණි පුදබිම තුළින් පෙර පැවැති බෞද්ධ ආගමික පුනරුදය යළි ඇති කොට ජන ජීවිත තුළ ගුණ දහම් අස්වද්දන පරිසරයක් නිර්මාණය කිරීම අප සැම තුළ ඇති විය යුතු ප්‍රාර්ථනයකි.

කරුණාරත්න ගමගේ



සුදුස්සාට දුන් එක දන් වේලෙන් මෙලොවදීම මහත්ඵල ලැබූ දුප්පත් ගොවියා

ඒ කැමි මිනිස්සු උස්පක්ෂය. ඇතැම්විට සොහොසත්ය. ඇතැම් කාල දුර්භික්ෂය. ඇතැම් කාල සොභාසම්පන්නයෙන් ආඪ්‍යය. එක් දුර්භික්ෂ අවධියක අපේ රටේ අනුරාධපුර ප්‍රදේශයේ ගොවියෙක් දුප්පත් වූයේ දියණියද සමග ගඩොල් කැපීමෙන් දිවි ගෙවීය. ඊටත් විටට අපහසුම වූ තැන දියණිය උකසට තබා කහවනු අටක් ලබාගෙන කුඩා භූමි භාගයක් මිලයට ගෙන ගඩොල් සාදනුයේ අඩුරුවු හතක් යන වූ කළ කහවනු අටක් ඉසිරි කරගත නැකි විය. එහිදී දියණිය උකසින් ගෙදරාගනු පිණිස කරත්ත සමූහයක් සමග පයින් ගමන් කරන කල පෙර නමින් හඳුනන ස්වාමීන් වහන්සේ නමක් දිටිය. මෙහෙ වූ ප්‍රසාද සිත් පහළ වූයේ ස්වාමීන් වහන්සේට දන් දීමෙහි අදහසින් කුසල් දෙමිදයි සොයන්නට විය. එහිදී ගොවියකු වෙත වරකට පමණක් පැහෙන ආහාරයක් දක්නට ලැබුණි.

කහවනුවකට එය ඉල්ලූ නමුත් තොලැබුණි. කහවනු අටක් දක්වා ගෙන දෙන ලෙස ඉල්ලූ කල එකඟව ලැබිණි. දුගී ගොවියා එය ස්වාමීන් වහන්සේට පිළිගන්වා ආහාර ලබාගත් අනුරුද්ධ ස්වාමීන් වහන්සේට කැඳෑදිලි කර දුන්නේය. හැඳ සිටි වස්ත්‍රයද පිදීය.

ස්වාමීන් වහන්සේ "මොනු කහවණු අටක් දී ආහාර ගෙන එයද, වස්ත්‍රයද පිදූ අතර එය කළේ දියණිය නිදහස් කර ගැනීම පසෙක ලමිනි. ඔහු කළේ අතිශය වටිනා ක්‍රියාවකි. තමනට ඇති අහනක් කටයුතු පසෙකලා දානයක් දුන්නේ දානයෙහිම සිත ඇත්තෙකි. මෙබඳු ආහාරයක් අනුභව කළ යුත්තේ විසිරහිත පුද්ගලයෙකු විසින්ම පමණි. සරාගී මා විසින් වැළඳීම නොඇලයෙයි. මේ ආහාරය වැළඳීම කළ යුත්තේ බුද්ධ පුතුයෙක් වෙමිනි" යි කල්පනා කරමින් විදර්ශනා වඩා අර්හත් බව ලදහ.

ඉිල අය නොදක්නා සංසාර සාගරයෙහි පෘථග්ජන මනුෂ්‍යයා අනන්ත අප්‍රමාණ දුක් විඳින්නේය. ඒ දුක මුළමණින්ම මා විසින් අවසන් කැරිණි. නිරයෙහි සැදුම් පෙදුම් ආදී දුක, වශයෙන් අනෙකා විසින් අල්වා ගෙන කෑම් ආදී මනුෂ්‍යයින් අතර ධනය හීල මුදල් සෙවීම දුක, දෙවිලොව චුතවීමේ දුක ආදී නොයෙක් ලෙසින් වන්නා වූ සියලු දුක් මුළමණින්ම මා විසින් අවසන් කැරිණි. මට මේ උත්තරිතර තත්ත්වය උදාවීමට පදනම වූයේ කුමක්ද? පසුගිය වත්තේ අහිංසක දුප්පත් ගොවියා විසින් දෙන ලද ආහාරයයි. ඔහු මහත් ප්‍රසාද ඉසිනින් දුන් දානය නිසා මම ඉහළම සැපතට පත්වුවෙමි. අර්හත් වූ මා විසින් ඒ දුප්පත් ගොවියා අමතක නොකළ යුතුය. ඔහුටද පිහිටක් විය යුතුය. මම එසේ කරමි." යනාදී සිතිවිල්ලෙන් විය.

අර්හත් සුව විදි මේ රහතන් වහන්සේද සියල්ල අනිත්‍යය යන්න පසක් කරලමින් පිරිනිවන් පෑමේ අවස්ථාව උදාවිය. දුගී ගොවියාට යම් ලාභයක් අත්පත් කරදෙන අදහසින් මා පිරිනිවන් පෑ කළ "මගේ දේහය මේ ආහාර දානය දුන් දුගී ගොවියා අත තබන තෙක් නොසැලේවා" යි අධිෂ්ඨානයක පිහිටියහ. ස්වාමීන් වහන්සේගේ පිරිනිවන් පෑම සැළ වූ කෙණෙහි ශ්‍රද්ධා සම්පන්න ජනී ජනයා වැල නොකැඩී ආහ. එවකට රට පාලනය කළ සද්ධාතිස්ස රජතුමාද පිරිස් සමග පැමිණියහ. රජතුමා දේහයට අත තැබුවද තිසිසේත් සෙලවීමක්වත් නොවිය. අනිත් පිරිසද උත්සාහ ගත්තද එලක් නොවිය.

මේ අවස්ථාවේ මේ පරිනිර්වාණය අසා දුගී ගොවියාද පැමිණ සිටියේය. මෙය දේහය හඳුනාගත් දුගී ගොවියා මම පහත් සිතින් බුන්වහන්සේට ආහාර දානයක් කළෙමි. "ඒ මාගේ ආහාර දානය එළඳා මේ ස්වාමීන් වහන්සේ අරහත් බව ලැබ ඇත්නම් ඒ කුසල බල කරලීම පිණිස මෙම දේහය අත කුසට නැගේවා" යි නියා දේහය අතින් ස්පර්ශ කළේය. මහා ප්‍රාතිහාර්යක් ලෙසින් රහතන් වහන්සේගේ ශ්‍රී දේහය අත්ස කුස නැගිණි.

සද්ධාතිස්ස රජතුමා ඇතුළු සියළු පිරිස මහා විස්මයට පත්විය. මෙපෙත් සිසිවෙකුට කළ නොහැකි වූ කාරණය ඔහු අත සඟතවාන් සමග සිදුවීමට හේතු දානගැනීම අවශ්‍ය විය.

තම දුප්පත්කම දියණිය බුදු ගැනීමට කහවනු උපයාගත් ආහාරය ස්වාමීන් වහන්සේට දානය දීම හේතු විස්තර සැවසූ කළ සද්ධාතිස්ස රජතුමා අතිශය ප්‍රමෝටයට පත්ව "ඔබ විසින් සඟරුවනට දානය දීම අතියයින්ම වැදගත්ය. යහපත් පුණ්‍ය තර්මයකි. එම සින් ටෙද අනුමෝදන් කරවන්නැයි පැවසීය.

"සින්වත් රජතුමනි, මා දන් දනයෙන් ලද සින් ඔබ වහන්සේටත්, සියලු අන් සැමටත් අනුමෝදන් කරමි, අනුමෝදන් වේවා. ගුණයෙන් ඉහළ සිල්වත් සිත්මුත් වහන්සේලාට දෙනු ලබන දානය අතියෙන් බලවත් යහපත් විපාකවලට හේතුවන්නේය" යි පවසමින් සියලු පිරිසට පින් අනුමෝදන් කළේය.

රජතුමා තමා රහතන් වහන්සේගේ ශ්‍රී දේහය හැඳහනය කොට හෙම්බෙයේම නැන්පත් කොට දාගැබක්ද නැනවීය. පූජා පැවැත්වීය.

මහත් ශ්‍රද්ධාවෙන් දානය දුන් දුගී ගොවියා මෙම දන වේල නිසා මහත් වූ මෙලොවදීම ලද්දේය. රජතුමා ඔහුට ජනපදයක් ප්‍රදානය කළ අතර ඔටුන්නක්ද, ආභරණද, ස්ත්‍රියක්ද, දසියක්ද, රථවාහනද, ගොවියාට ප්‍රදානය කළ බව සඳහන් වෙයි.

සිරිපාල මාදුවගේ



යටිනුවර ප්‍රධාන සංඝනායක පදවියෙන් පිදුම් ලැබූ ඕවල සෝරත නාහිමි මාර්තු 07 මල්වතු මහා විහාරයේදී ශ්‍රී සන්නස් පත්‍ර ලබති

සයාමෝපාලි මහ නිකායේ මල්වතු මහා විහාර පාර්ශ්වයේ අතිපූජ්‍ය මහානායක තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගල මහානායක මාහිමිපාණන් විසින් යටිනුවර ප්‍රධාන සංඝනායක පදවියට පත්කරනු ලැබූ කඩුගන්නාව කදංගම ඉල්ලදෙර පුරාණ පොත්ගුල් විහාරාධිපති, විශ්‍රාමික නියෝජ්‍ය විදුහල්පති, අධ්‍යාපනවේදී, ශාස්ත්‍රපති, ආරණ්‍ය වංශික සංඝකීර්ති ශ්‍රී සරණංකර සීලානන්ද ධම්මරක්ඛිතාභිධාන ඕවල සෝරත නාහිමිපාණන් වෙත ශ්‍රී සන්නස් පත්‍ර ප්‍රදානය කිරීමේ උත්සවය මාර්තු මස හත්වෙනි (07) සිකුරාදා සවස 3.00ට මල්වතු මහා විහාරයේ ඓතිහාසික මංගල උපෝසථාගාරයේදී පැවැත්වේ.

අභිනව සංඝනායක හිමිපාණන් වහන්සේ පසුදින එනම් මාර්තු මස 8 වෙනිදා සවස 4 .00ට පිළිගැනීමේ සම්භාවනීය උත්සවයක්, ඉල්ලදෙර පුරාණ පොත් ගුල් විහාරයේදී පැවැත්වෙන අතර සවස 1.30 ට මහ පෙරහැරකින් කොටබෝගොඩ විහාරයේ සිට නාහිමි වැඩමවාගෙන යනු ඇත.

කේ. බණ්ඩාරනායක

බොදු පුවත්

ඕස්ට්‍රේලියාවේ ප්‍රධාන සංඝනායක පදවිය ලැබූ

රාජකීය පණ්ඩිත පූජ්‍ය මීගහකුඹුරේ ධම්මගවේසී නාහිමිපාණෝ එරට සිටින

නිල නොලත් ශ්‍රී ලංකාවේ තානාපතිවරයායි

ඕස්ට්‍රේලියාවේ සිඩ්නි නුවර ශ්‍රී ලංකාරාම විහාරාධිපති, ඉංග්‍රීරිය මඩකඩ ආරණ්‍ය සේනාසනයේ සහ එම සෙනසුනට අනුබද්ධ නාවින්නේ ශ්‍රී ජයතුංග යෝගාශ්‍රමයේ රාජකීය පණ්ඩිත පූජ්‍ය මීගහකුඹුරේ ධම්මගවේසී හිමිපාණන්ගේ අසමසමවූත්, දීර්ඝවූත් ශාසනික මෙහෙවර, බුද්ධා සම්පන්න බව, අධිෂ්ඨාන ශක්තිය, නොනස්නා කැපවීම සහ අප්‍රතිහත ධෛර්යය ගැන ඉමහත් සතුටටත්, පැහැදීමටත් පත් සිරිලක ඓතිහාසික මහාවිහාර පරපුරෙන් පැවත එන සියම් මහා නිකායේ මල්වතු පාර්ශවයේ මහානායක ධුරන්දර අතිපූජ්‍ය තිබ්බොටුවාවේ ශ්‍රී සුමංගලාභිදාන නාහිමිපාණන් වහන්සේ ප්‍රමුඛ තාරක සංඝ සභාව විසින් උන්වහන්සේ වෙත සද්ධර්ම කීර්ති ශ්‍රී මංගල යන ගෞරව නාම සම්මතිය සහිතව සමස්ත ඕස්ට්‍රේලියාවේ සියම් මහා නිකායේ මල්වතු පාර්ශවයේ ප්‍රධාන සංඝනායක පදවිය පිරිනැමීම නිමිත්තෙන් පැවැත්වෙන මෙම උපහාර උත්සවයට නාවින්නේ ශ්‍රී ජයතුංග යෝගාශ්‍රමයේ නිර්මාතෘ වූ අභාවප්‍රාප්ත පොතුවිල ආරච්චිගේ එමලින් පීරිස් ජයතුංග විජයදාස මැතිණිය, එච්. ජී. විජයදාස මැතිතුමා සහ එම පවුල වෙනුවෙන් මටත් නිමල්කා විජයදාස මහත්මියටත්, මාගේ බාල සොහොයුරු වරලත් ගණකාධිකාරී නිමල් විජයදාස මහතාටත්, වජිරා විජයදාස මහත්මියටත් සහභාගිවීමට අවස්ථාව ලැබීම මහත් භාග්‍යයක් ලෙසත්, දෛවෝපගත සිදුවීමක් ලෙසත් අපි සලකමු.

ඕස්ට්‍රේලියාවේ අභිනව ප්‍රධාන සංඝනායක, අපේ මීගහකුඹුරේ ධම්මගවේසී ස්වාමීන්වහන්සේ 1981 පෙබරවාරි මස 09 වැනිදා ඉංග්‍රීරිය මඩකඩ ආරණ්‍ය සේනාසනාධිපති අතිපූජ්‍ය අම්පිටියේ මංගල අනුනායක ස්වාමීන් වහන්සේගේ ආචාර්යත්වයෙන් ප්‍රවජ්‍යා භූමියට ඇතුළත් වූ අතර 1982 ජූනි මස 07 වෙනිදා මල්වතු මහාවිහාරික උපෝසථාගාරයේදී උපසම්පදාව ලැබීය. අපේ අභිනව සංඝනායක නාහිමියන් සහ නාවින්නේ ශ්‍රී ජයතුංග යෝගාශ්‍රමයත් එහි ප්‍රධාන දායකයන් වූ අප පවුලත් අතර ගෞරව සම්ප්‍රයුක්ත, එමෙන්ම සදාදරණීය සම්බන්ධය අවුරුදු 26 ක් ඇතට එනම් 1987 දක්වා දිව යයි. ඒ අවදියේ උන්වහන්සේ ඉංග්‍රීරිය මඩකඩ ආරණ්‍යයේ වැඩවසමින් සිය ගුරු දේවයන් වෙතින් මූලික අධ්‍යාපනය සහ භික්ෂු පුහුණුව ලබමින් සිටියහ. ඒ වන විට මගේ මැණියන් විසින් නාවින්නේ ඇයට අයත්ව තිබුණු මෙම ඉඩම මඩකඩ ආරණ්‍ය සේනාසනයේ ශාඛාවක් පිහිටුවීම පිණිස සහ සතුතර පූජා කළ අතර ඇයගේ මහත් පරිශ්‍රමයෙන් කුටි දෙකකින් යුක්තව ප්‍රථම ආවාස ගෘහය ඉදිවෙමින් පැවතිණ. අද ශ්‍රී ජයතුංග යෝගාශ්‍රමය යන නමින් හැඳින්වෙන මගේ සොහොයුරු නිමල් විජයදාස මහතාගේත්, එම මහත්මියගේත් ප්‍රධාන දායකත්වයෙන් දැරැබී. මහබෝ, පිළිම ආදී සකලාංගයන්ගෙන් සම්පූර්ණ ඉතාමත් අලංකාර විහාරස්ථානයක් ලෙස පවත්වාගෙන යනු ලබන එදා එනම් 1988 ඉදිකළ නව කුටි දෙකේ ආවාසයේ ප්‍රථම වස් කාලය ගත කිරීමේ ගෞරවය මෙන්ම භාග්‍යය හිමිවූයේ මගේ මැණියන්ගේ ආරාධනාවෙන් අප අභිනව සංඝනායක පූජ්‍ය මීගහකුඹුරේ ධම්මගවේසී ස්වාමීන් වහන්සේට සහ උන්වහන්සේගේ ගුරු දේවයාණන් වන මඩකඩ ආරණ්‍ය සේනාසනාධිපති අතිපූජ්‍ය අම්පිටියේ මංගල අනුනායක ස්වාමීන්වහන්සේටය.

කෙසේ වුවද එකී 1988 වස්කාලය මගේ මැණියන්ට මහත් අභියෝගයක් වූයේ ඒ වන විට ජනතා විමුක්ති පෙරමුණ විසින් දියත් කර තිබුණ දරුන්ත හිංසනය සහ භීෂණය නිසාය. මෙම අභියෝගයට ඥානාන්විතව මුහුණ දුන් මගේ මව අපගේ නිවසේ කලක් ගත සේවිකාවක් ලෙස කටයුතු කළ කාන්තාවකට ඇය විසින් පදිංචිය සඳහා ලබා දී තිබුණු මෙම යෝගාශ්‍රමයට යාබද නිවසේ උස් පහත් භේදයකින් තොරව මගේ බාල නංගී සමග නවාතැන් ගෙන වස් කාලය



අවසන් වන තෙක්ම එම නිවසේම දානය පිළියෙල කර ස්වාමීන්වහන්සේලාට පිරිනැමුවාය.

කධින පිංකම අවසානයේ උන්වහන්සේ නැවතත් හුණුපිටියේ ගංගාරාම විහාරස්ථාන පිරිවෙනට ඇතුළත්ව භාෂා ශාස්ත්‍ර සහ ධර්ම විනය මැනවින් හදාරා උසස් අධ්‍යාපනය සඳහා මහරගම ශ්‍රී වජිරඥාන ධර්මායතනයට ඇතුළත් වූහ. එහිදී අතිපූජ්‍ය මඩිහේ පඤ්ඤසීහ මහානායක හිමියන්ගේ සහ පූජ්‍ය අම්පිටියේ රාහුල හිමියන්ගේ මාර්ගෝපදේශකත්වය යටතේ සිංහල, පාලි, සංස්කෘත හා ඉංග්‍රීසි භාෂාවන්ද, ක්‍රිපිටක ධර්මය සහ බෞද්ධ දර්ශනයද ගැඹුරින් හදාරා ප්‍රාචීන, ප්‍රාරම්භ, මධ්‍ය සහ අවසාන පරීක්ෂණවලින් විශිෂ්ට සාමාර්ථ ලබා රාජකීය පණ්ඩිත විනයාචාර්ය සහ සද්ධර්මාචාර්ය යන උපාධි හිමි කරගත්හ.

උන්වහන්සේ 1981 දී එනම් වයස 19 දී , මහණ වූයේ තමන්ගේම වුවමනාවටය. අන් අයගේ බලකිරීම්, ඇවටිලි කිරීම් නිසා නොවේ. උසස් පෙළ දක්වා හැදෑරීමෙන් අනතුරුවය. උන්වහන්සේ සෑම විභාගයක්ම, කඩඉමක්ම පහසුවෙන් සහ විශිෂ්ට ලෙස ජයග්‍රහණය කළහ, බොහෝ තරුණ භික්ෂූන් වහන්සේලා මෙන් විශ්වවිද්‍යාල උපාධියක් ලබා ගුරු වෘත්තියට හෝ රජයේ රැකියාවකට අවතීර්ණ වීම උන්වහන්සේට අවශ්‍ය වූයේ නැත. සිය අධ්‍යාපන කටයුතු සාර්ථකව නිම කිරීමෙන් පසු උන්වහන්සේ ධර්ම ප්‍රචාරක කටයුතුවල නිරත වීමට තීරණය කළහ.

හිටපු ජනාධිපති ලේකම් කේ. එච්. ජේ. විජයදාස

"යම් කෙනෙකුගේ සිත දිවා රෑ දෙකේ අභිංසාවෙහි ඇඹේද ඒ ගෝතම ශ්‍රාවකයෝ හැමදම සුවසේ නිදා පුබුදින්."

සදහම් ප්‍රහේලිකා අංක - 74

ජයග්‍රාහී වාසනාවන්තයින් තිරගතකිරීමට දායකවීමේ ජයග්‍රහණය ලබා ගැනීමට අදම ඇමතුම් දෙන්න...
දුරකථනය - 011-2695773

උපදෙස් :

1. මෙය නිවැරදිව හා අනා පැහැදිලිව පුරවා කැපැල් පනක අලවා පහත සඳහන් ලිපිනයට එවිය යුතුය.
2. ප්‍රහේලිකා අංක 72, දයාවංශ ජයකොඩ සහ සමාගම, 112, පූජ්‍ය එස්. ගිරින්ද හිමි මාවත, කොළඹ 10.
3. පිළිතුරු කැපැල් පත් එවිය යුතු අවසන් දිනය මාර්තු මස 10 වෙනිදය.
4. ජයග්‍රාහකයින් තේරීමේ අවසන් තීරණය ප්‍රධාන සංස්කාරක සතුවේ.
5. ප්‍රහේලිකාවේ අපැහැදිලි තැනක් වේ නම් 071-3391013 දුරකතන්න.
6. ඔබේ ඉල්ලීම පරිදි නිවැරදි පිළිතුරු මෙවර කලාපයේ සිට පළවේ.



▶ හරහට

1. විස්මිත බැලුම්වලින් එකකි.
3. සිදුහත් කුමරු උපත ලද සල් උයන.
5. මෙය මිනිසා පසුපස එන්නකි.
6. මිහිකනට යෙදෙන සමාන පදයකි.
10. වියළි කලාපයේ දක්නට ඇති ප්‍රධාන වෘක්ෂයකි.
13. බුදුන් වහන්සේගේ මෙම ධාතූන් වහන්සේලාද නිධන් ගත කොට තැනූ දගැබ සිංහල.
15. නීතිරූ යන්නට කියන වචනයකි.

▼ පහළට

2. එතුර්වේදයටත් අයත්ය.
4. එක් පුර පසළොස් පොහොයකි.
5. දුනට උරුම දෙයකි.
6. බුද්ධකාලීන සමාජයේ මෙවැදූ සිටුවරුද සිටියහ.
7. මිහිරි පලතුරකි.
8. එදවස ඉන්දියාවේ සිහිටි සුදුකට ගංගාවකි.
10. ප්‍රසිද්ධ යන අරුත ගෙන දෙයි.
11. ත්‍රිවිධ නණ්ඩාවලින් එකකි.
12. සොළොස්මස්ථානවලට අයත් වෙනයකි.
14. අවලෝ දහමට අයත්ය.

ඔබත් දළදා වරුණට ලියන්න

දළදිදු වරුණ සෑම විටම ඔබේ අදහස් උදෙසා විවෘත පුවත් සඟරාවකි. එසේ අපෙකට ආසන්න කාලයක් සිස්සේ "දළදා වරුණ" සඟයින් ප්‍රවිණ ලේඛක මඩුල්ලක් බැඳී සිටින අතර ඔහි පැවිදි ඕනෑම අයෙකු අප වෙත ලබා දෙන කාලීන කරුවක් සහ සමාජයට ප්‍රයෝජනවත් වේ යැයි සිතන දහම් ලිපි සඳහාද ඉඩ කඩ ලබා දීමට අප නිරතුරු සැලකිලිමත් වන්නෙමු. එහිදී දළදා වරුණ සුවිශේෂයේ පළවන සියලුම ලිපි, රචනා ඒ.ඒ. කර්තෘවරුන්ගේ අදහස් මිස දළදා මාලිගාවේ හෝ එහි සංස්කාරකවරුන්ගේ අදහස් නොවන බවද සිහිපත් කරනු කැමැත්තෙමු. තනි පිටුවේ පැහැදිලි අක්ෂරවින් ලියන ලද හෝ යතුරු ලියනය කළ ඔබේ බෞද්ධ ලිපිය පහත ලිපිනය වෙත යොමු කළ යුතුය. සෑම ලිපියක්ම බෞද්ධ තේමාවක් ඔස්සේ පිටු 2 කට නොවැඩි වන සේ ලිවිය යුතු බවද සලකන්න.

සංස්කාරක
"දළදා වරුණ" මාධ්‍ය අංශය
ශ්‍රී දළදා මාලිගය, මහනුවර

● අන්තර්ජාලයෙන් පසුගිය "දළදා වරුණ" කියවන්න
www.sridaladamaligawa.lk වෙබ් අඩවියට පිවිසෙන්න

ප්‍රහේලිකා අංක 71 ජයග්‍රහණය කළ වාසනාවන්තයෝ

- ඉදිපා උක්වත්ත, 354/1, අරමඩ, හෙළිඹිය.
- සුමිවා ඉලන්තෝන්, 29/11, ධර්මාශෝක මාවත, අරුප්පල, මහනුවර.
- ආර්. එච්. බී. සෙනෙවිරත්න, 50/21, අරුප්පල පාර, මහනුවර.

දළදා මාලිගයෙන් පණිවුඩයක්

● මේ සටහන සිහියෙන්, සැලකිල්ලෙන් කියවන්න

1. ඔබගේ සංචර ඇඳුම ඔබේ හැදියාවේ සංකේතයයි.
2. ඔබගේ සංචර ඇඳුම මේ පින්බිම රමණීය කරයි.
3. ඔබගේ සංචරශීලී භාවය මේ පින්බිමට සෝභාවකි. එය ඔබට හොරවෙයි.
4. දළදා සමිඳු වැඩ සිටින උතුම් පින්බිමට එනවිට ඔබ සැරසී සිටින ඇඳුම් උසිතදැයි සිතියෙන් සිතන්න.
5. ශ්‍රී දළදා මාලිගා පරිශ්‍රයට කොට කලිසම් (සිරිමි, හැඳුනු දෙප. විසම) පලාඳු සායවල්, අත් නැති/කොට හැට්ට, දණහිසෙන් ඉහලට වන සේ කොට වූ සායවල්, ඇඳ පසු පෙදෙස නිරාවරණය වන සේ වූ ඇඳුම් යනාදියෙන් සැරසී එමෙන් වළකින්න.
6. ඔබ දළදා මාලිගාවට පැමිණෙන විට වාහි ලා හාට ඇඳුමෙන් සැරසෙන්න.
7. නද හාට (කළු) ඇඳුම් පින් භීමට නොහොඹින බව මතකයි ගන්න.
8. ඇඳුම් ඔබේ වයිකය කියාපාන කැඩපතක් බව සිතන්න.
9. දළදා මාලිගාව පින් බිමක් මිස පෙම්වතුන්ගේ පාරාදීසයක් නොවන බව සිහියට ගන්න.
10. ඔබට පැන්නේ දෙආසක් වුවද සෙ වටා ඇස් දහසක් ඇති බව මෙනෙහි කරන්න.

ඔබ හැසිරිය යුත්තේ හැකිමුලටා වහල් වී නොව බුද්ධිමත්වය. මෙම කරුණු අප ඔබ වෙත ඉදිරිපත් කළේ කරුණාවෙන් බවත්, රට හාර ගන්නට සිටින මහු පරපුරට ඔබගේ ආදරයත් ලබාදීමට බවත් සිහිකරනු කැමැත්තෙමු.

"ධර්ම දානය සියලු දානයන්ට වඩා ශ්‍රේෂ්ඨයි."

මෙම පුදබිම කුමක්දැයි නම්කර වටිනා ත්‍යාගයක් හිමිකර ගන්න

මෙහි පහත දක්වෙන්නේ පුරාවිද්‍යා වටිනාකමක් ඇති, ශ්‍රී ලංකාවේ විහිටි වටිනා පුදබිමකි. එය කුමක්දැයි නම් කොට පිළිතුර තැපැල් පතක අලවා පහත සඳහන් ලිපිනයට එවන්න. එහි ඔබේ නම හා ලිපිනයද සඳහන් කරන්න. ඔබේ පිළිතුර එවිය යුත්තේ, සංස්කාරක, දළදා වරුණ, දළදා මාලිගය, මාධ්‍ය ඒකකය, මහනුවර යන ලිපිනයටයි.

(නිවැරදි පිළිතුර එවනු ලබන ජයග්‍රාහී වාසනාවන්තයාට දර්ශනීය ශ්‍රී දළදා පෙරහර සහිත රාමු කරන ලද වටිනා තිළිණයක් පරිත්‍යාග කෙරේ. මෙම වටිනා ත්‍යාගය පිරිනැමීම සඳහා අනුග්‍රහය දක්වන්නේ ප්‍රකට විද්‍යා ලේඛකයකු වන අනුර සී. පෙරේරා මහතා විසිනි. එතුමාගේ ආදරණීය මැණියන් වන වාර්ලට් බෙහරගම මහත්මියට හා ලෝ වැසි සියලු දෙනාටම සෙත්පතා මෙම ත්‍යාගය පිරිනැමේ.)





පසුගිය මාසයේ 'පුදබිම' නිවැරදිව නම්කොට ජයග්‍රහණය ලැබූ වාසනාවන්තයා

එස්. විල්ලරආරච්චි,
සිසිලු, නුවරපාර, වරකාපොළ

(ඔබේ ත්‍යාගය ලබා ගැනීම සඳහා හැඳුනුම්පත සමග ශ්‍රී දළදා මාලිගාවේ මාධ්‍ය විශේෂ ව්‍යාපෘති කාර්යාලය වෙත පැමිණෙන්න)

පසුගිය මාසයේ පැණයට පිළිතුර : තුපාරාමය

අති පූජ්‍ය ගලගම ධම්මසිද්ධි ශ්‍රී ධම්මානන්ද අර්ථදස්සි අනුනාහිමිපාණෝ 94 වැනි වියට එළඹෙති



සිය උදර ශාසනික මෙහෙවර සම්බුද්ධශාසනය වෙනුවෙන් කැපකළ මහා සංඝ පීතාවරයන් වහන්සේලා අතර මහා විහාර වංශික ශ්‍යාමෝපාලි මහ නිකායේ අස්ගිරිය මහා විහාර පාර්ශ්වයේ අනුනායක පරපුරේ නවවෙනි අනුනායක පදවිය හොබවන, ඓතිහාසික මහියංගන රජමහා විහාරාධිපති, ගලගම ධම්මසිද්ධි ශ්‍රී ධම්මානන්ද අර්ථදස්සි නාහිමිපාණන් වහන්සේට හිමිවන්නේ අද්විතීය ස්ථානයකි. ශාසනික මෙන්ම ගරුතර මහා සංඝරත්නයේ පැවැත්ම වෙනුවෙන් දිවි කැප කළ ගලගම අර්ථදස්සි අනුනායක හිමිපාණන් වහන්සේ මේ අන්දමින් රටට ජාතියට, මහා සංඝ පරපුර වෙනුවෙන් ඉටුකරන උදර ශාසනික ජීවිතයට අනුභාතර (94) වසරක් පිරීම නිමිත්තෙන් අනුනායක හිමිපාණන්ට දිසාසිරි ප්‍රාර්ථනා කිරීමේ ආගමික හා සමාජ සත්කාර වැඩසටහන් මාලාවක් ජනවාරි 11ද මහියංගන රජමහ විහාරයේ දී අස්ගිරිය මහා විහාර පාර්ශ්වයේ අතිපූජ්‍ය මහානායක උඩුගම ශ්‍රී රතනපාල බුද්ධරක්ඛිත මාහිමිපාණන් වහන්සේ ප්‍රධාන සම්භාවනීය ගිහි - පැවිදි උතුමන්ලාගේ සහභාගිත්වයෙන් හා අනුනායක හිමිපාණන්ගේ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය රත්නය වන අස්ගිරිය මහා විහාර කාරක සංඝ සභාවේ සහිත, වත්මන් මහියංගන රජමහා විහාරයේ භාරකාර, රාජකීය පණ්ඩිත උරුලෑවත්තේ ධම්මරක්ඛිත හිමිගේ මූලිකත්වයෙන් පැවැත්විණි.

මාතලේ උරුලෑවත්ත රජමහ විහාරය, අලව්ව හුම්බුළුව රජමහ විහාරය, මැටියගනේ රජමහ විහාරය, අස්ගිරිය උරුලෑවත්ත විහාර පන්සල යන ස්ථානයන්හි වත්මන් ශාසනික ප්‍රබෝධයටත්, විහාරස්ථ දහම් පාසැල් අධ්‍යාපනයටත්, අස්ගිරිය මහා විහාරයේ වත්මන් ශාසනික හා මහා සංඝ පරපුරේ හා මහියංගන රජමහ විහාරයේ ආචාර්යමත් දියුණුවටත්, ආගමික ප්‍රබෝධයටත් අතිපූජ්‍ය ගලගම අර්ථදස්සි අනුනායක හිමිපාණන්ගෙන් සිදුවී තිබෙන සේවය ශ්‍රේෂ්ඨත්වයෙන් සැලකේ.

මාතලේ ධර්මරාජ, කවටයංමුණ පිරිවෙන්හි ධර්මාචාර්ය වශයෙන් කලක් පිරිවෙන් අධ්‍යාපනය වෙනුවෙන්ද, ශ්‍රී දළදා මාලිගාවේ ශ්‍රී දළදා සමිඳු තේවාව බාර නාහිමි ලෙසද, අවස්ථා කිහිපයකදී කටයුතු කර ඇති ගලගම අර්ථදස්සි අනුනායක හිමියෝ ශ්‍රී දළදා මාලිගාවේ කධින පුජෝත්සව හා කධිනානිශංස ධර්මදේශනාවන්හිද මූලිකත්වය ගත් ප්‍රකට තෙර නමකි.

කේ. බණ්ඩාරනායක

"ද්වේෂ රහිත වූ යමෙක් බැණීම් ගැහීම් හා වධ බන්ධනත් ඉවසාද, ඉවසීම බලය කොටත් බල ඇණිය කොටත් ගත් බහු උත්තමයෙකි."



බුදුන් වහන්සේ නිදහස විග්‍රහ කළ හැටි



බුදුරජාණන් වහන්සේගේ නිදහස සංකල්පය ගැන සිතීමේදී උන්වහන්සේගේ ධර්ම කාර්ය (ශාසනික කාර්ය) නිදහස පොදුවේ - සෑම සත්වයකුටම ලබාදීම අරමුණු කර ගන්නක් ලෙස හුවා දක්වන්න පුළුවන්.

"බුද්ධෝ හං බෝධ ඉස්සමි
මුත්තෝ හං මෝචයේ පරේ
නිතහෝ හං භාර ඉස්සාමි
සාරසෝසා මහා හයා."

ඉහත ගාථාවෙන් බුදුන් වහන්සේ මූලික වශයෙන් නිදහස පිළිබඳව වදාළ බව පෙනෙන්නට තිබෙනවා. ඒ අනුව "මම චතුරාර්ය සත්‍යය අවබෝධ කොට අන් අයට එය අවබෝධ කරවමි, මම දුකින් නිදහස ලබාගෙන අන් අයටත් නිදහස ලබාදෙමි, මම මේ බියකරු සසර නමැති සැඩ පහරෙන් එතෙර වී අන් අයවත් ඉන් එතෙර කරවමි" යනුවෙන් සත්වයාගේ නිදහස පිළිබඳව වදාළ බව දක්වන්න පුළුවන්. අනෙක් අතට නිදහස යන්න ගැන උන්වහන්සේ පටු තලයකට සීමා නොකොට ඉතාම පුළුල්ව සලකා බලමින් අර්ථ දක්වා තිබෙන ආකාරයක් දක ගන්න පුළුවන්. මෙලොව වසන සියලුම සත්වයන් හටම දුක්ඛ ප්‍රපංචයකට ඇතුළත් වී සිටින කොටසක් නැතිනම් ප්‍රපංචයකට මැදිව දුක් විඳින කොටසක් බව හුවා දක්වා තිබෙනවා. ඒ නිසා සත්වයා දුකට පත්වීමත්, ඉන් මුදවා ගන්නා ආකාරයත් ගැන පැහැදිලි දක්මක් බුදු සමය තුළ වූ බව කිව හැකියි.

මෙලොව උපදින සත්වයන් සියල්ලටම උපදීම දුකකි, වයසට යාම දුකකි, ලෙඩවීම දුකකි, මරණයට පත්වීම දුකකි, අප්‍රියයන් හා එක්වීම දුකකි, ප්‍රියයන්ගෙන් වෙන්වීම දුකකි.

දුක වටහා දී එයින් මිදෙන මග කියාදීම බුදුන් වහන්සේගේ ශාසනික කාර්යභාරය විය. ඒ අර්ථයෙන් දේශිත මේ සකල බුද්ධ වචනයම නිදහස පිළිබඳව වූ අමා පණිවුඩය ලෙස දක්වීම නිවැරදියි. වර්තමානයේ අප නිදහස ලෙස කල්පනා කරන සංකල්පය අධිරාජ්‍යවාදයෙන් මිදීම වැනි පටු සංකල්පයෙන් වුවත් නිදහස යන්න ඉන් ඔබ්බට යන ගැඹුරු අරුත් නිරුක්ති පිළිබඳව සිතිය යුතු සංකල්පයක් බව අප මතක තබාගත යුතුයි.

බුද්ධ භාෂිතයේ අඩංගු වන මෝක්ෂය, නිරෝධ, විමුක්ති, අසාවක්ඛය යන මේ වචනවලින් ධ්වනිත කරවන අර්ථය වන්නේද නිදහස යන සංකල්පය බව පැවසිය හැකියි. බුදුරජාණන් වහන්සේ උතුම් වූ සම්බෝධියක් ඥානය අවබෝධ කරගත් පසු වදාළ උදාන වාක්‍යය වන පහත ගාථාව නිදහස පිළිබඳව ප්‍රථමයෙන් ප්‍රකාශිත නිදහස් ගීතිකාව ලෙස දක්වීමට පුළුවන.

අනේක ජාති සංසාරං
සන්ධාවිස්සං අනිබ්බිතං
ගහකාරකං ගවේසන්තෝ
දුක්ඛා ජාති පුනප්පුනං

ගහකාරක දිට්ඨෝසි
පුනගේහං නකහසි
සබ්බා තේ ඵ සුකා භග්ගා
ගහකුටං විසංඛිතං
විසඛාරගතං චිත්තං
තන්හා නං ඛයමජ්ඣගා

ඒ ගාථාවේ සිංහල තේරුම මා විසින් මෙලෙස කවියට නගා තිබෙනවා.

ජාති ජාති සංසාරේ
දුක්ඛ තේ සාදන වඩු
සොයා අපද ආයෙමි මම
යළි යළි ඉපදීම දුකකි

තණ්හාවේ වඩුවාණෙනි
නුම දන්නා ලද්දේ වෙති
ඒ ගෙය යළි තනනු බැරිය
කෙලෙස් පරාලද සින්දෙමි
අවිදු කැනි මඩල සින්දෙමි

බුදුරජාණන් වහන්සේ ලැබූ විමුක්ති සුඛය පිළිබඳව විමුක්ති ගීතිකාව මෙහි අන්තර්ගත වන බව දක්විය හැකියි. බුදුරජාණන් වහන්සේ ලැබූ විමුක්තිය හෙවත් නිදහස පිළිබඳ මධුර අත්දැකීම් සමුදායක් ථෙර, ථෙරී ගාථාවල අන්තර්ගතව තිබෙනවා. මෙය වනාහි නිදහස පිළිබඳ වූ සැබෑම කාහල නාදයයි. අනෙක් අතට රාගයෙන් වෙන් වී විරාගී වීම, ද්වේෂයෙන් වෙන් වී මෛත්‍රී සහගත වීම, මෝහයෙන් දුරු වී ප්‍රඥා සම්පන්න වීම, මාන මදදියෙන් වෙන් වී නිහතමාන නිම්මද භාවයට පත්වීම මේ නිදහස යන්නේ සැබෑ අරුත ලෙස ගොනුකර දැක්වීම අතිශය වැදගත් වෙනවා. සමකාලීන භාරතීය සමාජයේ සංස්කෘතික පරිසරය අනුව අන්‍ය ආගමික සංස්ථාවක නිදහස පිළිබඳ වූ මෙබඳු උරුමයක් අපට කතා කළ නොහැකිය. බ්‍රහ්ම, හින්දු, උපනිෂද් ඉගැන්වීම්වල පමණක් නොව අනෙකුත් සියලුම දේවවාදී ඉගැන්වීම්වල අනුගාමිකයන්ට ස්වකීය ආගම ගැන විමසීමට අයිතියක් අවසරයක් දී නොමැත. නමුත් බුදු සමයේ ඒ සිතීමේ, විමසීමේ නිදහස මුළුමනින්ම අනුගාමික පිරිසට පවරා දී ඇත. එය බුද්ධ ධර්මයේ පවතින සුවිශේෂී තත්ත්වයකි. දේව රහස්, ගුරු මුෂ්ටි, කිසිවත් මේ ශාසනය තුළ නොමැත. මේ ධර්මය එහි පස්සිකය, එහි අදහස නම්, "එන්න බලන්න" යන්න මිසක් ඇවිත් විශ්වාස කරන්න යන්න නොවේ. "පටවිච්චං වේදී තබ්බෝ විඤ්ඤෝ හේති" යනුවෙන් බුදුන් වහන්සේ වදාළේ මේ ධර්මය නුවණැත්තං විසින් තම තම ඥාන පමණින් අවබෝධ කරගත යුතු බවයි. බුදු සමය තුළ පවතින නිදහසට විකෘත භාවයට මේ නිදසුනම ප්‍රමාණවත්ය. මෙහිදී විශේෂයෙන් සැලකිය යුතු සුත්‍ර දේශනාවක් වන "කාලාම සූත්‍රයෙහි" බුදු පියාණන් වහන්සේ අපට නිදහස් ලෙස දහම විමසන්නට ලබාදුන් අනුබලය සුවිශේෂී වේ.

බුදුරජාණන් වහන්සේ හැමවිටම සූත්‍ර ධර්මවල තමාගේ ධර්මය නුවණින් විමසා බලා කටයුතු කරන්නට සිය ශ්‍රාවකයන්ට අවසර දී තිබෙනවා. විමංසක වැනි සූත්‍ර දේශනාවල කථාගතයන් වහන්සේ තමන්ව පවා ශ්‍රාවක ශ්‍රාවිතාවන්ට විමසන්නට අවස්ථාව සලසා දී තිබීමෙන් මෙය මනාව තහවුරු වේ. ලොව්තුරා බුදු පියාණන් වහන්සේගේ උතුම් වූ සද්ධර්මය රහස්‍ය, ගුඪ දේව භාෂිතයක් ලෙස නොව විශිෂ්ට වූ මානව ප්‍රකාශනයක් ලෙස ක්‍රියාත්මක වන බව මේ කරුණුවලින් අපට අනාවරණය කරගත හැකි වෙනවා.

අමරපුර ශ්‍රී ධර්ම රක්ෂිත නිකායේ පූජ්‍ය ත්‍රිකුණාමලයේ
ආනන්ද අභිතව මහනාහිමි



චීන ජාතික ෆාහියැං භික්ෂූන් වහන්සේ දුටු ශ්‍රී දන්තධාතු ප්‍රදර්ශනය

බුදුන්වහන්සේගේ වම් දළද වහන්සේ ක්‍රි.ව. සිව්වැනි සියවසේදී කාලිංග කුමරෙකු හා කුමරියක විසින් ලංකාවට ගෙන එනු ලැබීමෙන් පසු පළමුවෙන්ම තැන්පත් කරනු ලැබුයේ මහාමේඝ විහාරයේ බව පුරාවෘත්තයන්හි සඳහන්ය. එකොළොස් වන සියවසේ දී ඇති වූ ව්‍යසනයෙන් පසු පොළොන්නරුව අගනුවර බවට පත් වූ අතර, ශ්‍රී දන්තධාතුන් වහන්සේද එහි වැඩම කරවනු ලැබීය. මෙම මහඟු පුරාවස්තුව රජු විසින් ඉතා සුරක්ෂිතව අභයගිරි විහාරයෙහි තැන්පත් කරනු ලැබ ඇත.

ශ්‍රී දන්ත ධාතුන් වහන්සේ සියැසින් දක වැඳ පුද ගැනීමට ලැබීම බෞද්ධයාට කවදත් බුද්ධාලම්භන ප්‍රීතියක් ගෙන දෙනු ලැබ ඇත. ඒ අනුව දන්ත ධාතුන් වහන්සේ මෙහි වැඩම කිරීමෙන් පසු ජනතාවට දක ගැනීම සඳහා විටින් විට ප්‍රදර්ශනය කිරීම සම්ප්‍රදායක් විය.

බෞද්ධ තොරතුරු ගවේෂණයක හා වන්දනාවේ යෙදී සිටි චීන ජාතික ෆාහියැං භික්ෂූන් වහන්සේ ඉන්දියාවේ සංචාරයකින් පසු මහානාම රජ කාලේ (ක්‍රි.ව. 412) අනුරාධපුරයට පැමිණ බෞද්ධ පෙළ පොත් පරිවර්තනය කිරීමේ යෙදුණු බව අපි අසා ඇත්තෙමු. ඒ කාලයේද දන්ත ධාතුන් වහන්සේ වාර්ෂිකව ප්‍රදර්ශනය කරනු ලැබ ඇති අතර, එසේ කිරීම තුළින් වැසි දිය ලැබීම ආදී ඵල ප්‍රයෝජනද අපේක්ෂා කොට ඇත. ඒ අනුව එය බෞද්ධ කෘෂිකාර්මික සමාජයට පූජනීයත්වය ඉක්මවා ගිය වස්තුවක් විය. තවද, රජුගේ රාජකීයත්වය තහවුරු කරන සාධකයක් බවටද දන්ත ධාතුන් වහන්සේ පත් වී තිබුණු බව අපේ රාජ්‍ය පරපුරේ වෘතාන්තය සනාථ කරයි.

ඒ අනුව ශ්‍රී ලංකාවට සැපත් වූ ෆාහියැං භික්ෂූන් වහන්සේ විසින් අනුරාධපුරයේ ශ්‍රී විහුතිය පිළිබඳව තබනු ලැබ ඇති වාර්තා අතර උන්වහන්සේ දුටු දන්ත ධාතු ප්‍රදර්ශනයක් මෙසේ විස්තර කොට ඇත.

"සාමාන්‍යයෙන් බුදුන් වහන්සේගේ දන්ත ධාතුව එළියට වඩම්මන්නේ තුන්වැනි හඳ නැගී එන මාසයේ මැද භාගයේදීය. ධාතු ප්‍රදර්ශනයට දින දහයකට පෙර රජු විසින් හස්ති රාජයෙකු ඉතා අලංකාර ලෙස සරසවා, රාජකීය වස්ත්‍රාභරණයෙන් සැරසී ගත් අණබෙරකරුවකු ඒ ඇතා මත නංවා, රට වටා පිටත් කරවා ගරිනු ලැබේ. එම අණබෙරකරු මහත් හඬින් මෙසේ නිවේදනය කරයි.

"බෝසත්තුමෝ කල්ප ගණනක් තිස්සේ බුද්ධත්වය පෙරුම් පිරූහ. එතුමෝ තම ජීවිතයද, තම ශිරීඳද, තම දරුවාද දන් දුන්හ. ඇස්, මස්, ලේ දන් දුන්හ. එතුමෝ තම සිරුර කුස ගින්නේ සිටි කොටි දෙනකට ආහාර පිණිස දුන් දුන්හ. ඇටද, ඇට මිදුළු ද, තම මොළයද දන් දුන්හ. මෙසේ ජීවත්ව සිටින සියළු සත්ත්වයා වෙනුවෙන් බොහෝ දුක් වේදනා වින්දහ. එසේ එතුමෝ බුදු බවට පත් වූහ. එතුමෝ හතළිස්පස් වසරක් තිස්සේ සකල ලෝ වැස්සාගේ සිත සුව පිණිස ධර්මය දේශනා කරමින්, පාප ක්‍රියාවන්හි යෙදෙන්නන් එයින් මුදවා ගනිමින්, වෙහෙසට පත්වී සිටින්නන්ට විවේකයත්, ගලවා නොගත් අයට විමුක්තියත් ලබා දෙමින් සංචාරය කළහ. ජීවත්ව සිටින ජනතාව සමග උන්වහන්සේගේ සබඳතාව නිමවූ පසු පිරිනිවන් පෑ සේක. උන්වහන්සේ පිරිනිවන් පෑ පසු ලෝකයට තිබූ ඇස නිවී ගියේය. සියලු සත්ත්වයෝ කම්පාවට, දුකට පත්වූහ.

''අද සිට දින දහයකින් බුදුරජාණන් වහන්සේගේ දන්ත ධාතුන් වහන්සේ පිටතට ගෙන, අභයගිරියේ ඇති විහාරස්ථානයට රැගෙන යනු ලැබේ. පිං කැමැති සියල්ලෝ ම, මාර්ගය සකස් කිරීමට උදව් කිරීමෙන්ද, වීථි සැරසීමෙන්ද, පූජා කිරීමට මල් පහන් රැස් කර ගැනීමෙන්ද පිං රැස්කර ගනිත්වා."

මෙම නිවේදනය ප්‍රකාශයට පත් කළ පසු, රජු බෝසතුන්ගේ පන්සියයක් උත්පත්තින් පිළිබිඹු කරමින් මග දෙපස රූප අමවයි. උදාහරණයක් හැටියට සුදන කුමාරයා විදුලි කෙටීමක් මෙන්, හස්තිරාජයා මෙන්, ගෝනෙකු මෙන්, නැතහොත් අශ්වයෙකු මෙන් වේ. මෙම රූප අලංකාර ලෙස සායම් කොට ජීවමාන රූපයට පත් කරයි. ඉන් පසු ධාතුන් වහන්සේ පිටතට වඩම්මවා, මධ්‍යම වීථිය දිගේ වඩම්මවාගෙන යනු ලැබේ. එවිට මග දෙපස රැස්වී සිටින ජනතාව එයට පූජා පවත්වති. මෙසේ මෙම දන්ත ධාතුව අභයගිරියේ විහාර ගෙට වඩම්මවනු ලැබේ. මෙවිට එක්රැස් වූ ජනී ජනතාව දන්ත ධාතුන් වහන්සේට මලින්, පහනින්, සුවඳ දුමින් පූජා පවත්වනු ලැබේ. මෙම පුද පූජා දිවා රාත්‍රී නොකඩවා පැවැත්වේ. දින අනූවක් ඇවැමෙන් දන්ත ධාතුන් වහන්සේ නැවත නගරයේ ධාතු මන්දිරයට වැඩම කරවනු ලැබේ."

මෙම ඓතිහාසික විස්තරයෙන්, ශ්‍රී දන්ත ධාතුන් වහන්සේට අද මෙන් එදද, ජීවමාන බුදුන් වහන්සේට මෙන් ගරු බුහුමන් කොට ඇති විලාශය දක ගත හැකිය.

ඒ. ආර්. ඇම්. ටී. බී. රත්නායක - මහලුවර

